# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2018** මැයි **22** වන අඟහරුවාදා
2018 வைகாசி 22 செவ்வாய்க் கிழமை
Tuesday 22nd May 2018

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.40 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.40 **க்கு சபை கூடியது**
*The Provincial Council met at 09.40 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම් දීම්
## AFFIRMATION OR OATHS OF NEW MEMBERS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"අශෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමාගේ අභාවය හේතුකොටගෙන ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා මෙම පළාත් සභාවේ ඇති වූ මන්ත්‍රී ධූර පුරප්පාඩුව පුරවනු පිණිස ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ගරු ජනක කුරුප්පු මැතිතුමා තේරී පත් වී ඇති බව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2018.05.15 දිනැති අංක 2071/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර තිබෙනවා.*

*ඒ අනුව ජනක කුරුප්පු ගරු මන්ත්‍රීතුමා 2018.05.18 වන දින මා ඉදිරිපිටදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව නිල ප්‍රතිඥාව දී ඇති බව කාරුණිකව දැනුම් දෙනවා.*

*ගරු ජනක කුරුප්පු මන්ත්‍රීතුමාට මෙම සභාවට පැමිණ අසුන් ගන්නා මෙන් කාරුණිකව ආරාධනා කරනවා."*

***අනතුරුව, අභිනව ගරු මන්ත්‍රීතුමා [ජනක කුරුප්පු මහතා] සභා ගර්භයේ අසුන් ගන්නා ලදී.***
*Subsequently, the newly appointed Member [Janaka Kuruppu]. took his seat in the Council Chamber.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී අභිනවයෙන් පත් වූ ගරු පළාත් සභා මන්ත්‍රී ජනක කුරුප්පු මැතිතුමාට සුභ ප්‍රාර්ථනා කරනවා.

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

***පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව :***

*"නව කාර්ය පටිපාටි රීති සංග්‍රහය අනුව ගිණුම් කාරක සභාවේ ඇති කර ඇති නව සාමාජික තනතුර සඳහා පළාත් සභා මන්ත්‍රී පංචරත්නම් රාම් ගරු මන්ත්‍රීතුමා පත් කරන ලෙසට ගරු විපක්ෂ නායකතුමා විසින් ඉල්ලීමක් කර ඇති බැවින් පංචරත්නම් රාම් ගරු මන්ත්‍රීතුමා පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සාමාජිකත්වයට පත් වන බව දැනුම් දෙනවා."*

*ii*

*"බස්නාහිර පළාත් සභා මන්ත්‍රී සිරිකමල් ෆිලිෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා පළාත් අධ්‍යාපන හා සංස්කෘතික, කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ උපදේශක කාරක සභා සාමාජිකත්වයෙන් ඉල්ලා අස් වන බවට 2018.05.13 වන දිනැතිව ලිපියක් ඉදිරිපත් කර ඇති බවත්, ඒ අනුව ගරු මන්ත්‍රීතුමා එම උපදේශක කාරක සභා සාමාජිකත්වයෙන් ඉවත් කර එදින සිට පළාත් ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම් සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශ උපදේශක කාරක සභා සාමාජිකයෙකු ලෙස පත් කරන බවත් දැනුම් දෙනවා."*

*iii*

*"මතු කියැවෙන විගණකාධිපති වාර්තා 13 සභාවට ඉදිරිපත් කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් එවා ඇති අතර එම වාර්තා පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරනු ලබන බව සභාවට දැනුම් දෙනවා.*

1. *බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශයක් යටතට නොවැටෙන, විසර්ජන ශීර්ෂ පිළිබඳව විස්තරාත්මක විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය.*

2. පළාත් සභාවේ විසර්ජන ශීර්ෂය 108 පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදාහැරීම්, සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ පළාත් දෙපාර්තමේන්තු පිළිබඳව විස්තරාත්මක විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය.

3. බස්නාහිර පළාත් සභාවේ විසර්ජන ශීර්ෂ 104 පළාත් ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, මිනිස් බල හා රැකී රක්ෂා, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ පළාත් දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන පිළිබඳ සහ ප්‍රඥප්ති යටතේ ස්ථාපනය කර ඇති ආයතන පිළිබඳ විස්තරාත්මක විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය.

4. බස්නාහිර පළාත් සභාවේ ශීර්ෂ 106 පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ වූ පළාත් දෙපාර්තමේන්තු සහ ප්‍රඥප්ති යටතේ ස්ථාපනය කර ඇති ආයතන පිළිබඳ විස්තරාත්මක විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය.

5. පළාත් සභාවේ විසර්ජන ශීර්ෂය 107 පළාත් විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය (බ.ප) හා එම අමාත්‍යාංශය යටතේ වූ පළාත් දෙපාර්තමේන්තු පිළිබඳව විස්තරාත්මක විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය.

6. පළාත් සභාවේ විසර්ජන ශීර්ෂය 105 පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ පළාත් දෙපාර්තමේන්තු පිළිබඳ විස්තරාත්මක විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය.

7. බස්නාහිර පළාත් සභාවේ ශීර්ෂ 104 පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ වූ පළාත් දෙපාර්තමේන්තු සහ ප්‍රඥප්ති යටතේ ස්ථාපනය කර ඇති ආයතන පිළිබඳ විස්තරාත්මක විගණකාධිපති වාර්තාව - 2015 වර්ෂය.

8. පළාත් සභාවේ විසර්ජන ශීර්ෂය 108 පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ පළාත් දෙපාර්තමේන්තු පිළිබඳ විස්තරාත්මක විගණකාධිපති වාර්තාව - 2015

9. පළාත් සභාවේ විසර්ජන ශීර්ෂය 105 පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ පළාත් දෙපාර්තමේන්තු පිළිබඳ විස්තරාත්මක විගණකාධිපති වාර්තාව - 2015

10. බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශයක් යටතට නොවැටෙන, විසර්ජන ශීර්ෂ පිළිබඳ විස්තරාත්මක විගණකාධිපති වාර්තාව - 2015 වර්ෂය.

11. බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශයක් යටතට නොගැනෙන, විසර්ජන ශීර්ෂ පිළිබඳ විස්තරාත්මක විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය.

12. බස්නාහිර පළාත් සභාවේ ශීර්ෂ 106 පළාත් කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය හා ඒ යටතේ වූ පළාත් දෙපාර්තමේන්තු සහ ප්‍රඥප්ති යටතේ ස්ථාපනය කර ඇති ආයතන පිළිබඳ විස්තරාත්මක විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය.

13. බස්නාහිර පළාත් සභාවේ ශීර්ෂ 105 පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ පළාත් දෙපාර්තමේන්තු පිළිබඳ විස්තරාත්මක විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය.

*මේ සම්බන්ධයෙන් 2018.02.21 හා 2018.04.18 යන දිනයන්හී සභා කටයුතු රැස්වීමේදී ඇති කර ගත් එකඟතාවය අනුව මෙම විගණකාධිපති වාර්තාවන්හි පිටපත් සියළුම ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත නොතබන බවත්, අවශ්‍ය ගරු මන්ත්‍රීතුමන්ලා ඒ පිළිබඳව සභා ලේකම් වෙත දැනුම් දී පිටපත් ලබා ගැනීමේ හැකියාව ඇති බවත් ගරු සභාවට දැනුම් දෙන අතර, ඒ සඳහා ඔබතුමන්ලා එකඟවනු ඇතැයි බලාපොරොත්තු වෙනවා."*

ඒකට හේතුව තමයි මන්ත්‍රීවරුන්ට බෙදන්න මේ වාර්තා සියල්ලම අපට මුද්‍රණය කරන්න ගියොත් එහෙම ඒක විශාල පොතක් බවට පත් වෙනවා. ඒක අපට අපහසුයි. නමුත් ඕනෑම කෙනෙකුට සභා ලේකම්තුමාගෙන් ඒ වාර්තාව ගන්න පුළුවන්. කිසිම ප්‍රශ්නයක් නැහැ.

*iv*

*"2018.05.08 දින සිට ක්‍රියාත්මක රීතීන්හි 36 රීතියට අනුව, කාලීන වැදගත්කමකින් යුත් පෞද්ගලික ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ගරු මන්ත්‍රීවරයෙකු එම ප්‍රකාශය තම ලිපි ශීර්ෂයක සවිස්තරාත්මකව ලියා සභා රැස්වීමට පෙර දින ප.ව. 4.15 ට පෙර මා වෙත හෝ සභා ලේකම්තුමා වෙත ලැබීමට සැලැස්විය යුතුය.*

*එම විධිවිධාන සඳහා 36 රීතිය කෙරෙහි ඔබතුමන්ලා සියළු දෙනාගේම අවධානය යොමු කරවන අතර, පෞද්ගලික ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී එම රීතියෙහි දැක්වෙන පරිදි සම්පූර්ණ ප්‍රකාශය ලිඛිතව ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දැනුම් දෙන ලදී. "*

36 රීතිය යටතේ මන්ත්‍රීවරයෙක් යම්කිසි ප්‍රකාශයක් කරන්න බලාපොරොත්තු වෙනවා නම් සභාවට පෙර දින ප.ව. 4.15 ට පෙර මා වෙත ලිඛිතව සවිස්තරාත්මක දුන්නොත් මට පුළුවන් -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, මුළු කථාවම ලියලා දෙන්න ඕනෑද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථාව සම්පූර්ණයෙන්ම ලියලා දෙන්න ඕනෑ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අපි කියන්න ගියාම ඔය විනාඩි දෙක තුන ඇතුළතදී ගොඩක් දේවල් කියැවෙනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පාර්ලිමේන්තුවේත් මේ සම්ප්‍රදාය තිබෙන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ලියාගෙන, කොළයේ තියෙන එක කියවන්න ඕනෑද? එහෙමද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොළය බලාගෙන කියවන්න. මෙතෙක් කල් අපි කළේ කෙටියෙන් කාරණාව ලියනවා. වෙන වෙනම කථා කරන්නේ. මේකේදී මම පැහැදිලිව දන්නවා මොකක්ද කථා කරන්නේ කියලා. එක පාරට කරන්න බැහැ. අපි ටික ටික හුරු වෙමු. හෙක්ටර් බෙත්මගේ ගරු සභානායකතුමා ඉතාම සවිස්තරාත්මක එතුමාගේ ප්‍රකාශය මට ඉදිරිපත් කරලා තිබෙනවා. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා පැහැදිලිව එතුමාගේ ප්‍රකාශය ඉදිරිපත් කරලා තිබෙනවා. අනෙක් අයත් පොඩ්ඩක් හුරු වෙන්න. මොකද, අපි මේ රීති පොත ජනවාරි 09 දුන්නේ. හැන්සාඩ් එකත් එක්ක. ඔබතුමන්ලා ඒවා කියවන්න. දැන් මාස 05 ක් ගිහිල්ලා. මේ මැයි 22. ජනවාරි මාසේ අපි අලුත් රීති පොත බෙදා දුන්නා. ඒ නිසා ඒවා පොඩ්ඩක් කියවලා ලැහැස්ති වෙන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, ඒ සම්බන්ධව මම අප්‍රසාදය පළ කරනවා. ඔය කියන විධියට සම්පූර්ණයෙන් ලියලා එවලා, ඔබතුමා කපන ඒවා කැපුවාට පස්සේ ඉතුරු ටික තමයි අපට කියන්න සිද්ධ වෙන්නේ. අපි හිතමු ගරු සභාපතිතුමා 10 දෙනෙක් දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති පොත සංශෝධනය කිරීමේදී අපි සාකච්ඡා කිහිපයක් තිබ්බා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

එදා ආවේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආවේ නැති වුණාට කරන්න දෙයක් නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, සභාවේ බහුතරය ඔය කතන්දරයට කැමැති නම් අපිත් කැමැතියි. නමුත් එළියේ කිව්වේ සභාවේ බහුරතයක් කැමැති නැහැයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව එකඟ නම් මාත් කැමැතියි. එච්චරයි. ඔබතුමා කිව්වා කියලා මට ඒවා එකපාරට වෙනස් කරන්න බැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

හැබැයි ගරු සභාපතිතුමනි, මේ රීතිය ප්‍රායෝගික නැහැ. බලන්න කෝ? ඔබතුමා පක්ෂයට ප්‍රකාශ 04 යි දෙන්නේ. 10 දෙනෙක් එවනවා. එතකොට කොහොමද කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි අවුරුදු ගාණක් මේ ගැන අපි සාකච්ඡා කළා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාව හදලා සාකච්ඡා කරලා 19 වතාවක් සංශෝධනය කරලා තිබෙනවා. එහෙම වෙන්න පුළුවන්. ඒක නිසා මම කියන්නේ ප්‍රායෝගික නැහැයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ඕනෑතරම් අවස්ථාව තිබුණා සභාවට ඇවිල්ලා ඒවාට සම්බන්ධ වෙලා අදහස් ප්‍රකාශ කරන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඔක්කෝම පාර්ලිමේන්තුවේ දේවල් අනුගමනය කරනවා නම්, පාර්ලිමේන්තු ගිය ගමන් පර්මිට් එක දෙනවා. අපට තවම නැහැ. ඒකත් අනුගමනය කරන්න කියන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

v

*"ගරු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩවීම් හා සම්බන්ධ ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී අදාළ වන්නා වූ රීති 37 කෙරෙහි ඔබතුමන්ලාගේ අවධානය යොමු කරනවා.*

*37(2) රීතියට අනුව, සභා පරිශ්‍රය තුළ ඇති වන ගරු මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩවීමක් සම්බන්ධයෙන් වන විටකදී හැරෙන්නට යම් ගරු මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩවීමක් පිළිබඳව එම ගරු මන්ත්‍රීතුමා විසින් ලිඛිතව මා වෙත අදාළ ආකෘතිය පුරවා පෙ.ව. 09.30 ට පෙර ලබා දිය යුතු වේ. මෙම ආකෘතිය, අද සභාගත කරන ලද පසුගිය සභා කටයුතු කාරක සභා රැස්වීම් වාර්තාව සමඟ ඔබතුමන්ලා වෙත ලැබීමට සලස්වා ඇති අතර, සභා පරිශ්‍රය තුළදී සිදු වන වරප්‍රසාද කඩවීමක්දී හැරෙන්නට, සෙසු වරප්‍රසාද කඩවීම් සම්බන්ධව එම ආකෘතිය සම්පූර්ණ කර සභා රැස්වීම් දින පෙ.ව. 09.30 ට පෙර ඉදිරිපත් කළ යුතු බව කාරුණිකව දැනුම් දෙනවා.*

*නව රීති සංග්‍රහය 2018.01.09 දින නිල වාර්තාව සමග ඔබතුමන්ලා වෙත ලබා දී ඇති අතර, එම රීති ඇතුළත් පුස්තකය ඉදිරියේදී යළිත් ලැබීමට සැලැස්වීමට පියවර ගන්නා බවත් දැනුම් දෙනවා. "*

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

සභාව යන අතරතුරේ මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩ වුණොත් මොකද කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එතකොට අවස්ථාව දෙනවා. සභාව තුළ හෝ පරිශ්‍රය තුළදී සිදුවීමක් වුණොත් අපි අවස්ථාව දෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් වුණොත් එහෙම ලියලා දෙන්න ඕනෑද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හදිසියක් වුණොත් එහෙම අපි අවස්ථාව දෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අලුත් රීති පොත නැවත මුද්‍රණය කරලා ලස්සනට දෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඕනෑවට වඩා මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද අහිමි කරන්න එපා. මේක එන්න එන්න මන්ත්‍රීවරු හිර කරලා ඕනෑවට වඩා වරප්‍රසාද අහිමි කරන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මාස 05 ක් සාකච්ඡා කරලා, අනුමත කරලා තිබෙන්නේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒක හරි අසාධාරණයි.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක මගේ තීරණයක් නොවෙයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදයක් ලියලා දෙන්න අවශ්‍යතාවයක් නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සභාවට එන්නේ නැතුව ප්‍රකාශ කරලා යනවා නේද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මේක අද ඊයේ එකක් නොවෙයි. අවුරුදු ගණනාවක්, මාස ගණනාවක් රැස්වීම් පවත්වලා, සාකච්ඡා කරලා, සංශෝධනය කරලා අවසාන වාර්තාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලා දන්නේ නැහැයි කියලා කියන්න එපා. කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න.

# නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා
MOTIONS FOR LEAVE OF ABSENCE

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි, *"සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමාට මාස 03 ක කාලයක් සඳහා නිවාඩු අනුමත කළ යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# කාරක සභා වාර්තා පිළිගැන්වීම
PRESENTATION OF COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2018.05.09 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
PETITIONS

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, පිළියන්දල, මාම්පේ, වවනවත්ත පාර, අංක 31 හි පදිංචි අරුණ රාජපක්ෂ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, වැල්ලම්පිටිය, කොටුවිල, කැලණිනදීගම, II අදියර, අංක 32 හි පදිංචි පී.ආර්. සුජාතා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petition Presented, ordered to refer to the Petitions committee.*

# ප්‍රශ්න, පෙර සභාවේ අතුරු ප්‍රශ්න හා පිළිතුරු සැපයීම

QUESTIONS, INTERIM QUESTIONS OF PREVIOUS MEETING AND ANSWERS TO SUCH

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාට අද දින සභාවට පැමිණිය නොහැකි බැවින් මා හට ප්‍රශ්නය යොමු කිරීමට එතුමා විසින් අවසර ලබා දුන්නා ඒ අනුව මම ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන ඇමැතිතුමා නැහැ. මම එම ප්‍රශ්නයට අදාළ පිළිතුරු සභාගත කරනවා.

***01.***

***මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/18/12)***

* ***[සභාගත කරන ලද පිළිතුර]***
*[Tabled Answer]*

***ප්‍රශ්නය :***

*අ. ගම්පහ අධ්‍යාපන කලාපයේ කීර්තිමත් පාසලක් ලෙස පැවැති බප/ගම්/යක්කල චන්ද්‍රජෝති විද්‍යාලයේ පරිපාලනය අවුල් සහගත වීම හේතුවෙන් ගැටළු රාශියක් පැන නැගී ඇති බව ඔබතුමා දන්නෙහිද?*

***පිළිතුර :***

*අ. මෙම විදුහලේ වර්තමාන විදුහල්පති මෙම පාසලට පැමිණ ඇත්තේ 2016.09.07 දිනය. ඔහු පැමිණෙන විට සේවය කළ නියෝජ්‍ය විදුහල්පති දෙදෙනාගෙන් විදුහල්පතිතුමාට සහයෝගයක් නොමැති බව වාර්තා වී ඇත.*

***ප්‍රශ්නය :***

*ආ. එකී විදුහලේ විදුහල්පතිවරයාට හිතවත් ගුරුවරුන් කිහිප දෙනෙකුගේ ක්‍රියා කලාපය දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට මෙන්ම බාහිර ක්‍රියාකාරකම් වලටද බලපා ඇති බව ඔබතුමා පිළිගන්නෙහිද?*

***පිළිතුර :***

*ආ. එවැනි තත්ත්වයක් දැනට වාර්තා වී නැත. මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කර අමාත්‍යාංශය වෙත වාර්තා කරන ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ දැනුවත් කර ඇත.*

***ප්‍රශ්නය :***

*ඇ. එකී විදුහලේ විදුහල්පතිවරයා ගුරුවරුන් නිසි ලෙස ඒ ඒ කාර්යයන්වල යෙදවීම වෙනුවට තම හිතවත් ගුරුවරුන් සමග නිකරුණේ කාලය ගත කරන බව ඔබතුමා දන්නෙහිද?*

***පිළිතුර :***

*ඇ. එවැනි තත්ත්වයක් වාර්තා වී නැත.*

***ප්‍රශ්නය :***

*ඈ. එකී පාසලේ පරිපාලන ගැටළුව විසඳීම සඳහා ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද යන්න සභාවට දන්වන්නෙහිද?*

***පිළිතුර :***

*ඈ. විධිමත් විමර්ශනයකින් පසු දෙනු ලබන නිර්දේශ අනුව ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වෙමි.*

***ප්‍රශ්නය :***

*ඉ. දරුවන්ගේ අධ්‍යාපන කටයුතු මෙන්ම බාහිර ක්‍රියාකාරකම් නිසි පරිදි සිදු කිරීම සඳහා ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද? යන්නත් අදාළ විදුහලේ විනය නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද? යන්නත්, සභාවට දන්වන්නෙහිද?*

***පිළිතුර :***

*ඉ. පරීක්ෂණයෙන් පසු දෙනු ලබන නිර්දේශය අනුව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි.*

***ප්‍රශ්නය :***

*ඊ. නොඑසේ නම් ඒ මන්ද?*

***පිළිතුර :***

*ඊ. අදාළ නැත.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා මේ ප්‍රශ්නය අපේ ගම්පහ කලාපයේ ප්‍රශ්නයක්. මම කනගාටු වෙනවා. මම ගම්පහ ඉන්න මන්ත්‍රීවරයෙක්. එතුමාත් ගම්පහ දිස්ත්‍රික්කයේ තමයි. මම දන්නේ නැහැ මේ කාරණාව, එක එක්කෙනාගේ ඉගැන්වීමක් නිසාද දන්නෙත් නැහැ. මේ වාගේ ප්‍රශ්න අහන්නේ. මට දැනගන්න තරමේ මෙවැනි ප්‍රශ්නයක් මේ ඉස්කෝලයේ නැහැ. විදුහල්පතිතුමා ආරක්ෂා කරනවා නොවෙයි. මම පෞද්ගලිකව දන්නවා. ඒ පාසලේ අධ්‍යාපන පරිපාලනයේ එහෙම ගැටළුවක් නැහැ. නමුත් ප්‍රශ්නය අහන්න මන්ත්‍රීවරුන්ට අයිතියක් තිබෙනවා. මම කියන්නේ කවුරු හරි කේලමක් කිව්වාට එක පාරටම මේවාට විරුද්ධව අහන්න එපා. ඒකයි වෙන්නේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් දෙවැනි ප්‍රශ්නයත් මම ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි, සභාගත කරනවා.

* *[සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

***02.***

***මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කාර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/18/14)***

***ප්‍රශ්නය :***

*අ. සී/සහිත කොච්චිකඩේ සමූපකාර ණය දෙන නගරබද බැංකුව විසින් 2008 වර්ෂයට ආසන්නයේ ප්‍රමිතියෙන් තොරව ගොඩනැගිල්ලක් ඉදි කර ඇති බව ඔබතුමා පිළිගන්නෙහිද?*

***පිළිතුර :***

*අ. පිළිගනිමි.*

***ප්‍රශ්නය :***

*ආ. ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ වාර්තාව මගින් එකී ගොඩනැගිල්ල ප්‍රමිතියෙන් තොරව ගොඩනැගිල්ලක් බව සඳහන් කර ඇති බව ඔබතුමා දන්නෙහිද?*

***පිළිතුර :***

*ආ. ඔව්.*

***ප්‍රශ්නය :***

*ඇ. සමූපකාර සමිති ප්‍රඥප්තියේ අංක 47/1 යටතේ 2008.07.02 දින එවකට කිරිදිවැල, හිස්වැල්ල, දංගහදෙණිය අංක 109 දරන ස්ථානයේ පදිංචි සමූපකාර සමිති පරීක්ෂක ආර්.කේ. සුමනරත්න මහතා විසින් අදාළ සමිතියේ ගොඩනැගිල්ල ඉදි කිරීමේ දී සිදු වී ඇති අක්‍රමිකතා හා මුදල් අවභාවිතාව පිළිබඳ පරීක්ෂණයක් සිදු කර ඇති බව ඔබතුමා දන්නෙහිද?*

***පිළිතුර :***

*ඈ. ඔව්.*

***ප්‍රශ්නය :***

*ඈ. ආර්.කේ. සුමනරත්න මහතාගේ පරීක්ෂණ වාර්තාව සභාගත කිරීමට කටයුතු කරන්නෙහිද?*

***පිළිතුර :***

*ඈ. නැත. මෙම වාර්තාවට අදාළ නීතිමය කටයුතු මෙතෙක් අවසන් වී නැත.*

***ප්‍රශ්නය :***

*ඉ. අදාළ ගොඩනැගිල්ල ඉදි කිරීමේදී අක්‍රමිකතා හා මුදල් අවභාවිතා කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් හට නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා කුමන ක්‍රියාමාර්ගයක් අනුගමනය කරන්නේද? යන්න ඔබතුමා සභාවට දන්වන්නෙහිද?*

***පිළිතුර :***

*ඉ. ඔව්. අනුගමනය කෙරෙන ක්‍රියාමාර්ගය මෙසේය.*

*බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමූපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියේ 48(1) (ඇ) වගන්තිය අනුව ලියාපදිංචි සමූපකාර සමිතියක කාරක සභාවක හිටපු සාමාජිකයෙකු හෝ සාමාජිකයන් සිය යුතුකම් හා වගකීම් ඉටුකර නොමැති බව රෙජිස්ට්‍රාර්වරයා නිගමනය කරන අවස්ථාවක දී ඔවුන් වෙත යවනු ලැබූ චෝදනා පත්‍ර හා ඊට චූදියන්ගෙන් ලද පිළිතුරු පත්‍ර එකී සමිතියේ නීත්‍යානුකූලව ස්ථාපිත වූ මහ සභාවකට ඉදිරිපත් කිරීම සහා එකී ප්‍රඥප්තියේ 48(5) වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ සමාලෝචනය මණ්ඩලයකට ඉදිරිපත් කළ යුතුය.*

*මේ අනුව එකී සමිතියේ හිටපු කාරක සභිකයින් 06 දෙනෙකුට චෝදනා පත්‍ර නිකුත් කළ අතර, ඉන් 05 දෙනෙකු පිළිතුරු එවා ඇත. එම චෝදනා පත්‍ර හා පිළිතුරු පත්‍ර සමාලෝචන මණ්ඩලයට දැනටමත් ඉදිරිපත් කර ඇත. මහ සභාවටද ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. සමාලෝචන මණ්ඩලයේ නිර්දේශ සැලකිල්ලට ගෙන ඉහත කී වගන්තියේ නියමයන් අනුව එකී හිටපු කාරක සභිකයින්ට නැවත එම සමිතියේ හෝ වෙනත් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිතියක ධූරයකට තේරී පත්වීම තහනම් කරමින් ලිඛිත නියෝගයක් නිකුත් කරනු ලැබේ. චෝදනා පත්‍රයට පිළිතුරුපත් ඉදිරිපත් නොකළ කාරක සභාවේ සාමාජිකයා එම චෝදනා පිළිගත්තා සේ සලකා නැවත වසර 07 ක් යනතුරු කිසිදු ලියාපදිංචි කළ සමූපකාර සමිතියක ධූරයකට තේරී පත් විය නොහැකි බවට ලිඛිත නියෝගයක් දැනටමත් නිකුත් කර ඇත.*

***ප්‍රශ්නය :***

*ඊ. නොඑසේ නම් ඒ මන්ද?*

***පිළිතුර :***

*ඊ. අදාළ නොවේ.*

**** [පසුබිම් වාර්තාව ]***
*[Background Report]*

***සී/ස කොච්චිකඩේ ස.ණ.ස. සමිතිය ගොඩනැගිල්ල ඉදි කිරීමේ අක්‍රමිකතාවය පිළිබඳ පසුබිම් වාර්තාව***

1. *ගම්පහ සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් විසින් 2008.05.28 දින සී/ස කොච්චිකඩේ ස.ණ.ස. සමිතියේ නව ගොඩනැගිල්ල ඉදි කිරීමේදී සිදුව ඇතැයි පැමිණිලි ලැබී ඇති අක්‍රමිකතා හා මුදල් අවභාවිතාව සම්බන්ධයෙන් 47(1) පරීක්ෂණයක් සිදු කිරීමට සමූපකාර සමිති පරීක්ෂක ආර්.කේ. සුමනරත්න මහතාට බලය පවරා පත් කර ඇත.*

2. *පරීක්ෂණ නිලධාරී විසින් සිද්ධිමය කරුණට අදාළව සිය නිරීක්ෂණ, නිගමන හා නිර්දේශ ඇතුළත් පරීක්ෂණ වාර්තාව 2010.04.19 දින ගම්පහ සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වෙත භාර දී ඇත. පරීක්ෂණ නිලධාරිගේ නිගමනයන්ට අනුව ගොඩනැගිල්ල කොමසාරිස් වෙත භාර දී ඇත. පරීක්ෂණ නිලධාරිගේ නිගමනයන් අනුව ගොඩනැගිල්ල ප්‍රමිතියකට අනුව ඉදිකර නොමැති වීම, එහි මූලික සැලැස්මට*

*පටහැනිව ඉදි කිරීම් සිදු කර තිබීම යන කරුණු සනාථ වී තිබේ. මෙම නිගමනයන්ට එළඹීමේදී ඉංජිනේරු තාක්ෂණ ආයතනයෙන් ලබාගත් ගොඩනැගිල්ලේ ප්‍රමිතිය පිළිබඳ 2009.10.14 දිනැති වාර්තාව උපයෝගී කරගෙන ඇත. එම ආයතනයේ වාර්තාවෙන් පහත සඳහන් නිගමනයන් ලබා දී ඇත.*

- *කොන්ත්‍රාත්කරු හා උපදේශකයන් වෘත්තිමය වගකීම් පැහැර හැර ඇත.*
- *ප්‍රමිතියට අනුව ඉදි කිරීම් කටයුතු පරීක්ෂා කර ඇත.*
- *ගොඩනැගිල්ල ඉදි කිරිමට මහ නගර සභාවෙන් අනුමැතිය ලබා ගෙන නැත.*
- *ගොඩනැගිලි රේඛා පරාසය තුළ අඩි 05 ක් පමණ නීත්‍යානුකූල නොවන ආකාරයට ඉදිකර තිබීම නිසා පාර පුළුල් කිරීමකදී වන්දි නොලැබීම.*
- *ගොඩනැගිලි රේඛා පරිසය තුළ අඩි 05 ක් පමණ නීත්‍යානුකූල නොවන ආකාරයට ඉදිකර ඇති කොටස කඩා ඉවත් කිරීමෙන් තවදුරටත් ගොඩනැගිල්ලේ ව්‍යුහය අස්ථාවර වීම.*
- *මෙවැනි තත්ත්වයන් යටතේ දෙවන මහලක් ඉදි කිරීම අවදානම් සහිත වීම.*

3. *පරීක්ෂණ නිලධාරී විසින් එවකට සිටි කාරක සභාව සිය යුතුකම් හා කටයුතු බුද්ධිමත්ව ඉටුකර නොමැති බැවින් චෝදනා කළ යුතු බවට නිර්දේශ කර ඇත. ඊට අතිරේකව රු. 727,320.00 ක (ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා වැය කළ මුළු මුදල) මුදල් සමිතියට මූල්‍යමය හානියක් බවත්, එහෙත් තාක්ෂණ නිලධාරිගේ වාර්තාවලින් නිශ්චිත අලාභයක් ගණනය කර නැති නිසා අලාභයක් ඇති වූ අවස්ථාවකදී එම අලාභය අය කර ගත යුතු බවද නිර්දේශ කර ඇත.*

4. *ගම්පහ සමූපකාර සංවර්ධන කොමසාරිස් විසින් ගම්/සමු/පොදු/ව්‍යා.පරීක්ෂණය සහ 2010.05.06 දිනැති ආවරණ ලිපිය සමග එකී පරීක්ෂණ වාර්තාව කොමසාරිවරයා වෙත ඉදිරිපත් කර ඇත. ප්‍රධාන කාර්යාලයට අදාළ වාර්තාව ලැබී ඇත්තේ 2010.05.11 දිනදීය.*

5. *කොමසාරිස්වරයා විසින් එම පරීක්ෂණ වාර්තාව විමර්ශන අංශයට ඉදිරි කටයුතු කිරීම පිණිස යොමු කර ඇත.*

6. *සමූපකාර සංවර්ධන නිලධාරී ටී. සුනිල් ප්‍රනාන්දු මහතා විසින් අදාළ වාර්තාව සමාලෝචනය කර 2012.08.15 දින සමාලෝචන වාර්තාව භාර දී ඇත.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට න්‍යාය පත්‍රයේ අංක 03 යටතේ නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියගේ නමින් ඇති ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**03.**

**නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/18/15)**

අ. ගම්පහ රජයේ රෝහලේ සුළු සේවක පුරප්පාඩු කොපමණ වේද?

ආ. එම පුරප්පාඩු හේතුවෙන් රෝහලේ කටයුතු නිසියාකාරව පැවැත්වීමට බාධා වී තිබේද?

ඇ. ඒ සඳහා ඔබතුමා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

ඈ. ගම්පහ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය රෝහල්වල මාතෘ සායන පැවැත්වීමට ඇති ස්ථාන නිසියාකාරව නඩත්තු නොකෙරන බව ඔබතුමා පිළිගන්නේද?

ඉ. ඒ සඳහා ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග කවරේද?

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

අ. සුළු සේවක පුරප්පාඩු නැත.

ආ. 2017 වර්ෂය වන විට රෝහල තුළ අලුතින් ස්ථාපිත කරන ලද නව ඒකක සංඛ්‍යාව වැඩිවීම නිසා සේවක සංඛ්‍යා ප්‍රමාණවත් නොවීම මත යම් යම් බාධා ඇති වූ අවස්ථා ඇත.

ඇ. ස්ථාපිත කරන ලද නව ඒකක සඳහා කාර්ය මණ්ඩල වැඩිකර ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත.

ඈ. නැත.

ඉ. ගම්පහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාශයට අනුබද්ධිතව මාතෘ හා ළමා සායන 185 ක් ඇත. ඉන් සායන 110 පමණ භූමියේ අයිතිය ප්‍රාදේශීය සභා, නගර සභා, නාගරික සංවර්ධන අධිකාරිය, නිවාස සංවර්ධන අධිකාරිය සහ පෞද්ගලික හිමිකරුවන් සතුව පවතී. බාහිර ආයතන හා පුද්ගලයන් සතු දේපලවල නඩත්තු කටයුතු සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිපාදන වෙන් කළ නොහැකි අතර එම සායනවල නඩත්තු කටයුතු අදාළ ආයතන මගින් සිදුකර දෙන ලෙස ඉල්ලීම් කර ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අංක 04 යටතේ ඇති ප්‍රශ්නයත් එතුමියගේමයි.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**04.**

**නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/18/16)**

අ. බස්නාහිර පළාත තුළ පාසල් දරුවන් හා තරුණයන් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවීම මැඩලීමට ඔබ අමාත්‍යාංශය මගින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

ආ. බෝ නොවන රෝග පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටන් පැවැත්වීමට ඔබ අමාත්‍යාංශය මගින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

අ.

- පාසල් සෞඛ්‍ය වැඩ සටහන් යටතේ පළාතේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හරහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් මගින් පාසල් දරුවන් දැනුවත් කිරීම.
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හරහා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පළාත තුළ ස්ථාපනය කර ඇති සුව දිවි මධ්‍යස්ථාන හරහා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම හා රෝග නිර්ණය සායන පැවැත්වීම.
- ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ සිටින ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් විසින් පළාත තුළ දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- පරිවාස දෙපාර්තමේන්තුව මගින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

ආ.

- බෝ නොවන රෝග අවම කිරීමේ මූලික කරුණු අරමුණු කරගෙන පළාත තුළ සුව දිවි මධ්‍යස්ථාන පිහිටුවා ඇත.
- එක් එක් දිස්ත්‍රික්කයන් වෙත අනුයුක්ත කර ඇති වෛද්‍ය නිලධාරී (බෝ නොවන රෝග) ගේ සම්බන්ධීකරණය යටතේ සුව දිවි මධ්‍යස්ථාන ක්‍රියාත්මක වේ.
- සුව දිවි මධ්‍යස්ථාන හරහා රෝග නිර්ණය සායනයන් හා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- දිස්ත්‍රික් රෝහල්, ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හරහා වෛද්‍ය සායනයන් පැවැත්වීම හා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

- ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ සිටින ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් මගින් ප්‍රාදේශීය වශයෙන් විවිධ පාර්ශව ඉලක්ක කර ක්‍රියාත්මක කරන වැඩ සටහන් මගින් මහජනතාව දැනුවත් කිරීම.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු සභාපතිතුමනි, නඩත්තුවක් නැතිව කඩාගෙන වැටුණු මාතෘ සායන තිබෙනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මොකක්ද?

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු ඇමැතිතුමා මහර මාතෘ සායනයේ වහලය කඩා වැටිලා තිබෙනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඒ පිළිබඳව තමයි දැනුවත් කළේ. අපේ එකක් නම් අපට හදන්න පුළුවන්. සමහර ඒවා නගර සභාවේ, ප්‍රාදේශීය සභාවේ -

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

පළාත් සභාවට අයිති එකක්.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

පළාත් සභාවට අයිති නම් හදන්න පුළුවන්. ඒ ගැන දැනුවත් කරන්න.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

මම ඒ පිළිබඳව දැනුවත් කරන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු අධ්‍යාපන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව. ඇමැතිතුමා නම් නැහැ.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි -** අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

**05.**

**නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/18/17)**

***ප්‍රශ්නය :***

*අ. i. කළුතර අධ්‍යාපන කලාපයේ වර්ෂ 2017 අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි මුළු දරුවන් සංඛ්‍යාව කොපමණද?*

*ii. එයින් ජාතික පාසල්වල දරුවන් සංඛ්‍යාව හා පළාත් පාසල්වල දරුවන් සංඛ්‍යාව කොපමණද?*

***පිළිතුර :***

*අ. i.* 8397

*ii. ජාතික පාසල්වල දරුවන් - 2049*
*පළාත් පාසල්වල දරුවන් - 6348*

***ප්‍රශ්නය :***

*ආ. i. මෙම විභාගයට පෙනී සිටි දරුවන්ගෙන් සමත් හා අසමත් සංඛ්‍යාව කොපමණද?*

*ii. එයින් ජාතික පාසල් මට්ටමින් සමත් හා අසමත් සංඛ්‍යාව කොපමණද?*

*iii. සමත් හා අසමත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව කොපමණද?*

*iv. මෙය පළාත් පාසල් මට්ටමින් සමත් හා අසමත් සංඛ්‍යාව කොපමණද?*

*v. සමත් හා අසමත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව කොපමණද?*

*පිළිතුර :*

අා. *i. සමත් සංඛ්‍යාව - 6017*
*අසමත් සංඛ්‍යාව - 2380*

*ii. සමත් සංඛ්‍යාව - 1547*
*අසමත් සංඛ්‍යාව - 502*

*iii. සමත් ප්‍රතිශතය - 75.50%*
*අසමත් ප්‍රතිශතය - 24.50% (ජාතික පාසල් මට්ටමින්)*

*iv. සමත් සංඛ්‍යාව - 4470*
*අසමත් සංඛ්‍යාව - 1878*

*v. සමත් ප්‍රතිශතය - 70.42%*
*අසමත් ප්‍රතිශතය - 29.58% (පළාත් පාසල් මට්ටමින්)*

*ප්‍රශ්නය :*

ඇ. *i. මෙම විභාගයේදී ගණිත විෂය පමණක් අසමත් මුළු දරුවන් සංඛ්‍යාව කොපමණද?*

*ii. එය ජාතික පාසල් මට්ටමින් කොපමණද?*

*iii. එය පළාත් පාසල් මට්ටමින් කොපමණද?*

*iv. ජාතික පාසල් හා පළාත් පාසල් මට්ටමින් ප්‍රතිශතාත්මකව කොපමණද?*

ඇ. *i. අසමත් සංඛ්‍යාව - 2657*

*ii. 462*

*iii. 2195*

*iv. ජාතික පාසල් - 22.5%*
*පළත් පාසල් - 34.5%*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අංක 06 යටතේ ඇති ප්‍රශ්නයත් නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමාගේමයි.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**06.**

**නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/18/17)**

අ. i. ඔබ අමාත්‍යාංශය මගින් කෘෂිකාර්මික තොරතුරු පද්ධතියක් සඳහා දත්ත රැස් කිරීමේ පත්‍රිකාව මුද්‍රණය කළේද?

ii. මුද්‍රණය කළ පත්‍රිකා සංඛ්‍යාව කොපමණද?

iii. මුද්‍රණය කළ ආයතනය කුමක්ද?

iv. ඒ සඳහා වැය කළ මුදල කොපමණද?

ආ. i. මෙම පත්‍රිකාව දිස්ත්‍රික් අනුව බෙදා දුන් ආකාරය සංඛ්‍යාත්මකව කොපමණද?

ii. බෙදා දුන් පත්‍රිකා තොරතුරු සම්පූර්ණ කිරීමෙන් පසු නැවත කොපමණ සංඛ්‍යාවක් ලැබී තිබේද?

iii. එය දිස්ත්‍රික් මට්ටමින් කොපමණද?

iv. නොලැබී ඇති පත්‍රිකා සංඛ්‍යාව කොපමණද?

v. එය දිස්ත්‍රික්ක මට්ටමින් කොපමණද?

ආ. i. මෙම පත්‍රිකා තොරතුරු ලබා ගැනීමේදී යම් ආයතනයක් සම්බන්ධ කර ගන්නේද?

ii. එම ආයතනයේ නම කුමක්ද?

iii. එම ආයතනය සම්බන්ධ කර ගන්නේ කුමන පදනම මතද?

iv. එම ආයතනයට මුදල් ගෙවා තිබේද?

v. එම මුදල් ප්‍රමාණය කොපමණද?

vi. මුදල් ගෙවූ පදනම කවරේද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

අ. i. ඔව්.

ii. මුද්‍රණය කළ මුළු පත්‍රිකා සංඛ්‍යාව - 352,000

iii. ඉමාෂි ප්‍රකාශන ආයතනය, ගංගොඩවිල, නුගේගොඩ.

iv. වැය වූ මුළු මුදල - 644,077.50

ආ. i. කොළඹ දිස්ත්‍රික්කය -34,176
කළුතර දිස්ත්‍රික්කය -130,000
ගම්පහ දිස්ත්‍රික්කය -121,352

**මුළු පත්‍රිකා ප්‍රමාණය -285,528**

ii. පත්‍රිකා - 6,469

iii. කොළඹ දිස්ත්‍රික්කය - 1,095
කළුතර දිස්ත්‍රික්කය - 2,885
ගම්පහ දිස්ත්‍රික්කය - 2,489

iv. පත්‍රිකා - 73,698

v. කොළඹ දිස්ත්‍රික්කය - 9,476
කළුතර දිස්ත්‍රික්කය - 35,927
ගම්පහ දිස්ත්‍රික්කය - 28,295

ආ. i. ඔව්.

ii. ස්වෙච්ඡා සංවිධාන කළමනාකරණ සංවර්ධන මධ්‍යස්ථානය, කළුබෝවිල.

iii. විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කරමින් හා කාර්යය කිරීමේ හැකියාව මත එම ආයතනය තෝරා ගන්නා ලදී.

iv. ඔව්.

v. රු. 250,000.00

vi. ගිවිසුම් ගත වී ඇති ආකාරය සහ ඉටු කළ කාර්යය පදනම් කර ගනිමින්.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු ඇමැතිතුමා, ඔබතුමාගේ උත්තරය අනුව පත්‍රිකා විශාල ප්‍රමාණයක් මුද්‍රණය කරලා තිබෙනවා. දිස්ත්‍රික් මට්ටමෙනුත් බෙදලා තිබෙනවා. නමුත් ලැබුණු ප්‍රමාණය ගත්තොත් ඉතාම සුළු ප්‍රමාණයක්. ඒ සඳහා ඔබතුමා අරගෙන තිබෙන ක්‍රියා මාර්ග කවරේද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මේ සඳහා අද රටේ ඉතාමත්ම අත්‍යවශ්‍ය සේවයක් බවට මේ වැඩ සටහන පත් වෙලා තිබෙනවා. පෙරේදා කෘෂිකර්ම අමාත්‍යවරුන්ගේ සමුළුවේදීත් මේ ගොවීන් පිළිබඳව දත්ත - මේ තරම් කාලයක් මේ රටේ තිබෙන්නේ සත්‍ය නොවෙයි. අපෙන් අහනවා පුරන් කුඹුරු කොපමණද? ප්‍රමාණය කොපමණද? මොන විස්තරයක් ඇහුවත් හරියට දෙන්න බැහැ. ඒ නිසා තමයි අපි මේ වැඩ සටහන ක්‍රියාත්මක කරලා, ක්‍රමවත් වැඩ පිළිවෙළක් අනුව කටයුතු කරන්නේ. මේක පහු වෙන්න පුළුවන්. දීර්ඝ කාලයක් යන්න පුළුවන්. නමුත් ක්‍රමවත්ව බස්නාහිර පළාතේ ගොවීන් පිළිබඳව සියලුම දත්ත ලබා ගැනීමේ අරමුණින් තමයි මේ ක්‍රමය අපි ආරම්භ කළේ.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මෙහෙමයි තිබෙන්නේ ඇමැතිතුමා. මේ පත්‍රිකා ලබා දීලා සැලකිය යුතු කාලයක් වෙනවා නේ? දැන් මේක පුරවන්න මැදිහත් වෙන්නේ කවුද? දැන් ගත්තොත් එහෙම අපි දන්නවා, සමහර ගොවිජන මධ්‍යස්ථානවල ග්‍රාමසේවා වසම් 76 ක් තිබෙනවා. කෘෂිකර්ම උපදේශකතුමාට මේ කාර්ය භාරය කරන්න බැහැ. ගොවීන් ළඟට ගිහිල්ලා මේ පත්‍රිකාව පුරවන්න මැදිහත් වෙන්නේ කවුද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

දැන් ග්‍රාම සේවකත්, AI මහත්මයා ඉතාම පස්ස ගහන වැඩක් මේක. ඒගොල්ලන්ගේ තිබෙන රාජකාරීත් එක්ක මේක කරන්න බැහැයි කියන තත්ත්වයකුත් තිබෙනවා. නමුත් අපට මේ වැඩේ කොහොම හරි කරගන්න ඕනෑ ගරු මන්ත්‍රීතුමා. මොන ක්‍රමයකින් හරි සංවිධානයක් හරි යොදවලා, ඒ සඳහා මුදලක් වියදම් කරලා, කැප කරලා මේ වැඩේ කර ගන්න ඕනෑ. නොකර ගත්තොත් ජීවිතේටවත් මේ වැඩේ කෙරෙන්නේ නැහැ. කෘෂි කර්මාන්තය ගැන බොරු දත්ත තමයි මුළු රටේම දෙන්නේ. එකක්වත් හරි එකක් දෙන්නේ නැහැ. ඉතින් අපි මෙහෙම එකක් හරි කර ගත්තොත් කාලයක් ගිහිල්ලා හරි, මාස 04 ක්, 05 ක්, 06 ක් ගිහිල්ලා හරි මේක කර ගත්තොත් අහවල් ගමේ ඉන්න ගොවියා මොනවාද කරලා තිබෙන්නේ? කියලා. වපුරලා තිබෙන ඒවායේ විස්තර අපට මෙහේ ඉඳලා බලාගන්න පුළුවන්. ඒ ක්‍රමයක් ඇති කරන්න තමයි ලේකම්තුමාත්, අපිත් සාකච්ඡා කරලා මේ වැඩේ ආරම්භ කළේ.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු ඇමැතිතුමා දත්තයන් ඕනෑ තමයි. දැන් මේකට සැලකිය යුතු කාලයක් ගිහිල්ලා. ඒ වාගේම මේ දත්ත එක්රැස් කරන්න පිරිසක් බඳවා ගැනීමක් කරගෙන, යම් පුහුණුවක් දීලා මේක ක්‍රියාත්මක කළා. නමුත් මට දැන් ලැබිලා තිබෙන තොරතුරු අනුව ඒකවත් ක්‍රියාත්මක නැහැ. පුහුණුව ලබා දුන් කිසි කෙනෙක් සම්බන්ධත් නැහැ. ඒ නිසා මේකේ යම් කඩා වැටීමක් තමයි තිබෙන්නේ. දත්ත එක්රැස් කරන්න ඕනෑ තමයි.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඔබතුමා දන්නවා නේ මේ කෘෂි කර්මාන්තයට කවුද කැමැති වෙන්නේ කියලා. දෙමව්පියෙක් ඉන්නවා නම් දරුවෙක් කෘෂි කර්මාන්තයට දානවාද? අපි හැමදාම ඔය කථාව කියනවා නේ? ඒ දෙමව්පියන්ගේ දරුවෝ ඉංජිනේරුවරු, වෛද්‍යවරු වෙන්නේ නැද්ද? නමුත් හැමදාම දේශපාලඥයෝ කියනවා, කෘෂි කර්මාන්තයට දරුවෝ යන්නේ නැහැයි කියලා. යන්නේ නැහැ. දරුවාට උගන්වලා ඒ ඒ තැන්වලට යවනවා. හැමදාම කෘෂි කර්මාන්තයේ තිබෙන ප්‍රශ්නයක් තමයි ඒක ජනාධිපතිතුමාගේ ඉඳලා පොඩි එකා දක්වා තිබෙන -ප්‍රාදේශීය සභාවත් තිබෙනවා. මේ සත්තු නිසා 30% ක් විනාශ වෙනවා. සත්තුන්ගේ නම් ටිකත් කියනවා. කැබිනට් එකටත් ගිහිල්ලා තිබෙනවා, සත්තුන්ගේ නම් අටක්. ඕක හැමදාම කියනවා. මොකක්ද මේ සත්තු අට දෙනා වෙනුවෙන් ගන්න තීන්දුව? විකල්පය කවුද කියන්නේ? එහෙම නම් මුන් ඔක්කෝම මරලා දාන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මුන්, මුන් කියන්න එපා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

සත්තු, සත්තු. ගරු සභාපතිතුමනි, මේක හැමදාම තිබෙනවා. අඩුපාඩු තිබෙන්න පුළුවන්. මේවා අපි කවදා හරි සකස් කර ගන්න ඕනෑ.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු ඇමැතිතුමා මේ අඩුපාඩු සකස් කර ගන්න -

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මම උත්සාහ කරනවා. ඔබතුමා ප්‍රශ්නය ඉදිරිපත් කිරීම ගැන ඇත්තෙන්ම මම සතුටු වෙනවා. ඔබතුමාගේ ප්‍රශ්නයත් එක්ක අපි තවත් ඉක්මන් කරන්න වැඩ කටයුතු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික ප්‍රකාශ ඉදිරිපත් කිරීමට පෙර අභිනවයෙන් පත් වූ ජනක කුරුප්පු ගරු මන්ත්‍රීතුමාට සභාව ඇමතීමට පොඩි කාලයක් ලබා දෙනවා. ඔබතුමාගේ කථාව විනාඩි 05 කට සීමා කරන්න.

**ගරු ජනක කුරුප්පු**
Hon. Janaka Kuruppu

ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් අවසරයි. ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු ඇමැතිවරුනි -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා. එතුමා නවක මන්ත්‍රීවරයෙක්. එතුමාට විපක්ෂයේ සංවිධායකතුමා උදව් කරනවා.

**ගරු ජනක කුරුප්පු**
Hon. Janaka Kuruppu

ගරු විපක්ෂ නායකතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. ඕක ලොකු කාරණාවක් නොවෙයි. ලොකුවට හිතන්න එපා. එතුමා අලුත් මන්ත්‍රීවරයෙක්.

**ගරු ජනක කුරුප්පු**
Hon. Janaka Kuruppu

විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. ඒක වැරැදියි. ඔබතුමන්ලා හැම දේටම කැගහනවා.

**ගරු ජනක කුරුප්පු**
Hon. Janaka Kuruppu

සියලුම ගරු මන්ත්‍රීවරුනි.

[සභාවේ සෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

විපක්ෂයේ සංවිධායකතුමාගේ ආසනයට එන්න කියන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා විපක්ෂයේ සංවිධායකතුමා. එතුමා උදව් කරනවා.

**ගරු ජනක කුරුප්පු**
Hon. Janaka Kuruppu

පළමුව පසුගිය දින දෙක තුන තුළ අයහපත් කාලගුණයෙන් ජීවිතක්ෂයට පත් වුණු සියලුම ජනතාව වෙනුවෙන් මම ශෝකය ප්‍රකාශ කරනවා. ඒ වාගේම මට මේ තත්ත්වයට එන්න උදව් කළ තිරසර සංවර්ධන, වනජීවී ගරු අමාත්‍ය ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මැතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා.

[සභාවේ සෝෂා]

මාව මේ තැනට ගෙන ඒමට වැඩ කටයුතු කිරීම සම්බන්ධව මම අත්තනගල්ල සහ ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවටත් පළමුව මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මගේ දෙමව්පියන්ටත් මම ස්තුතිවන්ත වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජෝර්ජ් ගැනත් මොනවා හරි කියන්න.

**ගරු ජනක කුරුප්පු**
Hon. Janaka Kuruppu

ගරු සභාපතිතුමනි, එදා මට මැතිවරණයේදී ඡන්දය දුන් සැමටත් මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ගරු මන්ත්‍රීතුමන්ලාට මම මේ ගමන්ම අවශ්‍ය නම් විශේෂ යෝජනාවකුත් දෙන්නම්. මොකද, ඔබතුමන්ලාගේ පර්මිට් එක සම්බන්ධ විශාල ප්‍රශ්නයක් තිබෙන බව මම දැක්කා. ඒකට ගරු සභාපතිතුමනි, ඕනෑ නම් විකල්පයක් විධියට අපේ අමාත්‍යාංශවල කැබ් සහ ජීප් රථ විශාල ප්‍රමාණයක් තිබෙනවා, ටෙන්ඩර් දාලා විකුණන්න. අපේ වාහනයක් නැති සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට පර්මිට් එක ලැබෙන කල් රජයේ තක්සේරු මිලකට එම කැබ් එකක් හෝ ජීප් රථයක් විකුණුවොත්, ජපානයෙන් ආනයනය කරලා ඒකට බොඩියක් තියලා අපේ මන්ත්‍රීතුමන්ලාට පාවිච්චිය සඳහා ගන්න පුළුවන්. මම පසුගිය සිකුරාදා බලන කොට කිව්වා - බස් එකෙන්, ත්‍රීවීල් එකෙන් එන මන්ත්‍රීතුමන්ලාට මම මේක යෝජනාවක් විධියටත් සභාවට ඉදිරිපත් කරනවා. ඔබතුමන්ලාට පුළුවන් නම් ඒ සඳහාත් අදහසක් යොමු කරන්න කියලා යෝජනා කරමින්, ගරු සභාපතිතුමා මේ ගැන සොයා බලා අපේ සියලුම මන්ත්‍රීවරුන්ට පුළුවන් නම් ඒ වරප්‍රසාදය ලබා දෙන්න කියලා ප්‍රකාශ කරනවා.

ඒ වාගේම මම දිවුරුම් දීමේදී ඔබතුමා මට දැක් වූ සහයෝගයට මම නැවතත් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම සභා ලේකම්තුමා ඇතුළු සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. ඉදිරියේදී මම මහජනතාව වෙනුවෙන් කරන කැපවීම උපරිමයෙන් කිරීමට මා බලාපොරොත්තු වෙමින්, ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ටත් නැවතත් මම ස්තුතිවන්ත වෙමින්, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, සමාවෙන්න. මම 11.00 ට මෙතැන අලුත් ගොඩනැගිල්ලේ ඉන්න ඕනෑ නිසා පොඩි පණිවුඩයක් සභාවට ප්‍රකාශය කරන්න තිබෙනවා. ජූලි මාසේ 12 වැනිදා උදේ 9.00 ට අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගොඩනැගිල්ල විවෘත කිරීමේ කටයුතු සූදානම් කරලා තිබෙනවා. ඒ පිළිබඳව අපේ සියලුම ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරනවා. ආරාධනාව විධිමත් පරිදි එවනවා. දැනට මේක සටහන් කරලා තබන්න කියලා ඔබතුමා මගින් සියලුම ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරනවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, අද මන්ත්‍රීවරුන් කථා කරන ඒවා ඇහෙන්නේ නැහැ. මයික්‍රෆෝන්වල මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවා. පොඩ්ඩක් බලලා ඒක නිවැරැදි කරන්න කියන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ වාගේම පවතින ගංවතුර තත්ත්වය වෙනුවෙන් අපි බෝට්ටු අඟුල් දීලා තියෙනවා. අපි තවත් අඟුල් 25 ක් ඉල්ලලා තිබෙනවා. අපි ඒකත් දැන් දෙන්න ලැහැස්ති කරලා තිබෙනවා. අවශ්‍ය දෙයක් තිබුණොත් ඒක අපට අපේ මට්ටමෙන් කරලා දෙන්න පුළුවන්. මොකද, දැන් ඉංජිනේරුවරු එනවා. මම පොඩ්ඩක් එතැනට යන්න ඕනෑ. පහත්බිම් ටික, ඇළවේලි ටික සංවර්ධනය කරගන්න.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු ප්‍රධාන ඇමැතිතුමනි, ඒවා දෙනකොට පොදු තැන්වලට දෙන්න. පුද්ගලිකව දුන්නාම හරියට පරිහරණය වෙන්නේ නැහැ. ඒ තත්ත්වය අපි ඊයේ පෙරේදා දැක්කා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මොකක්ද?

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ඒ ඔරු, අඟුල් දෙනකොට පොදු ස්ථානවලට දෙන්න. ප්‍රජා ශාලාවලට. පන්සල්වලට. ඒ වාගේ තැන්වලට. පුද්ගලිකව දුන්නාම අපි ඊයේ පෙරේදා දැකපු දෙයක් තමයි මිනිස්සු විනෝද චාරිකා යනවා. මෙපමණ ප්‍රශ්න තියෙද්දී.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, ඒ සම්බන්ධයෙන් ඒ පළාත්වල ඉන්න මන්ත්‍රීවරු මැදිහත් වෙලා ඒක කරන්න ඕනෑ. අපි දීලා තිබෙන අඟුලක් හරි, ඔරුවක් හරි දෙන්න ඕනෑ කාටද කියලා. අපි දන්නේ නැහැ නේ?

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, අපට ඇඟිලි ගහන්න අවස්ථාවක් -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔබතුමන්ලා අපට කියන්න. එතකොට අපි ඒක නිසි විධියට පිළියෙල කරන්නම්.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු මහ ඇමැතිතුමා ඒක දිසාපතිතුමාට භාර දුන්නා නම් හරි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ, නැහැ. මන්ත්‍රීතුමා දිසාපතිට දීලා බැහැ. කැස්බෑවේ වැව ළඟ ඉන්නවා නම් එතැන තමයි දෙන්න වෙන්නේ. දිසාපතිට දීලා කරන්න බැහැ. කැස්බෑවේ වැව ළඟ පොදු තැනකට තමයි දෙන්න වෙන්නේ.

# පෞද්ගලික ප්‍රකාශ කිරීම්
PERSONAL EXPLANATIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික ප්‍රකාශ ඉදිරිපත් කිරීම යටතේ මා වෙත ලිපි හතරක් ලැබිලා තිබෙනවා. එයින් ලිපි දෙකක් විතරයි මා වෙත නීත්‍යානුකූලව ලැබිලා තිබෙන්නේ. ඒ නිසා අනෙක් දෙක මම අයින් කරනවා. මොකද, මට ඒක සභාවට දාන්න බැහැ. ඒ දෙක කිසිම - ඇහෙන්නේ නැද්ද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පැහැදිලි නැහැ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

අද මයික්‍රොෆෝන් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. මේ කථා කරන දේවල් ස්පීකර්වලින් ඇහෙන්නේ නැති ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අපේ වරප්‍රසාද පොඩ්ඩ, පොඩ්ඩ කප්පාදු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩි කාර්මික දෝෂයක් තිබෙනවා. ඒකට මොකද අපි කරන්නේ? අපි කරගෙන යමු. ඇහෙනවා. සභානායකතුමා කියන විධියට සභාවේ සෝෂාව වැඩියි. මන්ත්‍රීවරු කැගහන නිසා තමයි ඇහෙන්නේ නැත්තේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වෙනදාටත් මෙවැනි තත්ත්වයක් තිබ්බා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව පළමු පෞද්ගලික පැහැදිලි කිරීම ඉදිරිපත් කිරීමට ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, පළමුව මම මේ ප්‍රකාශයට පෙර මේ වනකොට රට තුළ මතු වෙලා තිබෙන හදිසි ව්‍යසනකාරී තත්ත්වයෙන් පීඩාවට පත් වුණු - විශේෂයෙන්ම කඩුවෙල ආසනයේත් සෑහෙන පිරිසක් මේ වනකොට ගංවතුරට යට වෙලා. වැසි වතුරට යට වෙලා ඉන්නවා. ඒ අයට සහ පොදුවේ ජාතික වශයෙන් මරණයට පත් වුණු සහ අනෙකුත් අය සම්බන්ධයෙන් අපේ කනගාටුව ප්‍රකාශ කරමින් ඒ පිළිබඳවත් අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ, බස්නාහිර පළාතේ අපේ අයගේ ඒ හානි තත්ත්වයන් පිළිබඳව අවධානය යොමු කරලා සහන සලසන්න කියලා පළමුව ඉල්ලා සිටිනවා.

ඒ වාගේම විශේෂයෙන්ම මම මේ විශේෂ ප්‍රකාශය ලබා ගත්තේ, කඩුවෙල විවිධ සේවා සමුපකාර සමිතිය මේ වනකොට ඉතාමත් ගැටළුකාරී අවාසනාවන්ත තත්ත්වයකට පත් වෙලා තිබෙන බව ප්‍රකාශ කරන්න. මීට වසර කිහිපයකට පෙර බස්නාහිර පළාත් සභාවේ හොඳම සමූපකාර සමිතියක් ලෙස සම්මාන ලැබූ මේ සමිතිය අද වනවිට ව්‍යාපාර මට්ටමින් හා පාරිභෝගික සේවා සැපයීම අතින් පහත් අදියරකට පත් වී තිබෙනවා. මම හිතන්නේ ඒක අද මුළු රටම දන්නවා. විශේෂයෙන්ම පොළොන්නරුව ප්‍රදේශයේ පවත්වාගෙන ගිය විශාල වී මෝලක් සහ කඩුවෙල ප්‍රදේශයේ කිරි සහ යෝගට් කර්මාන්ත ශාලාවක් ඇතුළු ව්‍යාපාරික ස්ථාන රාශියක් ලාභදායිකව පවත්වාගෙන යමින් මේ සමූපකාර සමිතිය ශක්තිමත්ව මුළු රටට ආදර්ශයක් සපයමින් කටයුතු කළා. මේ සමිතිය මේ වනවිට විශාල බිඳ වැටීමකට සහ අලාභ ලබන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා ගරු සභාපතිතුමනි. එසේම මම මේ ප්‍රකාශය ලබා දුන් ඊයේ දිනය වනකොට මට දැනගන්න

[ගරු ජගත් කුමාර ]

ලැබුණා, මේ සමුපකාර සමිතියේ තිබෙන කිරි සහ යෝගට් අලෙවි සල වසා දමන තැනට, අධිකරණ නියෝගයක් ලැබී තිබෙනවා. මේ බිම සම්බන්ධව ඇති වුණු ගැටළුවක් නිසා. යම් කාල පරිච්ඡේදයකට ඒ ඉඩමේ ගිවිසුම් ගහලා තිබෙනවා,. නමුත් ගිවිසුම් කාලය දික් කරගන්නේ නැතුව කටයුතු කරපු නිසා ඒ ඉඩමේ හිමිකරු විසින් අධිකරණයට ගිහිල්ලා, අධිකරණයෙන් ඔහුට පක්ෂව, සමිතිය මේක පවත්වාගෙන යනවා නම් අධිකරණයේ උපදෙස් අනුව කටයුතු කරන්නය කියලා නියෝගයක් දීලා තිබෙනවා කියලා දැනගන්න ලැබිලා තිබෙනවා. ඉතින් මේ තත්ත්වය තුළ කඩුවෙල සමූපකාර සමිතියේ වැඩ කටයුතු කරගෙන යන සේවකයන් විශාල පිරිසකගේ රැකියා පිළිබඳව අවදානමකට ලක් වෙලා තිබෙනවා.

ඒ වාගේම සමිතියේ ඉදිරි පැවැත්ම පිළිබඳව ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඉතින් මේ තත්ත්වයන්වලට විශාල වශයෙන් බාධාවන් වෙලා තිබෙන්නේ එක් පැත්තකින් සමිතියේ කළමනාකාරීත්වයට නිවැරැදි අවබෝධයක් ඇතුව කටයුතු කරන්න උපදෙස් ලබා දීම සහ නොහැකියාවක් තිබෙන තත්ත්වය නිසයි. ඒ නිසා විශේෂයෙන් මේ වෙලාවේ මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙනුත්, සමූපකාර විෂයය භාර ඇමැතිතුමාගෙනුත් ඉල්ලා සිටිනවා කඩුවෙල විවිධ සේවා සමූපකාර සමිතිය, අපේ ප්‍රදේශයේ බත්තරමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය මේ සමිති දෙක පිළිබඳව වැඩි අවධානයක් යොමු කරලා, ඒ සමිති කඩා වැටෙන තත්ත්වයට පත් වෙන්න දෙන්නේ නැතුව ඔබතුමන්ලාගේ මැදිහත් වීමෙන් ඒවායේ තිබෙන ණය පියවලා, ඒවායේ ව්‍යාපාරික තත්ත්වය වර්ධනය කරලා, මේ සමිති ශක්තිමත් කරන්න කියලා. ඒත් එක්කම විශේෂයෙන් කඩුවෙල සමිතියේ ඒ කිරිහල වහලා දාන්න වුණොත් මහ විශාල අවාසනාවන්ත තත්ත්වයක්. සමිතියේ තිබෙන ප්‍රධානම ලාභ ලබන ආයතනය. ඒක වැහුවොත් සමිතිය සම්පූර්ණයෙන්ම ඇද වැටෙනවා. ඒ නිසා ගරු ප්‍රධාන ඇමැතිතුමාට මැදිහත් වෙන්න කියලා ගෞරවයෙන් ඉල්ලනවා. මේ කිරි හල වහලා දාන තත්ත්වය, අදාළ පාර්ශව සමග සාකච්ඡා කරලා, නැවත අධිකරණයට ගිහිල්ලා අවසරයක් අරගෙන, ඒ ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරලා, ඒ අවශ්‍ය කටයුතු කරගෙන යන්න.

ඒ වාගේම ගොඩක් වෙලාවට මේ සමිති දෙකේම පාලක මණ්ඩලයක් කාලයක් තිස්සේ පැවතිලා තිබෙන්නේ. දැන් වඩාත් සුදුසුයි මේ සමිතිවල ඡන්ද පවත්වලා ඒ කටයුතු කරගෙන යෑම. ඒ නිසා අපි ඉල්ලනවා ජනතාවගේ නියෝජිතයන්ට ඒ කටයුතු කරගෙන යන්න. ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ, විෂයය භාර ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු වෙලා කටයුතු කළොත් මේ තිබෙන තත්ත්වයන්ගෙන් මුදවා ගන්න. හැබැයි ඡන්දය තියෙන තුරු මේක විසඳන්නේ නැතුව ඉන්න බැහැ ගරු සභාපතිතුමනි. මේ ප්‍රශ්නය විසඳන්න වහ වහාම මැදිහත් විය යුතුයි. නැත්නම් කිරිහල සහ යෝගට් කර්මාන්තශාලාව වැහුණොත් එහෙම - මේ පළාතටම කිරි ලබා දෙනවා. කිරි ගොවීන් අනාථභාවයට පත් වෙනවා. ඒ වාගේම වැඩ කරන සේවකයෝ අනාථ වෙනවා. ඒ නිසා ඒ ගැන විශේෂ අවධානය යොමු කරලා මේ සමිති පිළිබඳව යම් සහනයක් සහ මැදිහත්වීමක් කරන්න. නිසි කළමනාකාරීත්වයක් යොදන්න සහ ආධාර කරන්න කියලා ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙනුත්, සමූපකාර ඇමැතිතුමාගෙනුත් ඉල්ලා සිටිමින් මගේ ප්‍රකාශය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාටත් බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. මම හිතන්නේ ඔබතුමා නිවැරැදිව ප්‍රකාශය ඉදිරිපත් කළා. ඒ වාගේම නියමිත වේලාවට ඔබතුමා ප්‍රකාශය අවසන් කළා. හෙක්ටර් බෙත්මගේ ගරු සභානායකතුමාත් ඒ වාගේමයි. එතුමාගේ ප්‍රකාශයත් සවිස්තරාත්මකව ඉදිරිපත් කරලා තිබෙනවා. එතුමාට මම අවස්ථාව ලබා දෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, මම අලුත් රීතිය තුළ ලිඛිතව ඔබතුමාට ඊයේ කල් වේලා ඇතුව මගේ ප්‍රකාශය භාර දුන්නා. මම මේ අවස්ථාවේදී එය සභාවට ඉදිරිපත් කරනවා.

ගරු සභාපතිතුමනි, ත්‍රිරෝද රථ නියාමනයට අදාළව අංක 1276/15 යටතේ 2003 පෙබරවාරි මස 20 දාතමින් බස්නාහිර පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන ත්‍රිරෝද රථ ප්‍රඥප්තිය ගරු රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා ප්‍රධාන අමාත්‍ය

ධූරයේද, ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා ප්‍රවාහන අමාත්‍ය ධූරයේද, මා එහි අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළ කාලයේ ගැසට් කරන ලද්දකි. ඒ අනුව 2004 දී ලසන්ත අලගියවන්න ගරු අමාත්‍යවරයා විසින් ක්‍රියාත්මක කොට එය අත්හිටුවන ලදී. 2008 රෙජිනෝල්ඩ් කුරේ ගරු අමාත්‍යවරයා පුවත්පත් දැන්වීම් පළ කළද, ක්‍රියාත්මක නොකරන ලදී. 2013 දී උපාලි කොඩිකාර ගරු අමාත්‍යවරයා නව ගැසට් පත්‍රයක් ප්‍රසිද්ධියට පත් කළද ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.2016 දී ලලිත් වනිගරත්න ගරු අමාත්‍යවරයා පුවත්පත් දැන්වීම් පළ කළද ක්‍රියාත්මක කොට අත්හිටුවන ලදී. කුමන හෝ හේතුවක් මත එම ප්‍රඥප්තිය මෙතෙක් ක්‍රියාත්මක වී නොමැත. මේ සම්බන්ධයෙන් මා අවධානයෙන් සිටියත් අසාර්ථක නිලධාරීන් හා බලධාරීන් නිසා වෘත්තීය ත්‍රිරෝද රථ මගී ප්‍රවාහන සේවය මෙතෙක් නියාමනය වී නොමැත.

සමස්ත ලංකා ත්‍රිරෝද රථ රියදුරන්ගේ වෘත්තීය සමිතිය ආරම්භයේ සිටම මා සමග පෞද්ගලිකව අදහස් හුවමාරු කර ගනිමින් සිටියත් විෂයයභාර අමාත්‍යවරුන් හා නිලධාරීන් විසින් මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇතැයි යන විශ්වාසය මා පළ කළෙමි. ඉහත සමිතිය විසින් දැනට සියළුම පළාත් සභාවන් විසින් ත්‍රිරෝද රථ නියාමනයට අදාළව ප්‍රසිද්ධියට පත් කර ඇති ගැසට් පත්‍ර හා කෙටුම්පත් උපයෝගී කර ගනිමින් කරුණු විශ්ලේෂණය කොට සකස් කරන ලද ප්‍රඥප්තියේ කෙටුම්පත හා රීති කෙටුම්පත ඇතුළු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සතුටට පත් වුවත්, සමිතියේ ගරු සභාපති ලලිත් ධර්මසේකර මහතා පෞද්ගලිකව මා වෙත හෙළි කළ කරුණු අනුව බලවත් ලැජ්ජාවක් හා මහජන නියෝජිතයෙකු ලෙසින් වරදකාරී හැඟීමක් මා තුළ ඇති විය. අවසාන වශයෙන් මේ සම්බන්ධයෙන් විෂයය භාර ගරු ඇමැතිතුමා හා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වගකීම භාර ගත යුතු බව සඳහන් කරමි. ත්‍රිරෝද රථ මගී ප්‍රවාහනය විධිමත් නොවීම හේතුවෙන් සමස්ත ත්‍රිරෝද රථ රියදුරන්ට පමණක් නොව ඔවුන්ගෙන් යැපෙන්නන් මෙන්ම පොදු මගී ප්‍රවාහන සේවයේ අකාර්යක්ෂමතාවය හේතුවෙන් පෞද්ගලික ප්‍රවාහන මාධ්‍යයක් නොමැති අහිංසක මගී ජනතාවටද බලවත් අසාධාරණයක් සිදු වී ඇත.

මෙම තත්ත්වය හමුවේ පැවැති හා පවතින රජයන්ට බරපතළ විවේචන ඔවුන් තුළ කැකෑරෙමින් පවතී. එමෙන්ම එවක සිට මේ දක්වා බස්නාහිර පළාත් සභාවේ බලය එකම පාර්ශවයකට පැවතීමද මෙය දෙගුණ තෙගුණ වීමට හේතු වී ඇතැයි මම සලකමි. එමෙන්ම රජයේ හා පෞද්ගලික ආයතන පවා ශ්‍රම බලකාය අපතේ යැමට එක් ප්‍රධාන හේතුවක් ලෙස ත්‍රිරෝද රථ කර්මාන්තය මා සඳහන් කරමි. මේ අවස්ථාවේදී හෝ මේ සඳහා සක්‍රීය මැදිහත්වීමක් තුළින් සියළුම පාර්ශවයන්ට උපරිම ඵලදායී ත්‍රිරෝද රථ මගී ප්‍රවාහන සේවාවක් ලෙස නියාමනය කිරීමට කටයුතු නොකළහොත් සමස්ත ත්‍රිරෝද රථ කර්මාන්තයේම නියැලෙන්නන් හා පොදු මගී ජනතාවගේ අප්‍රසාදය සමස්ත දේශපාලන අධිකාරිය වෙත යොමු වීම වැළැක්විය නොහැක.

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, නව ආණ්ඩුකාර හේම කුමාර නානායක්කාර මැතිතුමා, රේඛීය අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා දැනුවත් කිරීමට මම අදහස් කරමි. ඒබැවින් සියළු ත්‍රිරෝද රථ සංගම් සමග අවසාන තීරණාත්මක සාකච්ඡාවක් සිදුකොට අතපසු කරන ලද අතිශය වැදගත් වූ බස්නාහිර පළාත ඇතුළත ත්‍රිරෝද රථ මගින් කෙරෙන මගී ප්‍රවාහන සේවා විධිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහාත් එම ක්‍රියාවේ හා ප්‍රවර්ධනය කිරීමේ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහාත්, ත්‍රිරෝද රථ කාර්යාංශයක් පිහිටුවීම සඳහාත් අවශ්‍ය විධිවිධාන සැලැස්වීම පිණිස 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය පැවරී ඇති පළාත් සභාවේ අවධානය යොමු කොට සියළුම පාර්ශවයන්ට උපරිම ඵලදායී ත්‍රිරෝද රථ මගී ප්‍රවාහන සේවාවක් බිහි කිරීම අරමුණු කොටගෙන මෙම ප්‍රකාශය සිදු කරමි. මෙම ප්‍රකාශය බස්නාහිර පළාත් සභාවේ ප්‍රවාහන අමාත්‍ය ගරු ලලිත් වනිගරත්න මැතිතුමාගේ විශේෂ අවධානය සඳහා යොමු කරමි. මේ සමග පහත සඳහන් ලේඛන සහාගත කරමි.

01. ත්‍රිරෝද රථ සේවා ප්‍රඥප්තිය
02. රීති - අංක 1576/30
03. රීති - අංක 1834/27
04. ප්‍රඥප්ති කෙටුම්පත
05. රීති කෙටුම්පත
06. ත්‍රිරෝද රථ මගී ප්‍රවාහන සේවා කර්මාන්තය විධිමත් කිරීමේ මාර්ගෝපදේශය
07. මෝටර් වාහන පනත - අංක 1821/31

[ගරු හෙක්ටර් බෙත්මගේ - සභානායකතුමා ]

08. මෝටර් වාහන පනත - අංක 2001/2
09. මෝටර් වාහන පනත - අංක 2035/51
10. විෂයය භාර අමාත්‍යවරයා ඇතුළු වගකිවයුතු පාර්ශවයන්ට එරෙහි ත්‍රිරෝද රථ සංගමයේ ගරු සභාපති ලලිත් ධර්මසේකර මහතා විසින් ගොනු කළ අභියාචනාධිකරණ පෙත්සම.
11. සමස්ත ලංකා ත්‍රිරෝද රථ රියදුරන්ගේ වෘත්තීය සමිතිය විසින් 2017.06.01 දාතමින් විෂයය භාර පළාත් අමාත්‍යවරයා ඇතුළු වගකිව යුතු පාර්ශවයන් වෙත යොමු කළ එන්තරවාසිය.

මේ සියල්ල මම සභාගත කරමින් ගරු විෂයය භාර අමාත්‍යතුමා මේ කෙරෙහි විශේෂ අවධානය යොමු කරලා යහපත ඉෂ්ට කරන හැටියට ඉතාමත්ම ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාටත් බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අනෙකුත් සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. ගරු සභානායකතුමා ඉදිරිපත් කරපු ආකාරයටම ඉදිරියේදී පෞද්ගලික පැහැදිලි කිරීම් සභාවට ඉදිරිපත් කරන ලෙසට. එතකොට ගොඩක් පහසු වෙනවා. කාලය ඉතුරු වෙනවා. අනවශ්‍ය ප්‍රශ්නවලට යන්නේ නැහැ. ඒ අනෙක් මන්ත්‍රීවරුත් ඉදිරියේදී ඒ වාගේ ප්‍රකාශ කලින් ඉදිරිපත් කරන්න. එතකොට මට අවසර දෙන්න පුළුවන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ක්ෂණිකව දුන්නොත්?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ඔක්කොම ක්ෂණිකව නේ තිබෙන්නේ. මම දන්නවා. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ හෙක්ටර් බෙත්මගේ ගරු සභානායකතුමා ත්‍රිවිල් ප්‍රඥප්තිය සම්බන්ධව ප්‍රකාශයක් කළා. මගේ නමත් කියැවුණා. මම ඉන්න කාලයේ මේ ත්‍රිවිල් අධිකාරිය පිහිටුවන්න ඉඩමක් වෙනම අරගෙන, ඒකට නිලධාරී මණ්ඩලයක් පත් කරලා ක්‍රියාත්මක කරලා තිබුණා. මේ වන කොට දැනුත් එය ක්‍රියාත්මක නොවන එකයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒක තමයි දැනට තිබෙන ප්‍රශ්නය. විශ්‍රාම වැටුප සම්බන්ධව. සමූපකාර විශ්‍රාම වැටුප වාගේම ත්‍රිවිල් විශ්‍රාම වැටුපත් මේ සභාවට දාලා අනුමත කරලා, කැබිනට් paper එකක් දාලා ඒ ක්‍රියාවලිය සම්පූර්ණ කරලා තිබුණේ. දැන් තිබෙන්නේ වැඩේ කරන්න විතරයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. බොහොම ස්තූතියි. මීළඟට රීති අත්සිටුවීමේ යෝජනාව යටතේ පෞද්ගලික මන්ත්‍රී යෝජනා එන්නේ. ඒ අනුව යෝජනා දෙකක් තිබෙනවා. මම පළමුවැනි යෝජනාව ඉදිරිපත් කරන්න ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. රීති අත්හිටුවීමේ යෝජනාව -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. 37(1). ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මොකද මම දිගින් දිගටම මේ සභාවේ කථා කරපු කරුණක් සම්බන්ධව. මම අද එන කොට රඹුක්කන පාසලේ දෙමව්පියන් පිරිසක් මාව වට කර ගත්තා. ජනතාව මැද පළාත් සභාවටත් එක්කම මට ලොකු දෝෂාරෝපණයක් කළා. ඒක ඇත්තටම මට ලොකු ගැටලුවක් වුණා. මොකද, නිතර නිතර පළාත් සභාවේ කථා කරන ප්‍රශ්නයක්. මොකද, අපි හැමදාම කියපු දෙයක් තිබුණා. මේ බස්නාහිර පළාත් සභාව මගින් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අර ළඟම පාසල හොඳම පාසල කියලා නම් කරනු ලැබුවා. නම් කරලා දැන් අවුරුදු 21/2 ක්, 3 ක් විතර වෙනවා. නම් කරලා රඹුක්කන විද්‍යාලයේ ගොඩනැගිලි ටික ගලෝලා අයින් කළා. ගොඩනැගිලි ටික ගලෝලා අයින් කළාට පස්සේ, අද ළමයින්ට ඉගෙන ගන්න තැනක් නැහැ. අද ළමයින් ටික තැන් තැන්වල. වර්ෂා

කාලයට ඉන්න තැනක් නැහැ. වර්ෂා කාලයට උගන්වන්න තැනක් නැහැ. අර ටිකක් එහා තිබෙන විහාරස්ථානයට අරගෙන යනවා. විහාරස්ථානයේ මොකක් හරි උත්සවයක් තිබෙන කොට ළමයින්ට ඉගෙන ගන්න විධියක් නැහැ. මේ වර්ෂා කාලය තුළ ළමයින්ට ඉගෙන ගන්නව විධියක් නැතිව අද දෙමව්පියන්ගෙන් වැඩි පිරිසක් මාව වට කරගත්තා. ඒ හේතුව උඩ මට එන්න ප්‍රමාද වුණා. ඒ නිසා මම මේක පළාත් සභාවේ නිතර නිතර කිව්වා. මේකට හේතුව මොකක්ද කියලා මම දන්නේ නැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මෙය ගණන් ගන්නේම නැහැ. අද පාසල්වල බෝඩ් දාලා තිබෙනවා, "ළඟම පාසල හොඳම පාසල" කියලා. හැබැයි, ඒවායේ කිසි සංවර්ධනයක් වෙන්නේ නැහැ. අද ගොඩනැගිලි ටික ගලෝලා අයින් කරලා. මේ වර්ෂා කාලයේ දැන් දරුවන්ට ඉගෙන ගන්න විධියක් නැහැ. ඒ නිසා මීට වඩා වරප්‍රසාදයක් තවත් නැහැ. අපි ඒකයි කිව්වේ. ඒ නිසා මම පැහැදිලිව කියනවා. මම අද මේ සභාවට ආවේ මෙය දිගින් දිගටම අධ්‍යාපන අමාත්‍යාංශයට කියනවා. මේක කරන්නේ නැහැ. මම ඒකට විරෝධයක් හැටියට - මම පැහැදිලිවම ලබන පළාත් සභා රැස්වීම වෙලාවේදී මීට වඩා ලොකු විරෝධයක් කරනවා. මේක පළාත් සභාවට, අධ්‍යාපන අමාත්‍යාංශයට දැනෙන්න ඕනෑ නිසා. අපට නැත්නම් හැමදාම -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ අලුත් රීති හැටියටද වැඩ කරන්නේ? රීතිය මොකක්ද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

පැහැදිලිවම මම කියනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

රීති අනුගමනය කරන්න කෝ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

දරුවන්ට අද ඉස්කෝලේ ඉගෙන ගන්න විධියක් නැහැ. තමුන්නාන්සේලා කථා කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ලිඛිතව දෙන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද දවස ඇතුළත, මේ වර්ෂාව තිබෙන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔච්චර සල්ලි තිබෙන්නේ. ඔබතුමා බිල්ඩිමක් ගහලා දෙන්න කෝ තාවකාලික.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගොඩනැගිලි ටික කඩලා දාලා ඇවිල්ලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අදාළ ඇමතිතුමාට ගැටලුව ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ළමයින්ට ඉගෙන ගන්න විධියක් නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මන්ත්‍රී වැටුපෙන් ගහලා දෙන්න කෝ. අපි ගහලා දෙනවා එහෙම වෙලාවට.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔබතුමියන්ලා කරපුවා තමයි. එක්සත් ජාතික පක්ෂය කරපුවා තමයි. එක්සත් ජාතික පක්ෂය කරපු දේ ළඟම පාසල හොඳම පාසල කිව්වා. හොඳම පාසල කියලා අද ළමයින්ට ඉගෙන ගන්න විධියක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද තමුන්නාන්සේලා තවත් කථා කරනවා. මේ ළමයින්ට ඉගෙන ගන්න විධියක් නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ළමයින් ගැන අපි හොඳට බැලුවා. ඔයා ලකුණු දා ගන්න යන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සභාව මේ විධියට මෙහෙයවන්න ගියොත් අපි විරුද්ධ වෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මම ඊළඟ සභාවේදී මීට වඩා විරෝධයක් කරනවා. අධ්‍යාපන අමාත්‍යාංශය මේ වැඩේ කරන්නේ නැති වෙන කොට -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ වැස්ස වෙලාවේ. ගංවතුර වෙලාවේ මෙතැන ඡන්ද ව්‍යාපාර කරන්න එපා. ඉස්කෝලත් වහලා තිබෙන්නේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ නිසා මම සභාවේ විරෝධයක් හැටියට අද මේ සභාවෙන් එළියට යනවා. හැබැයි ලබන සභා වාරයට ඉස්සෙල්ලා මේ පාසල්වලට විසඳුමක් දුන්නේ නැත්නම් මෙයට විරෝධයක් මේ පළාත් සභාවේ ජනතාව වෙනුවෙන්, දරුවන් වෙනුවෙන් කරනවා කියන එක පැහැදිලිවම මතක් කරන්න කැමැතියි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඕක කාලයක සිට දන්නවා නේ? යෝජනාවක් ලියලා දාන්න කෝ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔබතුමියන්ලා නේ කළේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කරන්න අවස්ථාව.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පොඩ්ඩක් ඉන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වාඩි වෙන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

***[නැඟී සිටියේය. ]***
*[Stood.]*

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

යෝජනාවක් ඉදිරිපත් කළා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ඒක යෝජනාව ඉදිරිපත් කරන්න පස්සේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

රීති අංක ඇතුළත් කරලා -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නිකන් කීක් කීක් ගාන්න එපා. යෝජනා දාන්න. අපි උත්තර දෙන්නම්.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම දුන්නා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ යෝජනාව ඇවිල්ලා නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ඉදිරිපත් කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පොදු වැදගත්කමකින් යුක්ත වූද,

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මගේ ඉල්ලීම?

## රීති අංක 110 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 110

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"පොදු වැදගත්කමකින් යුක්ත වූද, කාලීන වූද පහත සඳහන් යෝජනාව සභාවට ගෙන ඒම සඳහා කාර්ය පටිපාටි රීති 14(6), 14(7)(ආ), 19(1), 19(3), 39, 53(2), 53(3) යන රීති අත්හිටුවිය යුතු බවට යෝජනා කර සිටී."*

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ යෝජනාව ස්ථිර කරන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

*[විසින් ස්ථිර කරන ලදී. ]*
*[Seconded]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට කථා කරන්න අවස්ථාව දෙනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යෝජනා දෙකක් තිබෙනවා. කෝක ද ගන්නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යෝජනා දෙක කල් පිරීම මත කරන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මගේ පෞද්ගලික ප්‍රකාශය -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පිස්සෝ මේ - පිස්සෝ ආපහු මෙතැන නටනවා. පිස්සෝ නටනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වෙලාව අනුව කරන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

උස්සලා එළියට දාන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පිස්සෝ නටනවා. උස්සලා එළියට දාන්න. අපි නම් සත පහකටවත් ගණන් ගන්නේ නැහැ. නිකන් පව කියනවා ඉඳගෙන.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කමක් නැහැ. ඔබතුමා කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කථා කරන්නේ කොහොමද? සෙංකෝලය අරගෙන යනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ඔබතුමා අරගෙන යන්න. ප්‍රශ්නයක් නැහැ. මන්ත්‍රීතුමා න්‍යාය පත්‍රය අනුව -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේක තමුන්නාන්සේලා, ලේකම්තුමා පිළි අරගෙන තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

න්‍යාය පත්‍රය අනුව මෙතැන කරගෙන යනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එච්චෙ, 04.45 ට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා රීතිවල තිබෙන්නේ විස්තරාත්මකව එවන්න. ඔබතුමා එවලා තිබෙන එක ඒකට පටහැනිව එවලා තිබෙන්නේ. සභාපතිතුමා ඒක ප්‍රතික්ෂේප කරලා. ඔබතුමා රීති පොත කියවන්න. මේ අලුත් රීති පොත අනුව කියවන්න. හරි. ඔබතුමා කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ රීති පොතේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාපතිතුමා එහා පැත්තේ ඉන්නවා. ගිහින් කථා කරගන්න. ගරු මන්ත්‍රීතුමා, එහා පැත්තේ සභාපතිතුමා ඉන්නවා. ගිහිල්ලා තේරුම් කරගන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මගේ ප්‍රකාශය වෙලාවට එව්වා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා සභාපතිතුමාත් එක්ක කථා කරලා අහගන්න ප්‍රතික්ෂේප කළේ ඇයි කියලා. ඔබතුමා කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තමුන්නාන්සේලා -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මේ රීතිය කැඩුවොත් අපිත් කඩනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අලුත් රීතිවල හැටියට බීලා එන්න බැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔක්කොමලා ගන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගිහිල්ලා ඉඳගන්න. ගරු මන්ත්‍රීතුමා ඔබතුමා තේරුම් ගන්න. මේක විහිළුවක් නොවෙයි. මේ රීතිය කියවන්න. 36(1) –

*කාලීන වැදගත්කමකින් යුත් පෞද්ගලික ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන මන්ත්‍රීවරයෙකු විසින් සිය ප්‍රකාශය තම ලිපි ශීර්ෂයක සවිස්තරාත්මක ව ලියා සභා රැස්වීමට පෙර දින ප.ව. 04.15 ට පෙර සභාපතිතුමාට හෝ සභා ලේකම්වරයාට ලැබීමට සැලැස්විය යුතුය.*

ඒ අනුව ක්‍රියා කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ අනුව මම ක්‍රියා කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ඒ අනුව ක්‍රියා කරලා නැහැ. විස්තරාත්මකව එවලා නැහැයි කියලා සභාපතිතුමා ඒක ප්‍රතික්ෂේප කරලා තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ අලුත් රීතිවල තිබෙන්නේ, 04.15 ට පෙර එවන්න කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා එවලා තිබෙනවා. අහගහන්න. ගරු මන්ත්‍රීතුමා අහගන්න. ගරු මන්ත්‍රීතුමා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ රටේ නීතියක් තිබෙනවා. නීතියක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතකොට විස්තරාත්මකව එවන්න කියපු එකට ඔබතුමා එවලා තිබෙන්නේ ඉතාම කෙටියෙන්. නැත්නම් මේක සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාට වැරැදි මතයක් වෙන්න පුළුවන්. මෙතුමා එවලා තිබෙන්නේ,

*"2018.05.22 වන දින පැවැත්වෙන පළාත් සභා සඳහා කාර්ය පටිපාටි රීති අංක 36 යටතේ පෞද්ගලික ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම සම්බන්ධවයි.*

*උක්ත කරුණු සම්බන්ධව 2018.05.22 වන දින පැවැත්වෙන බස්නාහිර පළාත් සභාවේ සභාවේදී වර්තමාන දේශපාලන තත්ත්වය පිළිබඳව ප්‍රකාශයක් කිරීමට කාලය වෙන් කර දෙන මෙන් ඉල්ලා සිටිමි."*

දැන් විස්තරාත්මකව එවනවා නම් විතරයි මේකේ කාලය ලබා දෙන්නේ. මේ අලුත් රීති අනුව. ඔබතුමන්ලා අනුමත කරන ලද රීති පොත අනුව. ඒක නිසා සභාපතිවරයා මේක ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. එතකොට සභාපතිතුමාගෙන් ඒ ගැන ගිහිල්ලා අහගන්න. දැන් ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව දෙනවා කථා කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ආයේ ඉස්කෝලේ ගිහින් එන්න කෝ. සිංහල තේරෙන්නේ නැත්නම්.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, දැන් යෝජනාවක් එනවා නේ? ඒක යටතේ කථා කරන්න කෝ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔව්. මේක යටතේ කථා කරන්න දෙන්නම්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේකේදී කථා කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මේ යෝජනාව යටතේ කථා කරන්න ඔබතුමාට දෙන්නම්. මේ යෝජනාව ඉදිරිපත් කරන්න. යෝජනා දෙකෙන් පළමුවැනි යෝජනාව ඉදිරිපත් කරනවා. කාල වේලාව අනුව - රීති අත්හිටුවීමේ යෝජනාව නිසා කාලය ගැන දැන්ම කියන්න බැහැ. කාලය අනුව අපි වෙලාව තිබෙනවා නම් ඊළඟ යෝජනාවත් ගන්නවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඉතින් ඒක කියන්න එපැයි. ඔබතුමා මෙතුමාට අවස්ථාව දෙන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒකයි මේ ප්‍රශ්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නීතිය දැනගෙන එන්න. එතකොට හරි. ඔබතුමා වාඩි වෙන්න.

## පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු
PRIVATE MEMBER'S AFFAIRS

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"රට තුළ වෙසෙන වැඩ කරන ජනතාව ඇතුළුව මුළු මහත් ජනතාව මුහුණ දෙන ජීවන වියදම දරා ගන්නේ කෙසේද යන ගැටළුවට තවත් බරක් ලෙස ඩීසල්, පෙට්‍රල් හා භූමිතෙල් මිල වැඩවීමත්, ගෑස් මිල වැඩි වීමත් පිළිබඳව වගකිව යුතු පාලකයන් විසින් විශේෂ අවධානයට යොමු කළ යුතුය. ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණය වීමත් සමගින්ද බැඳී ඇති මෙම තත්ත්වය නිසා දරිද්‍රතා මට්ටම තවත් ඉහළ යමින් පවතී. නිෂ්පාදන ආර්ථිකය බිඳ වැටීම, අපනයන ආදායම් අඩුවීම, ණය බදු හා දඩ මත යැපෙන රටක් බවට පත් කිරීම, වංචා දූෂණ තත්ත්වයත්, රැකියා වියුක්තිය මෙන්ම රැකියා අවස්ථා පිළිබඳව සමාජ ආකල්පයන් ද සමඟ බැඳී ඇති මෙම තත්ත්වයට පැවැති සහ පවතින පාලනය වගකිව යුතු අතර, ජනතාව මත බර පැටවීම වෙනුවට නාස්තියෙන් තොර පාලනයකට යොමු වන ලෙසත්, වහාම තෙල් හා ගෑස් මිල අඩු කරන ලෙසත් රජයෙන් ඉල්ලා සිටී."*

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed.*

[පූ.භා. 10.52 ]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාවේදී අපි මේ රජයෙන් ඉල්ලා සිටියට - ඇත්තටම රජය කියලා කියන්නේ, ආණ්ඩුව විතරක් නොවෙයි. හමුදාව, පොලිසිය, අධිකරණය මේ සියල්ලම රජයට යටත් වෙනවා. හැබැයි මේ තත්ත්වයට බලපාලා තිබෙන්නේ, ඒ රජය නොවෙයි. මධ්‍යම ආණ්ඩුව ගන්නා වූ තීන්දු තීරණ. ඒක නිසා මේකට වගකියන්න ඕනෑ, ආණ්ඩුව. ආණ්ඩුව තමයි මේ තීන්දු තීරණ ගන්නෙත්. මේ ප්‍රශ්නය මේ තරමට බරපතළ වෙලා තිබෙන්නෙත්, මේ ආණ්ඩුව ගන්නා වූ ක්‍රියා මාර්ගත් එක්ක. ඒ නිසා අපට ප්‍රශ්නයක් තිබෙන්නේ. අපි මේ යෝජනාව ගෙනාවට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආණ්ඩුවක් තිබෙනවාද කියන ප්‍රශ්නයක් මේ සමාජය තුළ තිබෙනවා. මම කියන විතරක් නොවෙයි. පොදු සමාජය තුළ තිබෙනවා, මේ රට තුළ දැන් ආණ්ඩුවක් තිබෙනවාද? ආණ්ඩුවක් තිබෙනවා නම් මෙහෙම වෙන්නේ කොහොමද? කියන එක සම්බන්ධව.

අපි දන්නවා. මේ තෙල් මිල වැඩි කිරීම සම්බන්ධයෙන්, ඇත්තටම ඉස්සෙල්ලාම තෙල් මිල වැඩි කළේ ආණ්ඩුව නොවෙයි. තෙල් මිල වැඩි කළේ ඉන්දියානු ඔයිල් සමාගම. ඉන්දියානු ඔයිල් සමාගම තමයි එතැනට ආවේ. ඉන් පස්සේ තමයි ආණ්ඩුව ඉන්දියානු ඔයිල් සමාගම ළඟට ආවේ. නැතුව ආණ්ඩුව ඉස්සෙල්ලාම ගත්ත තීන්දුව නොවෙයි. මේක මේ දිගින් දිගටම ආණ්ඩු අතර යන ප්‍රශ්නයක්. විශේෂයෙන්ම තෙල් මිල වැඩි කිරීම සම්බන්ධව. අපේ රටේ පෙට්‍රල් ෂෙඩ් ටික ඉන්දියානු ඔයිල් සමාගමට දීලා, දැන් ඔයිල් සමාගම තමයි ඒ සම්බන්ධව ක්‍රියාත්මක වන්නේ.

ඇත්තටම ආණ්ඩුවක් නොවෙයි. ආණ්ඩුව ඒකට අනුගත වෙන එක තමයි අපේ රටේ දැන් සිද්ධ වෙමින් යන්නේ.

ඒ වාගේම තමයි, දැන් බස් ගාස්තු ගත්තොත් එහෙම, බස් ගාස්තු තීරණය වන්නේ, බස් සංගම් හරහා. ආණ්ඩුව නොවෙයි. අපි දන්නවා, යම්කිසි ආකාරයක සුහද මැච් එකක් මේක ඇතුළේ තිබෙනවා. ඉස්සෙල්ලාම බස් සමාගම්වලට කියනවා, මේකේ මිල වැඩි කරන්න බැහැ. ගාස්තු වැඩි කරන්න බැහැ. එක පාරටම උඹලා මොකක් හරි ඉස්සෙල්ලාම පියවරක් ගනින්. අඩුම ගණනේ ස්ට්‍රයික් එකකට යනවා හරි කියපල්ලා. ඊට පස්සේ තමයි ආණ්ඩුව එතැනට එන්නේ. ඊට පස්සේ සමාජය තුළටත් යනවා. අපි දන්නවා, එක් දිනක වැඩ වර්ජනයකට එනවයි කියලා බස් සමාගම් කිව්වා. ඒ නිසා මිනිස්සු හරි භයෙන් සිටියා. එදාට වැඩ වර්ජනයක් එනවා. අපි කොහොමද වැඩට යන්නේ. කොහොමද කටයුතු කරන්නේ කියලා. ඊට ඉස්සෙල්ලා දවසේ හැන්දෑවේ කිව්වා, බස් සමාගම් එක්ක සාකච්ඡා කරලා තීන්දුවක් දුන්නා බස් ගාස්තු වැඩි කරන්න. එතකොට අර සමාජ මනෝභාවය තුළත් මිනිස්සුන්ට හිතෙනවා, කමක් නැහැ. වැඩ වර්ජනයක් නැතිව දැන් ඉතින් වැඩි කළත් කමක් නැහැ. අපට වැඩ යන්න පුළුවන්. මෙන්න මේකත් එක්ක කල්පනා කරලා බැලුවාට පස්සේ තමයි අපට හිතෙන්නේ, මේ බස් ගස්තු වැඩි කිරීම, තෙල් මිල වැඩි කිරීම මේ සියලු කාරණා දිහා බැලුවාට පස්සේ ඇත්තටම ආණ්ඩුවක් තිබෙනවාද කියලා.

අපි දන්නවා, ඇත්තටම බස් සමාගම්වලින් ගත්තොත් එහෙම තෙල් මිල වැඩි වීම විතරක් නොවෙයි. ඔය ප්‍රතිශතය ඉල්ලන්නේ ඒ අය. ඒ අයගේ පිරිවැය වැඩි වෙලා තිබෙනවා. අපේ රටේ බස් සමාගම් ගණනාවක් තිබෙනවා. ඒ අතර වැඩිපුරම අපේ රටේ තිබෙන්නේ, තනි පුද්ගලයින් පවත්වාගෙන යන බස් රථ කර්මාන්තයක්. ඒ නිසා ඒ අය මුහුණ දෙන ගැටලුවක් තිබෙනවා. තෙල් මිල වැඩි වුණාට පස්සේ අපි දන්නවා, තෙල් මිල වැඩියි කියලා. නමුත් ඊට වඩා ප්‍රශ්න තිබෙනවා. දැන් වාහන අමතර කොටස් වාගේ දේවල්. ඒවා කොයිතරම් ප්‍රමාණයකින් වැඩි වෙනවාද කියලා අපි දන්නේ නැහැ. වාහන අමතර කොටස් මිලදී ගන්න ගියාට පස්සේ තමයි ඒක දන්නේ. ඊට පස්සේ සර්විස් කරන කොට ඒකේ ගාස්තුව වැඩියි. දැන් මේ සියල්ලක්ම අල්ලන්නේ මේක දාලා. ඒ කියන්නේ තෙල් මිල වැඩිවීම දාලා එතැන තමයි ස්ථානය බවට පත් වෙන්නේ. අර සියල්ල Cover කර ගැනීම සඳහා ගාස්තුව වැඩි කරගන්න. ඔන්න ඕක තමයි වෙලා තිබෙන ඇත්ත තත්ත්වය. දැන් මේකට ඒ අය ගන්නා වූ තවත් ක්‍රියා මාර්ග තිබෙනවා. ඒක විකල්ප ක්‍රියාමාර්ග කියලා කියන්නත් පුළුවන්. දැන් ඒකේ හොඳම දේ තමයි අපි දන්නවා, තෙල් මිල වැඩි කිරීමේදී භූමි තෙල් මිල රුපියල් 57/- කින් වැඩි කළා. අපට හිතාගන්න බැරි මිලක්. ඉතිහාසයේ කවදාවක්වත් මෙහෙම මිල වැඩි කිරීමක් භූමිතෙල් සම්බන්ධව කරලා නැහැ. ඒකට හරි අපූරු පැහැදිලි කිරීමක් ආණ්ඩුවේ ඇමතිවරියක් විසින් කරලා තිබුණා. මට මතක හැටියට නියෝජ්‍ය ඇමැතිවරියක්. එතුමිය කියලා තිබෙනවා, මේ මොකුත් නොවෙයි. මේ බස්වල කට්ටිය ඩීසල්වලට භූමි තෙල් කළවම් කරනවා. ඒක නිසා තමයි මේක වැඩි කළේ කියලා. රුපියල් 57/- කින් වැඩි කළේ කියලා. හරි අපූරු ෂෝක් උත්තර තමයි එහෙම බලන කොට එයාට තිබෙන්නේ. මේ ආණ්ඩුවල තිබෙන්නේ ඒ ජාතියේ උත්තර. ඉතින් අපි විශ්වාස කරන්නේ, භූමි තෙල්වල ඒ ප්‍රශ්නයට, ඩීසල්වලට භූමි තෙල් කළවම් කරන එකට විද්‍යාත්මක උත්තරය තමයි භූමිතෙල් මිල වැඩි කරලා දාන එක. ඒක හරි අපූරු විද්‍යාත්මක උත්තරයක්.

ඒ එක්කම මේකේ තව අතුරු කාරණයක් කියන්න ඕනෑ. අපි දන්නවා තෙල් මිල වැඩි වෙනවයි කියලා. මේ ගමන ඉතිහාසයේ ඒකත් පළමුවැනි වතාවට ආණ්ඩුවේ කැබිනට් ප්‍රකාශකයා ඊට කළින් රටට කිව්වා. දැන් මිල වැඩි වෙන්න යනවා කියලා කිව්වා. පහු වැනිදා මිල වැඩි වෙන්න යනවා. ඒක කවදාවක්වත් එහෙම වෙන්නේ නැහැ. එවලෙට කියනවා, අද මධ්‍යම රාත්‍රියේ 12.00 සිට මිල වැඩි වෙනවයි කියලා. ඒකේදී යම්කිසි පාලනයක්, විශේෂයෙන් තෙල් මිල වැඩිවීම ඇතුළේ සිද්ධ වෙන්න පුළුවන් අලකලංචි ගොඩක් වළක්වා ගන්නවා. හැබැයි වැඩේ තිබෙන්නේ, ඊට කලින් කැබිනට් ප්‍රකාශකයා මේක කිව්ව නිසා මොකද වුණේ? ෂෙඩ්වල පෝළිම් පිරුණා. අපි දන්නවා, මධ්‍යම පන්තිය විශේෂයෙන්ම ඔය කාර් තිබෙන කට්ටිය එහෙම ගිහිල්ලා පෝළිමේ ගහ ගත්තා. ඒකෙන් කොයිතරම් බරපතළ ප්‍රශ්න ටිකක් ඇති වුණාද? එක පැත්තකින් වාහන තදබදය. ඒ වාගේ ගැටලු රාශියක් ඇති වුණා. ඒ අතින් බැලුවාම අපේ රටේ මේ මධ්‍යම පන්තියත් හරි අපූරු මධ්‍යම පන්තියක් ඉන්නේ. අපි දන්නවා. ඔය සමහර කාර් එකකට වැඩිපුරම ගහන්න පුළුවන් තෙල් ලීටර් ප්‍රමාණය, තෙල් ලීටර් 20 යි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ලීටර් 50 යි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැහැ. නැහැ. මම කියන්නේ පොඩි කාර් එකකට එහෙම සාමාන්‍යයෙන් ලීටර් 20 යි ගහන්න පුළුවන් වන්නේ. එතකොට රුපියල් 20 කින් තෙල් මිල වැඩි වුණා නම් ඇත්තටම සිද්ධ වෙන පාඩුව කීයද? රුපියල් 400/- යි. හැබැයි, රුපියල් 400/- ගැන හිතලා අර පෝළිමේ සිටියා. අර සියල්ල සිද්ධ වෙන තුරු පෝළිමේ සිටියා. AC දාගෙන, රස්සාවල් පාඩු කරගෙන සිටියා. ඔන්න ඔහොම පිරිසකුත් අපේ රටේ ඉන්නවා. ඉතින් අපි දන්නවා, ඔවැනි කට්ටියම තමයි ඉතින් අපේ රටේ ඔය ආණ්ඩු හදන්නෙත්. ඔය තත්ත්වයට පත් කරන්නෙත්. ඔය ආණ්ඩුවලට ඡන්දය දෙන්නෙත්. නේද? ඕක නේ අපට හිතන්න තිබෙන්නේ. මට එක විවාදයකදී හම්බ වුණා, ආණ්ඩුවේ එක මන්ත්‍රීවරයෙක්. එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. මම කියන කොට, බලන්න කොයිතරම් ප්‍රශ්නයක්ද වෙලා තිබෙන්නේ. මේ වට්ටක්කා ගොවියා අද අසරණ තත්ත්වයට පත් වෙලා, රුපියල් 05 ට, 10 ට වට්ටක්කා කිලෝව ගිහිල්ලා තිබෙනවා කියලා කියන කොට එතුමා කියපු එක තමයි, අපි පාරිභෝගිකයා ගැනත් බලන්න ඕනෑය කිව්වා. දැන් එතුමා කියන්නේ අර වට්ටක්කා රුපියල් 05 ට අඩු වෙන්නේ මේ ආණ්ඩුව පාරිභෝගිකයා ගැන හිතලා කටයුතු කරනවා කියලා. ඒ නිසා තමයි රුපියල් 05 ට වට්ටක්කා කිලෝ එක අඩු වෙන්නේ කියලා. එහෙම තත්ත්වයක් තිබෙන්නේ. අන්න එහෙම විද්‍යාත්මක උත්තර සොයන පිරිසක් ඉන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම මේ මොහොත වන විට පෙට්‍රල්වලට තිබුණු බද්ධ රුපියල් 46/- යි. අලුතෙන් රුපියල් 13.50 ක් එකතු වුණා. බද්ධ. එතකොට රුපියල් 59.50 ක් දැන් බද්ධ පෙට්‍රල්වලට තිබෙනවා. ඩීසල්වලට තිබුණු බද්ද රුපියල් 25/- යි. ඒකට රුපියල් 6.50 ක් එකතු වෙලා තිබෙනවා. රුපියල් 31.50 ක් නව බද්ද තිබෙනවා. අපි ගෙවන ගාස්තු ඇතුළේ. ඒ වාගේම අපි කල්පනා කරලා බලන්න ඕනෑ. අද එදිනෙදා ආහාර ටික සපයා ගැනීමට නොහැකි පිරිස ඉන්නවා, ජනගහනයෙන් 4.1% ක්. මම මේ කියන්නේ හිතලූ ඒවා නොවෙයි. මේ මහ බැංකු වාර්තාවේ, අලුතෙන් ඇවිල්ලා තිබෙන මහ බැංකු වාර්තාවෙන් ගත්තු තොරතුරු තමයි මම මේ කොළයකට අරගෙන තිබෙන්නේ. 4.1% ක්. ඒ කියන්නේ, මේ රටේ අට ලක්ෂ හතළිස් තුන් දහස් නවසිය දහතුනක් ඉන්නවා, මෙන්න මේ දරිද්‍රතා මට්ටමේ ඉන්න මිනිස්සු. එතකොට ඒ ගොල්ලෝ බස් එකේ ගියත් ඒ අය මේ වැඩි වීමට හවුල් වෙන්න වෙලා තිබෙනවා. ඒ මිනිස්සු යන්නෙත් බස් එකේ මේ ගාස්තුව ගෙවලා. ඒ වාගේම ජනගහනයෙන් 22.1% ක් නිසි පෝෂණයක් සහිත ආහාර නොලබන ජනතාවක් තමයි අපේ රටේ ඉන්නේ. එතකොට උපදින දරුවන්ගෙන් 16% කට නියමිත බර නැහැ. ඒ කියන්නේ දරුවෙක් උපදින කොට ඒ දරුවාගේ බර කිලෝ ග්‍රෑම් 2.5 ක් තිබෙන්න ඕනෑ. නමුත් ඒ නියමිත බර නැතිව තමයි 16% ක් අපේ රටේ දරුවන් උපදින්නේ. ඒ වාගේම කිරි දෙන මව්වරුන්ගෙන් 35.1% ක් ලේ අඩු කමින් පෙළනවයි කියලා තිබෙනවා. ඒ වාර්තාවල. මෙවැනි තත්ත්වයක් තිබෙන රටේ තමයි තවදුරටත් මේ භාණ්ඩ මිල වැඩවීම නිසා මේ දරිද්‍රතා මට්ටමට වැටෙන්නේ. විශේෂයෙන්ම තෙල් මිල වැඩි කරනවා කියලා කියන්නේ, හැම දෙයකම හැම භාණ්ඩයකම මිලට, ආප්පයේ මිලට පවා මේ දේවල් ටික බලපානවා.

ඒ වාගේම අපි දන්නවා. අපේ රටේ ආදායම් විෂමතාවය ගත්තොත් එහෙම ජනගහනයෙන් පහළම 20%, ආදායමෙන් අඩු 20% ජාතික ආදායමෙන් 4.8% යි ලබන්නේ. නමුත් ඉහළ සුපිරි 20% ක් අපේ රටේ ආදායමෙන් 50% ක් ගන්නවා. මෙවැනි තත්ත්වයක් ඇතුළේ අද ජනතාව තවත් මෙලෙස අඩියට වැටෙන්නේ. අපේ රටේ මේ යෝජනාවේ සඳහන් කරලා තිබෙන්නේ ඒකයි. බදු ආදායම 2016 රුපියල් බිලියන 168.1 යි. 2017 ඒක රුපියල් බිලියන 275.4 යි. ඒ කියන්නේ 2017 අවුරුද්දේ විතරක් බදු ආදායම වැඩි වෙලා තිබෙනවා, 63% ක්. ආණ්ඩුවේ බදු ආදායම 63% ක් වැඩි වෙලා තිබෙනවා. එතකොට කාගෙන්ද ගන්නේ? මේ අපෙන්. ඒ කියන්නේ අපේ රටේ මේ රාජ්‍ය ආදායමෙන් 90% කට වඩා බදු වලින් එකතු කරන්නේ. ඉතුරු ටික දඩ පොළී හැටියට තමයි එකතු කර ගන්නේ. ඒක නිසා 2016 රුපියල් කෝටි 16,810 සිට 2017 රුපියල් කෝටි 27,540 දක්වා මේ ප්‍රමාණයෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා 2017 විතරක් අපේ රටේ රුපියල් කෝටි 73,556 ක් ලෝකයට ණය ගෙවලා තිබෙනවා. මෙවැනි තත්ත්වයක

රටක් බවට, අපේ රට අද පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේකට කවුරුවක්වත් නොවෙයි වගකිවයුත්තේ. පාලකයෝ වග කියන්න ඕනෑ. ඒ නිසා තවදුරටත් මහජනතාව මත බර පටවනවා වෙනුවට අපි කියන්නේ, රජයේ පැත්තෙන්, තමන්ගේ පැත්තෙන් මේ දූෂිත තත්ත්වයන් නැති කරන්න. වංචාව, දූෂණය නැති කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්න ඕනෑ. තවදුරටත් මෙවැනි තත්ත්වයක් ඇතුළේ අපේ රටේ ආදයම හොරා කන තත්ත්වයක් තිබෙන්නේ. ඉතින් එවැනි ක්‍රියාමාර්ගවලට යන්නේ නැතිව සම්පූර්ණයෙන්ම මේ බර සියලු බර ජනතාව මත පැටවීම කියන එක අසාධාරණයක්. ඒ නිසා ඊට එරෙහිව ආණ්ඩුව ක්‍රියා මාර්ග ගන්න ඕනෑ.

ඒ නිසා අද අපි ඇත්තටම උද්ඝෝෂණයක් ලැහැස්ති කරලා තිබුණා. කොළඹ. නමුත් අපි ඒක අවලංගු කළා. මේ අයහපත් කාලගුණ තත්ත්වය නිසා. නැත්නම් අද අපි උදේ මේ යෝජනාව නිකන් නොවෙයි ගේන්නේ. හවසට ගිහිල්ලා මේකට ජනතාවත් එක්ක පාරට බහින්න ලැහැස්ති වෙලා තමයි මේ යෝජනාව මම සභාවට එව්වේ. ඉතින් අපි මධ්‍යම ආණ්ඩුවට බල කරලා කියන්නේ, නාස්තියෙන් තොර පාලනයකට යොමු වන ලෙසත්, ඒ වාගේම වහාම මේ තෙල් මිල අඩු කරලා, එයින් ගන්නා වූ බදු ප්‍රමාණය අඩු කරලා ජනතාවට සහන සලසන ලෙසත්. ඒ ඉල්ලීම තමයි මේ යෝජනාව හරහා මේ සභාවේදී කරන්නේ. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තුතියි. මීළඟට නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. සමහර මයික්වල කාර්මික ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා කථා කරන ගරු මන්ත්‍රීතුමන්ලා හැර අනෙක් ගරු මන්ත්‍රීතුමන්ලා මයික් එක on කරන්න එපා. කථා කරන මන්ත්‍රීවරයාට විතරක් ඒ අවස්ථාව දෙන්න. අනික් අය මයික් එක on කළොත් මෙහේ recordings වල ප්‍රශ්නයක් ඇති වෙනවා. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[පූ.භා. 11.05 ]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ අපේ උගත් මන්ත්‍රීතුමා, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා අද මේ ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට මට පළමුවෙන්ම අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. එතුමා ප්‍රකාශ කළා, අද දවසේ කොළඹ නගරයේ "තෙල් මිල අඩු කරනු" කියලා විරෝධතා උද්ඝෝෂණයක් සංවිධානය කරලා තිබෙනවා කියලා. එතුමාගේ කථාවේ අවසානයේ. නිදහස ලැබුවායින් පස්සේ මේ රටේ කොතෙකුත් මේ විධියට බඩු මිල අඩු කරන්න, තෙල් මිල අඩු කරන්න, ඒ වාගේම උද්දමනය පහත හෙළන්න, ජීවන වියදම අඩු කරන්න කියලා ඕනෑ තරම් උද්ඝෝෂණ, විරෝධතා, පෙළපාළි ගිහිල්ලා තිබෙනවා. නමුත් බඩු මිල අඩුවීමක් නම් සිදු වෙලා නැහැ. දිගින් දිගටම සිදු වෙලා තිබෙන්නේ උද්ධමනය ඉහළ යන එක. ඒ වාගේම භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යන එක. ඉතින් මේ යථාර්ථය තේරුම් ගන්නේ නැතිව, මේක ජනප්‍රිය සටන් පාඨයක් විධියට බඩු මිළ අඩු කරනු කියලා, ඒ වාගේම තෙල් මිල අඩු කරනු කියලා, ඒ වාගේම උද්ධමනය පහත හෙලනු කියලා සටන් පාඨ කියූ පමණින් මේ බඩු මිල අඩු කරන්න බැහැ. රටේ ජාතික නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ. රටේ සේවා හා ආර්ථිකයේ වර්ධනයක් ඇති කරගන්න ඕනෑ. ඒ වාගේම අපනයනයේ වර්ධනයක් ඇති කරගන්න ඕනෑ. එහෙම වුණොත් පමණයි අපට රටේ ආර්ථික වර්ධනයක් සහ රටේ ජීවන තත්ත්වයේ ඉහළ යාමක් ඇති කරගන්න පුළුවන්කම ලැබෙන්නේ.

ඉතින් මේ යථාර්ථය තේරුම් ගන්නේ නැතිව සටන් පාඨ කියූ පමණින් බඩු මිල අඩු වෙන්නේ නැහැ. තෙල් මිල අඩු වෙන්නේ නැහැ. අපි සියලු දෙනාම දන්නවා, තෙල් කියලා කියන්නේ - තෙල් ගෑස් ඒ වාගේම කිරිපිටි මේ භාණ්ඩ විශාල ප්‍රමාණයක් ආනයනික භාණ්ඩ. එහෙමනම් මේ ආනයනික භාණ්ඩ පිටරටින් ආනයනය කරන්න නම් ඩොලර් අවශ්‍යයි. රුපියල් වලින් අපට ගනුදෙනු කරන්න පුළුවන්කමක් නැහැ. රුපියල් වලට තෙල් ලැබෙන්නේ නැහැ. කිරිපිටි ලැබෙන්නේ නැහැ. ගෑස් ලැබෙන්නේ නැහැ. එහෙමනම් ඩොලර්වලින් තමයි අපට ගනුදෙනු කරන්න සිද්ධ වෙන්නේ. එහෙනම් රටට ඩොලර් ගේන්න ඕනෑ. රටට ඩොලර් ගේන්න පුළුවන් කොහොමද? රටට ඩොලර් ගේන්න පුළුවන් රටේ අපනයනය වර්ධනය කිරීමෙන් පමණයි. එහෙමනම් අපනයනය වර්ධනය කිරීම සඳහා අපනයනය ඉලක්ක කරගත්ත ආර්ථිකයකට අපේ රට ක්‍රමානුකූලව අපි පරිවර්තනය කරගන්න ඕනෑ. තේ, පොල්, රබර් ආර්ථිකයේ තිබුණා. 1977 න් පස්සේ අපි ඒ ආර්ථිකයෙන් මාරු වුණා. විශේෂයෙන්ම ඇඟලුම් කර්මාන්ත හරහා රටට ආදායම් ගේන්න. ඒ වාගේම තමයි

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ]

විදේශීය ශ්‍රමිකයන් හරහා, දාහත් ලක්ෂයකට ආසන්න විදේශික ශ්‍රමිකයන් ප්‍රමාණයක් විදේශගත වෙලා ඒ හරහා අපේ රටට අවශ්‍ය කරන ඒ ඩොලර් සහ විදේශ විනිමය ගේන්න කටයුතු කළා. ඒ වාගේම තමයි අලුත් ආදායම් මාර්ග ඇති වෙලා තිබෙනවා. ඒ හරහා අපි උත්සාහ කරන්න ඕනෑ, රටේ ආදායම් මාර්ග වැඩි කරන්න. ඒ හැර වෙන විකල්පයක් නැහැ. සටන් පාඨ කියූ පමණින් භාණ්ඩ මිල, එහෙම නැත්නම් සේවාවන්වල මිල අඩු කිරීමේ හැකියාවක් නැහැ. අපනයනය වර්ධනය කර ගැනීම සහ අපනයන විවිධාංගීකරණයක් තුළින් පමණයි, අලුත් අපනයන වෙළඳ පොළවල් සොයා ගැනීම තුළින් පමණයි රටේ ආදායම ඉදිරියට ගෙනියන්න පුළුවන් වන්නේ. වර්ධනය කරගන්න පුළුවන් වෙන්නේ.

අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කියනවා, තෙල් මිල අඩු කරන්නය කියලා. දැන් මොකක්ද මේකේ ඇත්ත කථාව. අපි කීයකින්ද තෙල් මිල වැඩි කළේ. පෙට්‍රල් රුපියල් 20/- කින් වැඩි කළා. ඩීසල් රුපියල් 14/- කින් වැඩි කළා. භූමිතෙල් රුපියල් 57/- කින් වැඩි කළා. අපි අරගෙන බලමු කොහොමද සන්සන්ධනාත්මකව මේ තෙල් මිල වැඩි වුණේ කියලා. අපි 2015 මේ සම්මුතිවාදී ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ පළමුවෙන්ම දින 100 ය ඇතුළේ කරපු කාර්යයක් තමයි මේ අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ගණන් පහත හෙළීම. ඒ අනුව අපට පුළුවන්කම ලැබුණා, ගෑස් මිල, ඒ වාගේම තෙල් මිල පහත හෙලන්න. 2015 තෙල් මිල කීයද? පෙට්‍රල් ඔක්ටේන් 92 ලීටරයට පැවැති මිල රුපියල් 117/- යි. අද අලුත් මිල කීයද? රුපියල් 137/- යි. මේ ගණන් වැඩි කිරීමත් එක්ක. පෙට්‍රල් ඔක්ටේන් 95 රුපියල් 128 ටයි තිබුණේ. අද මිල රුපියල් 148/ යි. ඊළඟට ඔටෝ ඩීසල් ලීටරයක මිල තිබුණේ, රුපියල් 95/- ට. අද ඒ මිල රුපියල් 109 යි. ඒ වාගේම සුපර් ඩීසල් ලීටරයක මිල තිබුණේ, රුපියල් 110/- ට. අද රුපියල් 119/- යි. භූමි තෙල් ලීටරයක මිල තිබුණේ, රුපියල් 44/- ට. අද ඒක රුපියල් 101/- යි. මේ විධියට තමයි මිල වැඩි වෙලා තිබෙන්නේ. මේ භූමිතෙල් ගැන බොහෝදෙනා කථා කරනවා. භූමිතෙල් භාවිතා කරන්නේ අඩු ආදායම් ලාභීන්. ඒ වාගේම විවිධ ක්ෂේත්‍රවල නිෂ්පාදනයන්හි නිරතවන අය තමයි මේ භූමි තෙල් භාවිතා කරන්නේ. නමුත් අසාමාන්‍ය විධියට පසුගිය වර්ෂ කිහිපය තුළ භූමි තෙල් භාවිතය 48% කින් ඉහළ ගියා. මේ අසාමාන්‍ය විධියට මේ භූමි තෙල් භාවිතය ඉහළ ගියේ කොහොමද? රුපියල් 44 ට තිබුණු භූමි තෙල් ලීටරය රුපියල් 101 ට වැඩි කළාට පස්සේ සීඝ්‍ර ලෙස භූමි තෙල් භාවිතය අඩු වෙලා තිබෙනවා. එහෙමනම් මේ අසාමාන්‍ය භාවිතය කුමක්ද කියන එක පිළිබඳව විමසා බැලීමක් කළ යුතුව තිබෙනවා.

ඒ වාගේම තමයි විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ. මේ පිළිබඳව අද අපේ සමාජය තුළ වැරැදි මතයක් නිර්මාණය කරන්න උත්සාහ කරනවා. අපි අරගෙන බලමු. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ පිළිබඳව විශේෂ නිවේදනයක් නිකුත් කළා. එතුමා ඒ නිවේදනයෙන්ම පෙන්වා දුන් ආකාරයට ලෝක වෙළඳ පොළේ තෙල්වල මිල ගණන් කොහොමද කියලා අපි අරගෙන බලමු. 2005 එතුමා බලයට පත් වෙන කොට ලෝක වෙළඳ පොළේ තෙල් බැලරයක මිල ඇමරිකන් ඩොලර් 73 යි. 2008 වන විට ලෝක වෙළඳ පොළේ තෙල් බැලරයක මිල ඇමරිකන් ඩොලර් 160 ට ගියා. ඒ වාගේම තමයි, 2014 වන විට නැවත වතාවක් තෙල් මිල පහත බැස්සා. ඇමරිකන් ඩොලර් 103 යි. ඒ වාගේම තමයි 2015 වන විට තෙල් බැලරයක මිල ඇමරිකන් ඩොලර් 51 යි. 2016 පෙබරවාරි මාසයේ වන විට තෙල් බැලරයක මිල ඇමරිකන් ඩොලර් 33 යි. 2017 ඔක්තෝබර් මාසය වන විට තෙල් බැලරයක මිල ඇමරිකන් ඩොලර් 55 යි. 2018 අප්‍රේල් මාසය වන විට, මේ තෙල් වැඩි කිරීමට ආසන්න කාලය වනව විට ලෝක වෙළඳ පොළේ තෙල් බැලරයක මිල ඇමරිකන් ඩොලර් 70 යි. අද වන විට තෙල් බැලරයක මිල ඇමරිකන් ඩොලර් 78 යි. එහෙමනම් මේ ගණන් අරගෙන බැලුවාම අපි අවුරුදු තුනක් අඛණ්ඩව එක දිගට මේ තෙල්වලට සහනය ලබා දීලා තිබෙනවා. මිල අඩු කරලා. එක දිගට මේක පවත්වාගෙන ගිහිල්ලා තිබෙනවා. ලෝක වෙළඳ පොළේ තෙල් මිලේ ඇති වුණු උච්චාවචනයන් අනුව අපි තෙල් මිල වැඩි කරන්න උත්සාහ කරලා නැහැ. විශේෂයෙන්ම අපි තෙල් ආනයනය කරනවා. ගෑස් ආනයනය කරනවා. කිරිපිටි ආනයනය කරනවා. ඒ අනුව මේකෙන් අනෙකුත් සියලුම ක්ෂේත්‍රවලට යම්කිසි කම්පනයක් ඇති කරනවා කියලා අපි පැහැදිලිව දන්නවා. ඒක අනිකුත් සියලු භාණ්ඩ හා සේවාවලට බලපානවා. එහෙමනම් අපි අවුරුදු තුනක් එක දිගට අඛණ්ඩව මේ සහනය ලබා දෙමින් මේ මිලට තෙල් ලබා දෙන්න අපි

කටයුතු කළා. නමුත් ලෝක වෙළඳ පොළේ අද තෙල් මිල වේගයෙන් ඉහළ යමින් තිබෙනවා. ඒ අනුව මේ මොහොතේ දී තෙල් බැලරයක මිල ඇමරිකන් ඩොලර් 78 ක් වෙනවා. ඒ අනුවයි මේ තෙල් මිල සූත්‍රය අපට ඉදිරිපත් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මිල සූත්‍රයක් අවශ්‍යයි. මේක ප්‍රවාහන ක්ෂේත්‍රයට අවශ්‍යයි. ඒ වාගේම ගෑස්වලට අවශ්‍යයි. තෙල්වලට අවශ්‍යයි. අනිකුත් ක්ෂේත්‍රවලටත් යම්කිසි මිල සූත්රයක් අවශ්‍යයි. විශේෂයෙන්ම විදුලියට මිල සූත්‍රයක් අවශ්‍යයි. ඒ ලෝක වෙළඳ පොළේ ඇතිවන උච්චාවචනයන් අනුව. මේ යථාර්ථය තේරුම් ගන්නේ නැතිව ජනප්‍රිය සටන් පාඨ ඉදිරිපත් කළ පමණින් අපට මේ අර්බුදය ජය ගන්න පුළුවන්කමක් නැහැ. ලංකාවේ තෙල් නිෂ්පාදනය කරන්නේ නැහැ. ගෑස් නිෂ්පාදනය කරන්නේ නැහැ. මේ පිළිබඳව අපි දීර්ඝ කාලයක් තිස්සේ විශේෂයෙන්ම මන්නාරම් ද්‍රෝණියේ තෙල් නිධි පිළිබඳව අපි සාකච්ඡා කරනවා. නමුත් ඒකට ආයෝජනය කරන්න පුළුවන් ආකාරයේ ජාතික ධනයක්, ප්‍රාග්ධනයක් අපි සතුව නැහැ. ඒ නිසයි විදේශ ආයෝජකයෝ කැඳවා ගන්න උත්සාහ කරන්නේ. මන්නාරම් ද්‍රොණියේ විශාල තෙල් නිධියක් තිබෙනවා. ගෑස් නිධියක් තිබෙනවා. ඒ පිළිබඳව දැනට සියලු පරීක්ෂණ කටයුතු කරලා අවසානයි. අවසන් කරලා තිබෙන්නේ. ස්ථානීය පරීක්ෂාවන් කරලා හඳුනාගෙන අවසන්. ඒ නිසා අපි උත්සාහ කරන්න ඕනෑ, මේ මන්නාරම් ද්‍රෝණියේ තිබෙන තෙල් නිධි අපේ රට ඇතුළින්ම පොළවෙන් උඩට ගන්න පුළුවන්කමක් තිබෙනවාද කියලා අපි අවධානය යොමු කරන්න ඕනෑ. නමුත් ඒ සඳහා විශාල ආයෝජනයක් කළ යුතුව තිබෙන නිසා එය අපට අද දවසේ කිරීමේ හැකියාවක් අපේ ආර්ථිකය සතුව නැහැ. ඒ නිසා මේ කරුණු විශේෂයෙන්ම අවධානය කළේ අපි තේරුම් ගන්න ඕනෑ. තවමත් 2014 එදා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලන සමයේ තිබුණු තෙල් මිලට වඩා අපේ තෙල් මිල පහළ මට්ටමක තිබෙන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කීයකින්ද?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

පොඩ්ඩක් ඉන්න. කියන්නම්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

රුපියල් 10/- කින් අඩුයි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

2014 ඉන්ධන මිල කොහොමද තිබුණේ කියලා මම පැහැදිලිව කියන්නම්. 2014 අග වන විට, ජනාධිපතිවරණය කැඳවා තිබුණු අවස්ථාව වන විට තෙල් මිල පෙට්‍රල් ඔක්ටේන් 92, රුපියල් 157/- ට තිබුණේ. ඒ වාගේම පෙට්‍රල් ඔක්ටේන් 95 තිබුණේ, රුපියල් 158/ ට. ඔටෝ ඩීසල් තිබුණේ, රුපියල් 111/- ට. සුපර් ඩීසල් තිබුණේ, රුපියල් 133/- ට. භූමි තෙල් තිබුණේ, රුපියල් 106/- ට. එහෙමනම් අද මිල කීයද? අපි 2017 ලෝක වෙළඳ පොළේ තෙල් බැලරයක මිල ඩොලර් 78 ට ගිහිල්ලා තිබෙන අවස්ථාවේදීත් පෙට්‍රල් ඔක්ටේන් ලීටරයක මිල රුපියල් 137/- යි. එදා රුපියල් 157/- යි. අද රුපියල් 137/- යි. පෙට්‍රල් ඔක්ටේන් 95, එදා රුපියල් 158/- යි. 2014 දී. 2018 කීයද? රුපියල් 148/- යි. ඒ වාගේම ඔටෝ ඩීසල් එදා කීයද? රුපියල් 111/- යි. අද කීයද? රුපියල් 109/- යි. සුපර් ඩීසල් කීයද? රුපියල් 133/- යි. අද රුපියල් 119/- යි. භූමි තෙල් කීයද එදා තිබුණේ? රුපියල් 106/- යි. භූමි තෙල් ලීටරයක් රුපියල් 106 යි. අද රුපියල් 101/- යි. එහෙමනම් එදාට සාපේක්ෂව අරගෙන බැලුවාම අද අපි තෙල් මිල පහළ මට්ටමක පවත්වාගෙන යන්නේ. ඒක නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමා මාර්ගයෙන් දැනගන්න කැමැතියි. දැන් මේ තෙල් මිල වැඩි කරද්දී 78 ගෙනාපුවාද මේ බෙදන්නේ. වැඩි කිරීම තුළ. 70 ට ගෙනාපුවා තමයි තවම දෙන්නේ. තවම 78 ට ගෙනාවේ නැහැ, ගරු මන්ත්‍රීතුමා. මේ සභාව නොමඟ යවන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බාධා කරන්න එපා. ඔබතුමාගේ කථාවේදී කථා කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

සභාව නොමග අරින්න දෙන්න බැහැ. 70 ට ගෙනාපුවා තවම දෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කථාවේදී කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒක තමයි සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

සභාව නොමඟ අරින්න දෙන්න බැහැ. මේ තවම දෙන්නේ 70 ට ගෙනාපුවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔය රාජ්‍යය ආයතනයත් පාඩු ලබනවා කියලාද කියන්නේ?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

එක දිගට බොරු කියන්න දෙන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාවේදී කියන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

බොරු කීමේ සීමාවක් තිබෙනවා. අපට මේවා අහන් ඉන්න අමාරුයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන්න. ඔබතුමාට කලින් මම මෙතැනට ආවේ. මම යන්නෙත් ඔබතුමාට පස්සේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු මන්ත්‍රීතුමා, 2015 ලෝක වෙළඳ පොළේ (බාධා කිරීමක්) තෙල් බැලරයක මිල ඇමරිකන් ඩොලර් 51 යි. ඊළඟට 2016 වන විට ඒක ඩොලර් 33 ට බැස්සා. ඒ අවස්ථාවේදීත් අපි මිල මේ ආකාරයටම පවත්වාගෙන ගියා. එක දෙයක් අපි මතක් කරලා දෙන්න ඕනෑ. බොහෝදෙනා කියනවා මේ පෙට්‍රල්, ඩීසල්, භූමි තෙල් මත විශාල බදු බරක් පටවලා තිබෙනවා කියලා. ඇයි මේ බදු ගහන්නේ? බදු නැතිව රජයකට අවශ්‍ය කරන ආදායම උපයා ගන්නේ කොහොමද? දැන් එක පැත්තකින් වැටුප් වැඩි කරන්න කියනවා. ජීවන වියදම් දීමනාව දෙන්න කියනවා. සහනාධාර දෙන්න කියනවා. පොහොර සහනාධාරය දෙන්න. සමෘද්ධි සහනාධාරය දෙන්න, පාසල් පොත් ටික දෙන්න, පාසල් නිල ඇඳුම් ටික දෙන්න, විශ්‍රාම වැටුප් දෙන්න, ගොවි විශ්‍රාම වැටුප දෙන්න, අනික් සියලුම නිදහස් සෞඛ්‍ය සේවය ලබා දෙන්න, නිදහස් අධ්‍යාපනය ලබා දෙන්න මේ ඔක්කොම ලබා දෙන්නය කියලා කියනවා. ඒ දෙන්න කියන ගමන් අනික් පැත්තෙන් කියනවා, මේ භාණ්ඩවලට ගහලා තිබෙන බදු අයින් කරන්න කියලා. කොහෙන්ද රජයට ආදායම්. ඒ නිසා මම පැහැදිලිව කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එන්න එන්න රජයේ වියදම වැඩි වෙමින් තිබෙනවා. ආදායම අඩු වෙමින් තිබෙනවා. ඒ නිසා අපි කියන්න කැමැතියි, ආදායම වැඩි කරගන්න ඕනෑ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු මන්ත්‍රීතුමා, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා. ඔබතුමාගේ කථාවේදී කථා කරන්න.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු මන්ත්‍රීතුමා, බාධා කිරීමක් නොවෙයි. පෙට්‍රල් ලීටරයකට රුපියල් 43.50 ක් බදු ගහන එක රජයේ බදු ප්‍රතිපත්තියක්ද? ජනතාව සූරා කෑමකට ලක් වෙනවා. පෙට්‍රල් ලීටරයකට -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

රජයක් ව්‍යාපාර කරන්නේ නැහැ. රජයක් ව්‍යාපාර කරන්න හෝ ආදායම් ලබන්න වෙනම ව්‍යාපාර කරන්නේ නැහැ. වාණිජ ව්‍යාපාර -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඇයි? පාඩු ලබන්න ඕනෑමද?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මම අහන්නේ ඔබතුමාගෙන් නිදහස් අධ්‍යාපනයට, නිදහස් සෞඛ්‍ය සේවයට අනිකුත් සියලුම සහනාධාර, පහළොස් ලක්ෂයකට සමෘද්ධි සහනාධාරය ලබා දෙනවා. පොහොර සහනාධාරය ලබා දෙනවා. එච්චර සහනාධාර ලබා දෙන්නේ කොහෙන්ද?

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

බදු ගන්න. එක ලීටරයකට රුපියල් 43.50 ක් කියන්නේ -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒකේ කිසි වරදක් නැහැ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

දවසකට මෙට්‍රික් ටොන් 2500 ක් -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

වරදක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒ ආදායම් වලින් තමයි මේ රටේ ජනතාවගේ සුභසාධන සේවාවන් කරගෙන යන්නේ. මම කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අරගෙන බලන්න කොහොමද මේ වැඩි වෙලා තිබෙන්නේ කියලා. 2014 වැටුප් හා දීමනා ගෙවන්න පළාත් සභා ඇතුළුව රජයට වියදම රුපියල් බිලියන වලින් 487 ක් ගිහිල්ලා තිබෙනවා. ඒක 2015 වන විට 618 දක්වා වැඩි වෙලා තිබෙනවා. 2016 දී 633 දක්වා වැඩි වෙලා තිබෙනවා. 2017 දී 663 දක්වා වැඩි වෙලා තිබෙනවා. අද වන විට, 2018 අනුව 705 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි වැටුප් හා දීමනා ගෙවන්න, පොළී ගෙවන්න, සහනාධාර ගෙවන්න - සහනාධාර ගැන මම කියන්න කැමැතියි. විශේෂයෙන්ම 2014 දී රුපියල් බිලියන වලින් 436 ක් සහනාධාර ගෙවන්න ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම තමයි විශේෂයෙන්ම කියන්න ඕනෑ. 2015 සහනාධාරවලට ගියා, රුපියල් බිලියන 428 ක්. 2016 වර්ෂයේදී රුපියල් බිලියන 425 ක් ගිහිල්ලා තිබෙනවා. 2017 දී රුපියල් බිලියන 467 ක් ගිහිල්ලා තිබෙනවා. මේ ආකාරයට එන්න එන්න සහනාධාරවලට වෙන් කරලා තිබෙන මුදල් වැඩි වෙලා තිබෙනවා. එහෙමනම් මේ මුදල් කොහෙන්ද උපයා ගන්නේ? මේ මුදල් ලබා ගන්න ආණ්ඩුව ව්‍යාපාර කරන්නේ නැහැ. ඒ නිසා මේ මුදල් ලබා ගන්න වෙලා තිබෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බදු ආදායම්වලින්. ඒක නිසා තමයි රජයේ බදු ප්‍රතිපත්තියේ වෙනසක් කළේ. හැටයි හතළිහට යන්න ඕනෑය කියලා. ඒ කියන්නේ ඍජු බදු අද වැඩියි. ඒ නිසා තමයි මේක ක්‍රමානුකූලව අපි අඩු කරන්න ඕනෑය කියන තැනකට ඇවිල්ලා තිබෙන්නේ.

ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ. අද මේ චෝදනාවල කිසිදු පදනමක් නැහැ. මේවා හුදු සටන් පාඨ පමණයි. බඩු මිල අඩු කරනු කියන එක. ඒ වාගේම උද්ධමනය පහත හෙළනු කියන එක හුදු සටන් පාඨ විතරයි. මේවාට එදා සිටම පෝස්ටර් ගැහුවා. පෙළපාලි ගියා. උද්ඝෝෂණය කළා. අපි කියන්න කැමැතියි. එදා ඔය ආකාරයටම 1953 දී හාල් සේරුව ශත 25 කින් වැඩි කළා කියලා හර්තාලයක් ඇති වුණා. අද ගණන කීයද? එදත් ඔය සටන් පාඨම තමයි කිව්වේ. එහෙමනම් භාණ්ඩයක නිෂ්පාදන මිල ඉහළ යනවා. පිරිවැය වැඩි වෙනවා. ඒ අනුව ඒකට ගෙවන්න වෙන

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ]

වියදමත් වැඩි වෙනවා කියන එක මතක තියා ගන්න. ඒ අනුව තමයි ඕනෑම ව්‍යාපාරයක් ලෝකයේ ඉස්සරහාට යන්නේ. ඒක තමයි මේ වෙළඳ පොළ ආර්ථික ක්‍රමය. මේ වෙළඳ පොළ ආර්ථිකයේ තර්කය ඒකයි. ඒක නිසා ඒ තර්කයට අනුව කටයුතු කරන්න ඕනෑ. එහෙම නැතුව අපට හුදු සටන් පාඨවලින් නම් බඩු මිල අඩු කරන්න බැහැ. මේකට තිබෙන එකම උත්තරය වෙන මොකක්වත් නොවෙයි. Enterprises Sri Lanka. ව්‍යවසායකත්වයෙන් පිරුණු රටක් බවට මේ රට පත් කරනවා හැරෙන්න වෙන උත්තරයක් නැහැයි කියන එක පැහැදිලිව අපි කියන්න ඕනෑ. ඒ නිසා යල් පැන ගිය පරණ සටන් පාඨවලින් මේ රටේ ජනතාවගේ ප්‍රශ්න විසඳන්න බැහැ ගරු මන්ත්‍රීතුමා කියන එක ප්‍රකාශ කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

[පූ.භා. 11.25 ]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්තුතියි. මෙම ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරපු යෝජනාව කාලෝචිත යෝජනාවක් හැටියට, මම ඒක ගැන කථා කරන්නේ බොහොම සන්තෝෂයෙන්. ඒ වාගේම මම මේ සභාවට කියන්න ඕනෑ. මම මේ කථා කරන කොට පෙට්‍රල්වලට, ඩීසල්වලට පමණක් ලඝු කරලා මේ මාතෘකාව කථා කරන්න උත්සාහ කරන්නේ නැහැ. මේ පාරිභෝගික ද්‍රව්‍ය ගත්තොත් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා මේ දෙකට පමණක් ලඝු කරලා මේ ගැන කථා කරන්න අපට වැඩක් වෙන්නේ නැහැ. විශේෂයෙන්ම මගේ ප්‍රදේශයට බලපාන කරුණුත් අරගෙන මම කථා කළොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටක භාණ්ඩ හා සේවා මිල ඉහළ යාමට කරුණු ගණනාවක් බලපානවා. බද්ද පමණක් නොවෙයි. උදාහරණයක් හැටියට අපේ ගරු මන්ත්‍රීතුමා, මගේ සහයෝගයට ඉඳියි. අපේ හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාත්. අපේ ප්‍රදේශයේ දැන් වැලි කියුබ් එකක්, ගෙයක් හදන්න හෝ පාරක් හදන්න ගනිද්දී රුපියල් 12,000/- යි. මම මේ උදාහරණ අරගෙන කියන්නේ. ඒ නිෂ්පාදනය කරලා ගන්න තැනින් රුපියල් 12,000/- යි. ඉස්සර මේ රුපියල් 2000 ට වාගේ තිබුණේ. අපි සංවර්ධන කටයුතුවලට ගත්තා. මම මේ උදාහරණයක් කියන්නේ. මෙහිදී සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? ඒ අංශය භාර පරිසරය ඉන්නවා. භූ විද්‍යා සමීක්ෂණ කාර්යංශය ඉන්නවා. ව්‍යාපාරික පිරිසක් ඉන්නවා. කම්කරු ජනතාවක් ඉන්නවා. මේ සියලු දෙනාම එකතු වෙනවා. මේක ඇවිල්ලා නිෂ්පාදනය කරනවා නොවෙයි. ඒක පොළවෙන් ලබා ගැනීමක් තමයි කරන්නේ. දැන් මෙහෙම සම්පතක් තිබෙන කොට මේකේ වටේ ඉන්න භූ විද්‍යා අංශ නිලධාරීයා ගෙනැල්ලා පරීක්ෂා කරන කොට එයාට ලක්ෂ දෙක තුනක් දෙන්න ඕනෑ. ඊළඟට පරිසර නිලධාරීයාට ලක්ෂ දෙක තුනක් දෙන්න ඕනෑ. මේ විධියට වැඩ කරලා මේ බලපත්‍රය අරගෙන, මේ යන වියදම පියවා ගන්න. මේවා රුපියල් 12,000 ක් කරනවා. එතකොට මිල වැඩි වෙලා ඉවරයි. එතකොට බලන්න. මම මේ පෙන්නලා දෙන්නේ මේ රාජ්‍ය යාන්ත්‍රණයේ තිබෙන දෝෂ නිසා තමයි, මේ පාරිභෝගිකයාට කෙලින්නේ.

ඇත්ත වශයෙන්ම මම මේ එක අංශයක් විතරයි අරන් කථා කරන්නේ. සමස්ත රටේම ජාතික වැඩ පිළිවෙළකට ගියොත් කළ යුතු දේ බොහොම ලෙහෙසියෙන්, පහසුවෙන් අඩු මිලට කර ගන්න පුළුවන්. මේක වී ගොවිතැනටත් එහෙමයි. මාළු වෙළඳාමටත් එහෙමයි. මාළුවා අරගෙන මුහුදෙන් දෙන්නේ රුපියල් 100 ට නම් මේක රුපියල් 1000 ට තමයි වෙළඳ පොළේ අලෙවි වන්නේ. අර අතර මැදියෝ තමයි ගසා කන්නේ. ඉතින් මේ ක්‍රමවේද ටික හදා ගත්තොත් අඩුවට බඩු දෙන්න පුළුවන්. අපි අවධානය යොමු කළ යුතු තැන්වලට යොමු කරන්නේ නැහැ. අන්තිමට පොලිස්කාරයෙක් ඔය පැත්තෙන් ගියොත් රුපියල් 5000 ගණනේ එක වැඩ පොළකින් එකතු කරන් යන කොට තවත් රුපියල් 200/- කින් විතර ගණන් නගිනවා. ඉතින් මේ ක්‍රමවේදය නවත්වා ගන්නේ නැතිව මේ සමස්ත රටේ වෙනත් දේවල් කියලා, උද්ඝෝෂණ කරලා, පෝස්ටර් ගහලා - ඒ ගැනත් මම කියන්න ඕනෑ. මේ පෝස්ටර් ගැහුවාට බඩු මිල අඩු වෙන්නේ නැහැ. සමස්ත ලංකාවේ මිනිස් පැය ගණන අරගෙන බැලුවොත් අපේ විනාඩි 05 ක් ප්‍රමාද කරන කොට කෝටි දෙකක ජනතාවගේ විනාඩි පහේ ඒවා කෝටි දෙකක් නාස්ති කරනවා. මේ උද්ඝෝෂකයෝ. එතකොට මේ අය කරලා තිබෙන හානිය රටට ගණන් බැලුවොතින්, විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ පඩයක් ගියත් උද්ඝෝෂණයට ලැහැස්තියි. එතකොට ඒ ගොල්ලෝ සමස්තයක් හැටියට මේ රටේ කාලය විනාශ කරලා තිබෙන ඒවා ගණන්

බැලුවොතින් එහෙම සමස්තයක් හැටියට අති විශාල මිනිස් පැය ගණනක් නාස්ති කරලා, අති විශාල ධනස්කන්ධයක් රටට අහිමි කරනවා.

අපි හිතමු. සමස්ත ඉංජිනේරුවෙක් වැඩට යන කොට එයාගේ පාර අවහිර කරපුවාම සමස්ත සංවර්ධනය ඇණ හිටිනවා. එයා උපදෙස් දෙන ඒ සියලු දේ ඇන හිටිනවා. ඉතින් මේ ආකාරයට රටක් සංවර්ධනය කරන්න බැහැ. අපි එක එක්කෙනා තේරුම් ගන්න ඕනෑ, අපෙන් කෙරෙන්න ඕනෑ සේවය හරියට වෙනවාද කියන එක. අපි හැමෝම පුරුදු වෙලා ඉන්නේ ඒ වැළ යන පැත්තට මැස්ස ගහන්න සභාවට ඇවිල්ලා ජනප්‍රිය දෙයක් කථා කරනවා. මම අහගෙන අද උදෙත් පාසල් ගැන කථා කරනවා. ඉතින් මෙවැනි දේවල් හදන්න බැරි කමක් නැහැ. ඒ හදන්න තමයි මහජනයා අපව පත් කරන්නේ. ඉතින් ඒකේ නිවැරැදි තැනට අපි අරන් යන්නේ නැතිව කඩේ යාමේ ප්‍රතිපත්තිය හරි යන්නේ නැහැ. අපේ ආණ්ඩුව වුණත් විවේචනය කරන්න ඕනෑ නම්, අපි විවේචනය කරනවා. ඉතින් මම කියන්නේ, මේ ජනතාවගේ මේ ආණ්ඩුවේ වගකිවයුතු අංශවල අවධානය යොමු නොවුණු පැතිවලින් තමයි මේක දෝරේ ගලාගෙන යන්නේ. මහජනයා ගිහින් හිර වෙන්නේ, මහජනයා ගිහින් අමාරුවේ වැටෙන්නේ, මහජනයා වැඩිම මුදලක් වියදම් කරන්නේ අනවශ්‍ය තැනට. පාසලකට දාන්න ගියත් අද වන විට අපි දන්නවා, ලක්ෂ පහේ ඒවා, දහයේ ඒවා අරමුදල් අරවා මේවා කියලා කොහෙන් හරි ජනප්‍රිය පාසල්වලට යනවා. අම්මලා තාත්තලා කථා වෙන්නේ අරකේ තුනයි. මේකේ පහයි. අරකේ හතයි. මේකේ විස්සයි. මේකේ පහළොවයි කිව්වාම පාසල්වල ගණන්. ඉතින් මේවා බැලුවාම මේ පාරිභෝගිකයා තමයි කොහෙන් හරි ගිහිල්ලා වියදම් කරන්නේ. ඉතින් මෙවැනි ප්‍රශ්නත් එක්ක හිර වෙන කොට ගිහිල්ලා අවසානයේ නතර වෙලා ඉන්න ආණ්ඩුවට බණිනවා. ඉතින් මේක මහින්ද මහත්තයාටවත් තෙල් මීට වඩා අඩුවට දෙන්න බැරිව ගියා. ඒ කාලයේත් ජේ.වී.පී එක ගිය ආණ්ඩුවත් එක්ක මඟුල් කෑවා. දැන් විරසක වෙලා දික් කසාදයක් අරගෙන තිබෙනවා. මම මේ පක්ෂ විවේචනය කරන්න යන්නේ නැහැ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඔය හේදුවට වැඩක් නැහැ. කටානත් ඔබතුමියට නැති වෙන්න යන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ සිද්ධාන්තය -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඔබතුමියගේ කටාන ගිහින් තිබෙන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සැබෑ සිද්ධාන්තය අවබෝධ කරගන්න ඕනෑ. අද වන කොට -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඔය හේදුවට වැඩක් නැහැ. කටාන දැන් ගිහින් තිබෙන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි තානාන්තර බලාගෙනත් නැහැ. හැබැයි, තානාන්තර දුන්නා කියලා කඩේ යන්නෙත් නැහැ. කියන්න ඕනෑ රනිල් වික්‍රමසිංහ මැතිතුමාටද? ජනාධිපතිතුමාටද? එහෙම නැත්නම් මේ රටේ ඕනෑම කෙනෙක්ට කියන්න දෙයක් තිබෙනවා නම් හය නැතිව කියනවා. අපි ඒක පෙන්නලා තිබෙනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

දැන් වතුරට කියන්න. දුක් අඳෝනාව වතුරට කියන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි කඩේ යන්නේ නැහැ. මෙතැන ඉන්න අයට වුණත් කියන්න දෙයක් තිබෙනවා නම් අපි ඒ විධියටම කියනවා. ඒ එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි අවධානය යොමු කරන්න ඕනෑ. සමස්ත මහජන නියෝජිතයෝ හැටියට සමහර රටවල්වලට තිබෙනවා නිධාන වාගේ තෙල් නිධි නිකම්ම සල්ලි හම්බ වෙනවා. ඒ ගොල්ලෝ කාලා බීලා ගෙවල්වලට වෙලා ටීවී බල බලා සිටියත් දවස ගණනේ සල්ලි උල්පත් ගලනවා. මොකද, තෙල් ටික හොඳ රටවල්

[ගරු රෝස් ප්‍රනාන්දු ]

වලින් ගත්ත ගමන් සල්ලි එනවා. අපේ ලංකාව එහෙම රටක් නොවෙයි. එතකොට මම කියන්නේ, අද රටේ විශේෂ අවධානයක් යොමු වෙලා තිබෙනවා. මේ ස්වභාවික දේට, ස්වභාවික බෙහෙත් වර්ග. ස්වාභාවික ආහාර පාන. ස්වභාවික ජලය. දැන් මේ ඔක්කොම අපි පරිශීලනය කරන්නේ කෘතිම දේවල්. අද කුකුල් මස් කෘතිමයි. කෑම වර්ග කෘතිමයි. ඔක්කොම මාස හතරෙන් පහෙන් හදන ඒවා. මේ ස්වාභාවික දෙයින් තමයි ශ්‍රී ලංකාව ආදායමක් උපයනවා නම් උපයන්න ඕනෑය කියලා මම කියන්නේ. දැන් අපේ වට්ටක්කා රුපියල් පහට යනවා කියනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

කැකුණ තෙල් ගමු.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඇයි දෙයියනේ මේ වට්ටක්කාවලින් කොයිතරම් දේ නිෂ්පාදනය කරන්න පුළුවන්ද? ඒවා පරිභෝජනයට ගන්න පුළුවන්ද? බෙහෙත් හේත්වලට ගන්න පුළුවන්ද? ජෑම් වර්ග හදන්න පුළුවන්. විවිධ වර්ගවලට මේක ප්‍රයෝජනයට ගන්න පුළුවන්. වස විෂක් නැහැ. ස්වභාවික දෙයක්. ඉතින් මෙවැනි දේට අවධානය යොමු කරන්නේ නැතිව, ගන්න පුළුවන් ප්‍රයෝජනය ගන්නේ නැතිව, හැමදාම පාරට බැහැලා උද්ඝෝෂණය කරන්නේ නැතිව මම කියනවා මේ සියලුම උද්ඝොෂණකරුවන්ට. ඕගොල්ලෝ යෝජනා ඉදිරිපත් කරන්න. තමුන්ගේ ගම් ප්‍රදේශවලින්. දැන් අපි සොයාගෙන ඇවිල්ලා කියන්නේ, මේ ප්‍රශ්නය විසඳන්න ඕනෑ මේ විධියට. මේ ප්‍රශ්නයට උත්තරේ හෙව්වොත් මේක මේ විධියට හරි යනවා කියලා. යෝජනා ඉදිරිපත් කරන්න. මිල අඩු කරන්න පුළුවන්, ජනතාවට පරිභෝජනය කරන්න පුළුවන් හොඳ භාණ්ඩ සේවාවක් ලබා දෙන්න. අලුත් දේවල් නිෂ්පාදනය කරන්න. තමුන්ගේ ප්‍රදේශවල තිබෙනවා නම් ආයෝජනය කරන්න. අද රජය මේකට ලැහැස්තියි. ඉගෙන ගන්න කෙනෙක් ඉන්නවා නම්, ණයක් දීලා හරි උපාධිය දක්වා ඉගෙන ගන්න දෙන්න රජය ලැහැස්තියි. ආයෝජනය කරන්න කෙනෙක් ඉන්නවා නම්, අඩු මිලට ණයක් දෙන්න රජය ලැහැස්තියි. මේ යෝජනා අරන් ඇවිල්ලා රට දියුණු කරන්න.

ඒ වාගේම සමහර අය කාලකණ්නි සන්තෝෂයක් ලබනවා. ඉන්න ආණ්ඩුව හරි කාට හරි බාල්දි ඇදලා, බාල්දි ඇදලා එතැන ලකුණු දාගෙන, වාසියක් අරගෙන එහාට මෙහාට පනින, ඒ තුච්ඡ දේශපාලනයෙන් මේ රට දියුණු කරන්න නම් බැහැ. බඩු මිල අඩු කරන්නත් බැහැ. ඒ නිසා සිංහල, දෙමළ, මුස්ලිම් කල්ලි කල්ලි ගහලා, රණ්ඩු කරවලා අපේ ගමන් මග විනාශ කරලා, මේ රට විනාශ කරන්න හැදී පැහැදී ඉන්න, 1/3 ක් විතර ජනතාව මේ රටේ ඉන්නවා. මේ කට්ටිය නැති වනතුරු රට නම් ඉස්සරහාට ගෙනියන්න හම්බ වෙන්නේ නැහැ. එහෙම නම් ඒ අයට අපි මොකද කරන්න ඕනෑ. එක්කෝ පන්තියක් දාලා අලුතෙන් උගන්වන්න ඕනෑ. මම හිතන්නේ ඒගොල්ලෝ ඉස්සර පන්ති පහක් කළා. ඉස්සර ට්‍රාන්සෆෝමර් පිච්චුවා. අපි ඔය නැටි කපලා ගෙනැල්ලා දැන් වාඩි කරවලා ලස්සනට මහත්වරු වාගේ කථා කරනවා. තව ටිකක් අපට කාලය හම්බ වුණා නම් ඔය පන්තියක් තියලා මේ අයගෙන් ඒ වැඩෙත් අපි කර ගන්නවා කියන මගේ ප්‍රකාශය කරමින්, මේ තමුන්නාන්සේලාගේ අවධානය මේ බඩු මිල සම්බන්ධයෙන් එක තැනකට ලඝු කරන්නේ නැතිව සමස්තයක් විධියට, සමස්ත අපේ ජනතාවගේ දියුණුව වෙනුවෙන් කථා කරනවා නම් ඒ සියලු දේ අවධානයට යොමු කරලා කිසිම වැදගත් හේතුවක් නැතිව ජනතාව පාරේ අතරමං කරන්නෙවත්, එතැන්ට ගෙන්වන සෙනඟගේ කාලය අපතේ අරින්නේ නැතිව කටයුතු කරන්න. ඒ අය රස්සාවක් කරනවා නම්, රස්සාවේ නිවාඩු අරගෙන ඒ අයව නාස්ති කරන්නේ නැතිව, මේ කාලකණ්නි දේශපාලනය නවත්තලා රට ඉස්සරහාට යන ඒ ගමන් මග අපි ගත්තොතින් බඩු මිල අඩු කරන්න පුළුවන්. පසුගිය රජයේ තිබුණා, සමෘද්ධි නිලධාරී ටික, සමූපකාර නිලධාරී ටික වැඩ නවත්තලා උද්ඝෝෂණයට ගේනවා. රැස්වීමට ගේනවා. එතකොට අතන වැඩක් යන්නේ නැහැ. කොහොමද රටේ සේවා සැපයෙන්නේ. කොහොමද රටේ බඩු මිල අඩු වෙන්නේ. කොහොමද රට දියුණු වෙන්නේ. අන්න ඒවා වළක්වා ගත්තොත් මේ සියලු දේ කරන්න පුළුවන්.

ඒ වාගේම මම කියන්න කැමැතියි. මේ ශ්‍රී ලාංකීය ජාතිය, මේ ශ්‍රී ලාංකීය ජාතිය කියලා කිව්වේ, සිංහල විතරක් නොවෙයි. මුස්ලිම්, බර්ගර්, දෙමළ හැම කෙනාම, ලංකාව ඇතුළේ ඉන්න හැම එක්කෙනාම හිතන්න ඕනෑ, අපි කල්ලි කල්ලි හැදිලා මේ එහාට මෙහාට බෝලේ පාස් කෙරුවොත් රට දියුණු වෙන්නේ නැහැ. ඒ නිසා රට දියුණු කරන කවුරු

හරි නායකයෙක් ඉන්නවා නම්, ඒ අයට උපදෙස් දීලා, ඒ අයට උදව් වෙලා, ඒ අයගේ අඩුපාඩුවක් පෙන්නලා දීලා, මේක සාර්ථක තැනකට අරන් යනවා මිසක් මේක මහින්දද? රනිලද්? මෛත්‍රීද කියලා, එහෙම නැත්නම් වෙන සේනානායක කෙනෙක්ද? එහෙම නැත්නම් පිරිබාකරන් කෙනෙක්ද අරකද මේකද නොවෙයි. කව්ද රට ඉස්සරහාට ගෙනි යන්නේ. ඒ සියලු දෙනා එක්සත් වෙලා හරි ගමන් මගක් ගත්තොත් පමණයි නියම මිලට බඩු දීලා, නියම මිලට පාරිභෝගික ද්‍රව්‍ය නිෂ්පාදනය කරලා බෙදා හැරලා අපනයන වැඩි කරලා, ඒ වාගේම රටේ ප්‍රසිද්ධියක් වන විධියට රටේ නිෂ්පාදනයක්, මේ රටේ මෙන්න ස්වාභාවික බෙහෙත් වර්ගයක් නිෂ්පාදනය කරන්න. මේක ලංකාවේ, ඒක ලෝකයක් පුරා යන්න, අන්න එවැනි වැඩ පිළිවෙළකට දායකත්වය දෙන්න. එතකොට රටත් දියුණු වෙනවා. බඩු මිලත් අඩු වෙනවා. ජනතාවට සැපසේ ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් ඇති වෙනවා. ඒකට උනන්දු වෙන්න, උත්සාහවන්ත වෙන්න කියන යෝජනාවත් සමගම, මෙතුමාගේ යෝජනාවට මම පක්ෂ වෙනවා. ඇත්ත වශයෙන්ම බඩු මිල අඩු වෙන්න ඕනෑ. ජනතාවට පහසු වෙන්න ඕනෑ. ජනතාවට ගමන් මග පහසු කරන්න තමයි ආණ්ඩු පත් කරන්නේ. වෙන වෙන වැඩ කරන්න නොවෙයි. අද විශාල වශයෙන් මන්ත්‍රීවරුන්ටත් රජය වියදම් කරනවා. පහසුකම් දෙනවා. ඒ සියලු දේ අරගෙන රට ඉස්සරහාට ගෙනි යන්න ඒ දායකත්වය අපි දෙන්න ඕනෑය කියන එක මතක් කරමින්, මම යෝජනාවට විපක්ෂ නැහැ. මෙවැනි දේවල් රජයෙන් ඉල්ලා සිටින්න ඕනෑ. ඒ ඉල්ලා සිටීමට මමත් එකඟයි කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ.භා. 11.36 ]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව බොහොම ස්තූතියි. මම ළඟ දත්ත තිබුණේ නැහැ. අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කියපු දත්ත ටික මම ලියා ගත්තා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2015 වර්ෂය වන විට ලෝක වෙළඳ පොලේ බොර තෙල් බැලරයක මිල ඩොලර් 73 යි. 2008 වන විට 160 යි. යුද්දේ තිබෙන කාලයේ. හොඳම කාලයේ. 2017 වර්ෂය වන විට 103 යි. ආයේ 2015 වර්ෂයේ 52 යි. 2016 වර්ෂයේ 33 යි. 2017 වර්ෂයේ 55 යි. 2018 වර්ෂයේ 70 යි. මේ 2018 වන විට 2008 තිබුණාට වඩා රුපියල් තුනක් අඩුයි. දැන් නම් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඩොලර් තුනක්.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඩොලර් තුනක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතකොට දැන් රුපියල් 20 ක් වැඩි වෙලා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඔබතුමා 2012, 2013 කියන්නේ නැහැ. ඒක මගහැරලා යනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මෙතුමා කිව්වේ නැහැ. මට ලියා ගන්න හම්බ වුණේ නැහැ. කිව්වේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි බැලුවා මේ කොහෙන්ද කියලා. කියවලා නොවෙයි. අහගෙන ඉඳලා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

උසාවියේ පැහැදිලි තීන්දුවක් දුන්නා. අඩු කරන්න කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් දුන්නා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

2016 වන විට ඩොලර් 33 යි. එතකොට පෙට්‍රල් ලීටරයක් එකසිය -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බැණ බැණ හිටියට හෙළ උරුමයෙන් ගොඩ යන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

පොඩ්ඩක් ඉන්න. 148 යි. දැන් එදා 117 යි. එතකොට බලන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

බොරු කියන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඇයි? මම දන්නේ නැහැ. බොරු නම් බොරු කියන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතකොට 117 ට දුන්නේ 33 ක් වෙද්දී. 160, 33 ට අඩු වෙනවා කියන්නේ කී ගුණයක් අඩු වෙලාද? හතර පස් ගුණයක් අඩු වෙලා. හතර පස් ගුණයක් අඩු වෙද්දී පෙට්‍රල්වල ගණන හතර පස් ගුණයක් ජනතාවට අඩු කළේ නැහැ නේ. ඒ ලාභය තනියම -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

2012 ඒ ගණනට අඩු වුණා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒ ලාභය රජය ගත්තේ. රජය විශාල ලාභයක් අරගන්නා ගමන් ජනතාවට දුන්නේ පුංචි ලාභයක්. අද ඩොලර් 70 යි. 70 වන විට රුපියල් 10 ක් එදාට වඩා අඩුවෙන් තිබෙන්න්. රුපියල් 10 යි අඩු කරලා තිබෙන්නේ. ගිය රජය කාලයට වඩා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ තරම් විශාල ධනස්කන්දයක් රජය ඉතුරු කර ගත්තා. මේ රටේ අපනයන වලට 48% ක් ගෙවන්නේ තෙල් ආදායමට. 48% ක් අපනයන තෙල් වලට නේ යන්නේ. ඒ තරම් ඩීසල් බැලරයක මිල අඩු වෙද්දී ඒ වාගේ ධනස්කන්දයක් ඉතුර වෙලා. ඒ සල්ලි කොහෙටද ගියේ? ජනතාවට ඒ සහන ලැබුණාද? මේ යහපාලන ආණ්ඩුව ගත්තු දවසේ සිට අද වනතුරු ඔය කියපු සහන දුන්නාද නැද්ද මම දන්නේ නැහැ. ඔය කියපු සහනාධාර ජනතාවට තේරුන්නේ නැහැ. ඇපත් නැහැ. ඒ ජනතාවට තේරුණේ නැති හින්දා තමයි ජනතාව අර මහරගම මෝටර් සයිකලයට ඡන්දය දුන්නේ. ජනතාව ඒක දන්නේ නැහැ. මෝටර් සයිකලේට ඡන්දය දීලා පැරැද්දුවේ. මෙතුමා කිව්වා, අර මධ්‍යම පාන්තිකයන්ට මොළයක් නැහැයි කියලා. මමත් කියන්නේ මොළේ නැහැයි කියලා තමයි. ඔය මධ්‍ය පන්තිකයන්ට මොළේ තිබුණා නම් ජීවිතයට අපමණ යුද්ධයක් අවසන් කරපු ඒ රට විනාශ කරලා මේ යහපාලන හංසයාට ඡන්දය දෙන්නේ නැහැ. දුන්නේ මධ්‍යම පන්තිකයෝ. ඔබතුමන්ලාට -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒ හින්දා තමයි රට බේරුණේ. හොඳට මතක තියා ගන්න. නැට්ට පිටින් ගිලිලා. විදුලි පුටුවේ

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රට බේරුවා කියනවා. ඊයේ ශිවාජිලිංගම් කියනවා, කොඩිය පහත් කළා තමයි. පුළුවන් නම් විසුරුවන්න කියලා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒ ජාතියේ මිනිස්සු ඕනෑ තරම් සිටියා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රේමදාස මහත්තයාගේ කාලයේ මට මතකයි වරදරාජා පෙරුමාල් කොඩිය ඉස්සුවා. එදා ඊ පළාත් සභාව විසුරුවා හැරියා. මේ වාගේ කොන්ද පණ නැති නායකයෝ නොවෙයි. ප්‍රේමදාස මහත්තයාට කොන්ද පණ තිබුණා. වරදරාජා පෙරුමාල් කොඩිය ඉස්සුවා. අද වන කොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කිව්වා දින පහක උද්ඝෝෂණයක් කරන කොට, පැය භාගය ගණනේ එකතු වුණාම පැය ගණන් අපතේ යනවා කියලා. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මතක තියා ගන්න. මේ අධිවේග මාර්ග මහින්ද මහත්තයා හදපු හින්දා පැය භාගේ ඒවා කීයක් ඉතුරුද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා පිටි පස්සේ සීට් එකට යන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඕනෑ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බැහැ. රෙකෝඩ් වෙන්නේ නැහැ. ඒකයි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කිව්වා. අපේ පැතිවල වැලි කියුබ් එකක් රුපියල් 4000 ට තිබුණේ. අද රුපියල් 12,000 යි. මම දන්නේ නැහැ, යහපාලනය මේකද කියලා. දැන් වැලි රුපියල් 12,000 වන විට ගලුත් ඒ හා සමානයි. සිමෙන්තිත් ඒ හා සමානයි. හාඩ්වෙයාර්කාරයෝ බුදි. මිනිස්සු බුදි. ගෙයක් හදා ගන්න බැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රජයක් පත් කරන්නේ මේකට නොවෙයි. රජයක් පත් කරන්නේ ජනතාව සුඛිත මුදිත කරා යන්නට. අද වන විට ජනතාව වලපල්ලේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ණය ගැන කථා කළා. ලෝක බැංකු වාර්තාව. මට ඒක මතකයි. එතුමා කිව්වේ නැහැ. මහින්ද මහත්තයා රජය ගන්න කොට රුපියල් බිලියන 2700 ක් ණයයි. මහින්ද මහත්තයා දෙද්දී රුපියල් බිලියන 7000 ක් ණයයි. හැබැයි, මහින්ද මහත්තයාගේ කාලයේදී ඒ රුපියල් බිලියන 2700 අපේ දළ දේශීය නිෂ්පාදනයෙන් 98% ක්. හැබැයි, මහින්ද මහත්තයා දෙද්දී රුපියල් බිලියන7000 යි. ඒක දළ දේශීය නිෂ්පාදනයෙන් 70% ක්. එහෙම නම් අපේ ආර්ථිකය උඩ ඇවිල්ලා තිබෙන්නේ. අද අපේ ණය රුපියල් බිලියන 11,000 ක්. මොනවා කරලාද? මහින්ද මහත්තයාගේ කාලයේ ඔය කියන සංවර්ධන යෝජනා කළා. අධිවේගී මාර්ග හැදුවා. සියලු පාරවල් හැදුවා. ගමේ පාරවල්වලට කොන්ක්‍රීට් දැම්මා. කාපට් දැම්මා. වරාය හැදුවා. මත්තල ගුවන් තොටුපල හැදුවා. යුද්ධය නිම කළා. මේ ඔක්කොම කරලත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 7000 යි වුණේ. හැබැයි, මහින්ද කරපුවා විවෘත කරලා රුපියල් බිලියන 3000 ක් වැඩියෙන් ණය අරන්. හැබැයි, වෙච්ච දෙයක් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහින්ද මහත්තයා ගෙදර යද්දී ඩොලර් එක රුපියල් 131 යි. අද රුපියල් 160 යි. සෑම ඩොලරයකටම රුපියල් 29 ක් වැඩියෙන් ගෙවනවා. රුපියල් ඩොලර් ලක්ෂයක බඩු පිටරටින් -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මහින්ද මහත්තයා පටන් ගන්න කොට ඩොලරය කීයද? ඒකත් කියන්න කෝ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

රුපියල් දහයයි වැඩි වුණේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එහෙම නම් මේ කළමනාකරණයේ වරද නිසා, මේ රජයේ වැරදි නිසා මේ ආර්ථික කළමනාකරණය බැරිකමට, රුපියල අව ප්‍රමාණය වීම තුළ මේ රටේ සල්ලි විශාල ප්‍රමාණයක් පිටරටට යන්න ගියා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එහෙම නම් අපි ඉල්ලා සිටින්නේ, මෙතුමා කියපු කථාව හරි. අපි කියනවා, මිනිස්සුන්ට අඩු කරන්නය කියලා. අඩු කරන්න පුළුවන්. මහින්ද ගිය දවසේ ඉඳන් අද වන කොට ඩීසල් බැලරයේ මිල අඩුයි. අඩු කරන්න පුළුවන්කම තිබෙද්දී අඩු කරන්න බැහැ. අඩු කරන්නේ නැහැ. අපි කියනවා, අඩු කරන්නය කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලක් විජය බලාගාරය අද තිබෙනවා. ලක් විජය බලාගාරය මහින්ද හැදුවේ නැත්නම් අද අපට කරන්ට් එක නැහැ. එදා වැඩි ගණනට, තෙල් බැලරය ඩොලර් 160 ට අරගෙන තමයි මහින්දලා ඩීසල් බලාගාරවලින් කරන්ට් එක දුන්නේ. අද ඒවා ඕනෑ නැහැ. අද ලක් විජය බලාගාරය තිබෙනවා. ඒක හැදුවේ නැත්නම් මේ ආණ්ඩුව පසුගිය පැවිල්ලට ඉවරටම ඉවරයි. අර අපේ ආගමේ කියනවා,

*දේවෝ වස්සතු කාලේන - සස්ස සම්පත්ති හේතුව*
*පීතෝ භවතු ලෝකෝච - රාජා භවතු ධම්මිකෝ*

සාදු. සාදු. සාදු. රජ හොඳ නම් තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වෙලාවට කලාවට වහින්නේ. මේ අවුරුදු තුනට ගං වතුර කීයක් ආවාද? නියඟ කීයක් ආවාද?

[ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා ]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කාලකණ්ණි ආණ්ඩුව තව ගියොත් මේ රට අවසානයි. මතක තියා ගන්න. තව එකක් කියනවා. මේ වැඩ බැරි ආණ්ඩුවට 2015 මහින්ද මහත්තයා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇයි සුනාමි ආවේ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මහින්ද මහත්තයා කීයක් හරි සොයා ගත්තේ සුනාමියෙන් තමයි. දෙයියනේ කියලා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උතුරේ මහ ඇමති 2015 දී වෙල්ල මුල්ලෙ වයික්කාල්වලට ගිහිල්ලා ඒ විරු සමරුව -

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

හෙල්පින් හම්බන්තොට.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, 10 දෙනයි හිටියේ. අද දහස් ගණනක් හිටියා. ඇයි? මේ කාලකණ්නි කොන්ද පණ නැති ආණ්ඩුවේ බල්ලොත් බුරනවා. ඒ නිසා කරුණාකරලා මේ රටේ ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදීව හරි ආණ්ඩුවක් තුළ ඡන්දයක් තියලා මේ සූටින් මාටින් දෙන්නාට ගෙදර යන්න කියලා යෝජනා කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.46 ]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද රටේ ආර්ථිකය ගැන කථා කරන කොට නිකම් හිතට එන්නේ අර කොත්තු රොටි, අච්චාරු වාගේ හැඟීමක්. මොකද, මම එහෙම කියන්නේ, මේ විකෘතිය පෙරමුණු කිහිපයකින් ඉදිරියට ඇවිල්ලා, ආණ්ඩුව අභිමුවේ තිබෙන වියවුල බවට පත් වෙලා තිබෙනවා. අපේ මන්ත්‍රීතුමා කියපු කථාවේ පොඩි සත්‍යයක් තිබෙනවා. මේක අවුල් වෙන්නේ මේ යහපාලනයේ ප්‍රතිඵලයක් හැටියට ද කියලා මට හිතුණා, ගිය සතියේ කැබිනට් මණ්ඩලය රැස් වුණාට පස්සේ ජනාධිපතිවරයා පැවැත්වූවා යැයි කියන සාකච්ඡාවක තොරතුරු කියවන කොට. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගියවර අමාත්‍ය මණ්ඩල හමුවට අගමැතිතුමා හිටියේ නැහැ. හැබැයි, මේකේදි කැබිනට් පත්‍රිකා කිහිපයක් ගැන අවධානය යොමු වෙලා තිබෙනවා. ඒකේ මගේ හිතට ආර්ථිකමය වශයෙන් වැදගත් කියලා දැණුනු කරුණු දෙක තුනක් මම කියන්නම්. එකක්, කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත වෙනුවෙන් ණය පහසුකම් ලබා දීම. දෙවැනි එක, ආර්ථික ක්ෂේත්‍රය නවීකරණය කිරීමේ අරමුණින් ලෝක බැංකුවේ අන්තර් ජාතික සංවර්ධන ඒජන්සියෙන් ඩොලර් ලක්ෂ 750 ක ණයක් ලබා ගැනීම. මෙවැනි කාරණා කිහිපයක්. මේ කැබිනට් හමුව ඉවර වුණාට පස්සේ ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අමාත්‍යවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් එක්ක ජනාධිපති ලේකම් කාර්යාලයේදී විශේෂ හමුවක් පැවැත් වූවා. ආර්ථික කළමනාකරණය සම්බන්ධයෙන් වන කැබිනට් කමිටුවේ යෝජනා සහ නිර්දේශ තම මෙහෙයවීම යටතේ ඉහළ මණ්ඩලයකින් වැඩිදුරටත් අධ්‍යයනය කර අවශ්‍ය නිර්දේශ ලබා දීමට කටයුතු කරනවා කියලා ජනාධිපතිවරයා මේකේදී කිව්වා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙන්න මෙතැන තමයි මේ රටේ යහපාලනයත් එක්ක බැඳුනු ගැටළුවක් නිර්මාණය වෙලා තිබෙන එක පෙරමුණක් වන්නේ. එක පැත්තකින් එක්සත් ජාතික පක්ෂයේ අග්‍රාමාත්‍යවරයා ඇතුළු අමාත්‍ය මණ්ඩලය විසින් යෝජනා කරනු ලබන හෝ ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරනු ලබන කිසියම් ආර්ථිකමය වශයෙන් වැදගත්කමක් උසුලන ව්‍යාපෘති අකර්මන්‍ය කිරීම, අඩාල කිරීම, - අපි කියනවා, කිසිවකින් සතුටු වෙන්න බැරි, සාමාන්‍යයෙන් මේ රටේ ජනතාව හැටියට අපට සතුටු වෙන්න බැරි උත්සාහයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මැති ඇමතිවරුන් තුළ තිබෙනවා. දැන් රටේ ජනාධිපතිවරයා - දැන් ඔය කියන ආර්ථික කමිටුවේත් ආර්ථිකය සම්බන්ධයෙන් දැවැන්ත කාර්යභාරයක් උසුලන අග්‍රාමාත්‍යවරයාත් ඉන්නවා. ඒක නොවෙයි මේ කියන්න හදන්නේ. රටේ ආර්ථිකමය වශයෙන් තීරණ ගන්න ජනාධිපති කමිටුවකට, අර මූල්‍ය බලය හිමි පාර්ලිමේන්තුවේ බලය දරන එක්සත් ජාතික පක්ෂයෙන් එන සියලු යෝජනා

අඩපණ කරන්න පුළුවන්. ජනාධිපතිවරයාට කරන්න ක්‍රමය දෙකක් තිබෙනවා. එකක් තමයි, එක්කෝ ජනාධිපතිවරයාට කියනවා. මොකක්ද දැන් දාපු මේ කමිටුව, ඉහළ ආර්ථික කමිටුව. කරන්න දෙයක් නැහැ. අපි ඉහළ ආර්ථික කමිටුව විසින් තීරණයක් ගත්තා. මේක නතර කරනවා කියලා නතර කරන්න පුළුවන්. අනෙක් පැත්තෙන් ජනාධිපතිවරයාට කියන්න පුළුවන්. අයියෝ මම පත්තරෙන් දැක්කේ. පත්තරෙන් කියෙව්වේ. මාධ්‍යයේ යන කොටයි දැක්කේ කියලා මේක නතර කරන්න පුළුවන්. දැන් රටේ ආර්ථික අර්බුදයක් තිබෙනවා කියලා මම කියන්නේ, අන්න ඒ නිසයි. මේක එක පෙරමුණක. හැබැයි, මේ ඊළඟ පෙරමුණේ තිබෙන දැවැන්ත දේශපාලන අභියෝගයත් එක්ක බැඳුණු, අපට දැනෙන නිකම් අර පොඩි පොඩි මිරිස් කෑලි, ලූණු කෑලි වාගේ කෑල්ලක් තමයි දැන් මේ මට තේරෙන විධියට - මේකට විවේචනයක් ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට තිබෙන්න පුළුවන්. මොකද, එතුමා වාමාංශික දර්ශනයක් අදහන කෙනෙකු හැටියට මේ සියල්ල ඔක්කොම මිත්‍යාවක පැටලැව්ලා කියලා පැහැදිලි කරලා, මේකට වෙන අර්ථ කථනයක් දෙන්න පුළුවන්. හැබැයි, මට දැනෙන විධියට මේක එතුමාගේ යෝජනාව ඇතුළේ තිබෙන්නේ, ඉන්ධන මිල වාගේ එකක් ගත්තාම ජනප්‍රිය දේශපාලන කතන්දරයත් එක්ක බැඳුනු එකක්. හැබැයි, ඒක තීරණාත්මකයි. ඇයි තීරණාත්මකයි කියන්නේ? මේකෙන් ආණ්ඩු පෙරළෙන්න පුළුවන්. මේ යහපාලනය සුණු විසුණු වෙන්න පුළුවන්. එක්සත් ජාතික පක්ෂය පන්නලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හරි, පොහොට්ටුව හරි, මහින්ද රාජපක්ෂ මහත්තයාගේ හරි මූලික වී ආණ්ඩුවක් බිහි වීමට හේතු වෙන්න පුළුවන්. ඒ අතින් බැලුවාම මේ යෝජනාවේ දැවැන්ත දේශපාලන හරයක් තිබෙන බව නම් පැහැදිලියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2015 දී මේ ආණ්ඩුව අයවැයෙන් රාජ්‍ය සේවයේ වැටුප් රු. 10,000 කින් වැඩි කළා. මම හරි නේද? ඒ වාගේම තෙල් මිල අඩු කරන්නත්, ඒ වාගේම ගෑස් මිල අඩු කරන්නත් ආණ්ඩුව දැවැන්ත තීරණයක් ගත්තා. අපි දන්නවා. ඒ වෙලාවේ ආණ්ඩුවේ දැවැන්ත අභියෝගයක්ව මේක තිබුණා. මොකද, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයකින්, අර ඩොලර් 20 කට වාගේ මිලකට අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, පෙට්‍රල් අඩු වුණු වෙලාවේදී යුද්ධය අවසන් කළා. යුද්ධයට වැය කරපු සියලු මුදල් මේ රටේ ජනතාවගේ ජීවිත සුඛිත මුදිත කරන්න වැය කරනවාය කියලා කියපු රාජපක්ෂලා ඒක නොකරපු වෙලාවකදී, අධිකරණ තීන්දුවක් තිබුණු වෙලාවකදී, ජනතාව අසරණ වුණු වෙලාවකදී, එහෙම පාරට බැහැලා මේ රටේ විප්ලව කළේ නැහැ, පෙට්‍රල් මිල අඩු කරපල්ලා කියලා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

පාරවල් හැදුවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හැදුවා. භාගයක් සාක්කුවට දා ගත්තා. සාක්කුවේ දා ගත්තු ටික කියන්න කෝ ගරු මන්ත්‍රීතුමා. ඇයි ඒවා කියන්නේ නැත්තේ? ඒක තමයි දැන් මේ පාරවල්වල යන්න බැරි. අන්න රතු නිවේදනයක් නිකුත් කළා, අධිවේගී මාර්ගයේ යන අය ආරක්ෂාකාරී වෙන්න. අධිවේගී මාර්ගය ෂුවර් නැහැයි කියලා. අන්න හදපුවා. ඒවා භාගයක් සාක්කුවේ දා ගත්තා. මේකේ ලේන් කීයක් අයින් කළාද? ඒකෙත් සල්ලි ටික සාක්කුවේ දා ගත්තා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මේක ඉතාම අභියෝගයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා. රජයේ වියදම වැඩියි. හැබැයි, ආදායම අඩුයි. මෙන්න මෙතැන තමයි රජයට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය. මොකක්ද මේකට හේතුව. රජය කිව්වා, අපි දෙනවා රැකියා දස ලක්ෂයක් කියලා. එහෙම නම් මේ අවුරුදු පහට අඩුම ගණනේ දවසට රැකියා පන්සියයක්, හයසීයක් දෙන්න ඕනෑ. එහෙම නැහැ. එහෙම රැකියා උත්පාදනය වුණේ නැහැ. ඇයි? අපි නිෂ්පාදන ආර්ථිකයකට ගියේ නැහැ. අපට එහෙම ගැටළුවක් තිබෙනවා. රජය කොපමණ කිව්වත්, රජයේ ඉන්න ඇමතිවරු කොපමණ කිව්වත් අපට විදේශ ආයෝජන නැහැ. මෙන්න මෙතැන ගැටළුවක් තිබෙනවා. මම මේ රජය විවේචනය කරනවා නොවෙයි. පැහැදිලිව මම මේ කියන්නේ හැබැයි, මේක රට ඇතුළේ තිබෙන ප්‍රශ්නයක්. ඒ නිසා මම කියන්නේ රජයේ වියදම වැඩියි. ආදායම අඩුයි. එහෙම නම් අපි ආදායම වැඩි කර ගන්නේ කොහොමද කියන ප්‍රශ්නය තිබෙනවා. අපට විදේශ විනිමය එන්නේ නැහැ. එහෙම නම් එවැනි තත්ත්වයක් යටතේ අපි මොකද කරන්නේ. අපි දැක්කා, භාණ්ඩාගාර බිල්පත්,

[ගරු සුසිල් කිඳෙල්පිටිය ]

භාණ්ඩාගාර ගනුදෙනුවෙන් අපට වුණු පාඩුව. ඒ නිසා ඒවා අපට සැලසුම් කරන්න බැරි වෙලා තිබෙනවා. 2015 දී මේ ආණ්ඩුව සැලසුම් කරපු බොහෝ සැලසුම් කඩා වැටිලා තිබෙනවා. එහෙම තත්ත්වයක් තුළ අපි කොහොමද කඩිනමින් ආයෝජන වැඩි කර ගන්නේ. අපි කොහොමද කඩිනමින් කර්මාන්ත ආරම්භ කරලා නිෂ්පාදන කර්මාන්තවලට යන්නේ? අපි කොහොමද කඩිනමින් රැකියා උත්පාදනය කරන්නේ? මෙන්න මේ අභියෝගයට මුහුණ දීලා තිබෙන වෙලාවක අපේ ණය බරට මොකක්ද වෙන්නේ? 2010 දී මුළු රාජ්‍ය ණය ප්‍රමාණයේ අගය රුපියල් බිලියන 4590 යි. මේක පිළිවෙළින් වැඩි වෙලා, වැඩි වෙලා ඇවිල්ලා 2010 දී ට අපේ ණය ප්‍රමාණයේ අගය රුපියල් බිලියන 4590 ඉඳලා මේ වන කොට බිලියන 9429 ට නැගලා තිබෙනවා. වසරින් වසර අඩුම ගණනේ බිලියන 1000 කට වඩා මේක ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මෙතැන තමයි ඊළඟ අභියෝගය තිබෙන්නේ. මොකක්ද? දැන් අන්තර් ජාතිකව රජයට බලපෑමක් එල්ල වෙලා තිබෙනවා. මුදල් ණයට ගන්න කියලා. දැන් ආණ්ඩුව මුදල් ණයට ගත්තොත් මොකක්ද වෙන්නේ? ආණ්ඩුව මුදල් ණයට ගත්තොත් රුපියලට මොකක්ද වෙන්නේ කියලා මහ බැංකුව අහනවා. එහෙම නම් රුපියල අව ප්‍රමාණය වීම වැළැක්වීමත්, ණය නොගෙන සිටීමත්, ණය බර පියවීමත් අත්‍යවශ්‍ය කාරණයක්. මෙන්න මේක තමයි අපේ තිබෙන අර්බුදය.

මේ අභියෝගයට කොහොමද මුහුණ දෙන්නේ? මේ අභියෝගයට මුහුණ දෙන්න යහපාලන ආණ්ඩුවේ මේ දෙපැත්ත අදින වැඩෙන් පුළුවන් වෙනවාද? ජනාධිපතිවරයා එක පැත්තකින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇමතිවරුයි, මන්ත්‍රීවරුයි ටිකයි එකතු කර ගෙන ආණ්ඩුවේ ඒ සැලසුම් සහගත ක්‍රියාවලිය කඩාකප්පල් කරන්න හදනවාය කියලා චෝදනාවක් තිබෙනවා. අනෙක් පැත්තෙන්, ආණ්ඩුව පැත්තෙන් ගනු ලැබූ සියලුම ක්‍රියාමාර්ග සහ පියවරයන් අසාර්ථක වෙමින් පවතිනවා. එහෙම නම් කොහොමද මේක නියම මාර්ගයට ගන්නේ? හැබැයි, අවසානයේ මොකක්ද වෙලා තිබෙන්නේ. (බාධා කිරීම්) මම පිළිගන්නවා. භාණ්ඩ මිල ඉහළ යාමට සාපේක්ෂව ජනතාවගේ ආදායම පසුගිය වසර හතර ඇතුළත ඉහළ ගියේ නැහැ. 2015 න් පස්සේ එහෙම ඉහළ ගියේ නැහැ. පඩි වැඩිවීමක් සිද්ධ වුණාට. සීඝ්‍රයෙන් බඩු මිල ඉහළ ගියා. එහෙම නම් ජනතාව මත අනවශ්‍ය බරක් පටවන්නේ නැතිව මේක කරන්නේ කොහොමද කියන අභියෝගයයි අද ආර්ථිකමය වශයෙන් තිබෙන්නේ. ඒ නිසා රජය නම්‍යශීලී වෙන්න ඕනෑ. එක පැත්තකින් ණය දෙන ආයතනවල බලපෑමට. ජාත්‍යන්තර ආයතනවල බලපෑමට ලක් වෙනවා. ණයට ගන්න කියනවා. අනෙක් පැත්තෙන් ආණ්ඩුවට ජනතාවගේ බඩු මිල නිසා ලොකු දේශපාලන පීඩනයකුත් ජනිත වෙලා තිබෙනවා.

ඒ වාගේම මේ යහපාලන ආණ්ඩුව නිසා මම කිව්වා, අනෙක් පෙරමුණ තමයි ජනාධිපතිවරයා ඇතුළු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පෙරමුණ. මෙන්න මේ අභියෝග ටික පසු කරලා කොහොමද ආර්ථික ඉලක්ක ජය ගන්න යන්නේ? මේකෙන් අවසාන සම්ප්‍රයුක්ත අගය ගත්තත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සම්ප්‍රයුක්තයත් ඇවිල්ලා දේශපාලනමය වශයෙන් ආණ්ඩුව පිරිහීමට ලක් වීම පමණයි සිදු වන්නේ. ඒ නිසා මේ ඉහළ යන භාණ්ඩ හා සේවා අභියෝගය හමුවේ ජනතාවට සහන සැලසීමත්, නිසි කළමනාකරණයක් නොමැතිව රජයේ ආයතනවල කෝටි ප්‍රකෝටි ගණන් නාස්ති වීමත්, ඒ වාගේම ඊටත් වඩා ප්‍රධානම ප්‍රශ්නය තමයි ජනතාවට එදිනෙදා ජීවත් වෙන්න අවශ්‍ය මූලික දේවල් ටික නොලැබී යෑමත්. මේවා ආණ්ඩුව පැත්තෙන් වෙන්න ඕනෑ දේවල්. එදිනෙදා හාල් පිටි සීනි කතන්දරය නොවෙයි මම මේ කියන්නේ. එහෙම නම් මේ ටික ඇතුළේ මේක කළමනාකරණය කර ගෙන ඉස්සරහාට යෑම කියන අභියෝගයයි රට හමුවේ තිබෙන්නේ. හැබැයි, මේ තෙල් ප්‍රශ්නයක් තමයි. තෙල් ප්‍රශ්නය හරහා ගොඩ නැංවෙන ආර්ථික අර්බුදය තවත් තීව්‍ර වෙනවා. ඒකෙන් වෙන්නේ මොකක්ද? රටේ ආර්ථිකය අගාධයට වැටෙන්න ආසන්න වීමයි. ප්‍රාදේශීය සභා ඡන්දයක් තිබ්බා. ඒකත් ආණ්ඩුවට අවාසි සහගතයි. මේ විකෘතිය තමයි අපට ආර්ථිකය ඇතුළේ පේන්න තිබෙන්නේ. මේක කොහොමද ජය ගන්නේ කියන ප්‍රශ්නය තමයි තිබෙන්නේ. ඒ නිසා මේ ඉන්ධන මිල වැඩි වීම කියන තැනට මේක ලඝු කර ගන්න බැහැයි කියන එකයි මගේ අදහස. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා මීට වඩා පුළුල් ප්‍රතිපත්තිමය තීරණවලට ආණ්ඩුව යන්න ඕනෑය කියන එක මතු කර පෙන්වමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.59 ]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම සතුටු වෙනවා, අපේ ජනතා විමුක්ති පෙරමුණේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමාට පොඩ්ඩක් තේරිලා තිබෙනවා අද රටට වෙලා තිබෙන අභේනිය සම්බන්ධව. 1971 දී ආරම්භ කරපු ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ලෙන් මේ රටේ තිබුණු ආර්ථිකය සම්පූර්ණයෙන් විනාශ කරලා දාන්න, යුද්ධ කරන්න, මිනිස්සුන්ගේ දේපළ හානි කරන්න පටන් ගත්ත මිනිස්සු තමයි දැන් මේ මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව පරාජය කරලා, යහපාලන ආණ්ඩුව ගෙනැල්ලා අද මේ රටට තෙල් මිල වැඩියි, භූමිතෙල් මිල වැඩියි, ජීවත් වෙන්න බැහැ. භාණ්ඩ වැඩියි කියන්නේ.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

2004 දී මහින්ද දිනෙව්වේ කවුද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ රටේ මිනිස්සු 60,000/- ක් මරලා දාලා තිබෙන, ජනතා විමුක්ති පෙරමුණේ තරුණ තරුණියෝ මරවලා රට විනාශ කරපු මිනිස්සු තමයි අද මේ කියන්නේ. ඒ අතරේම තව ආණ්ඩුවට කත් අදින, ආණ්ඩුවේ පක්කිලි සර්විස් කරන, යහපාලන ආණ්ඩුවට ඡන්දය ඉල්ලපු, ඊට හවුල් වුණු වම්පික රණවකගේ කේවට්ටයා කියනවා, මේකේ ඉඳගෙන, මේ යහපාලන ආණ්ඩුවේ කේවට්ටයා කියනවා මේක වැඩි නොකර රට ගෙනියන්න බැහැයි කියලා. ඇයි? කේවට්ටයාට මතක නැහැ, මහ බැංකුවේ හිටපු අර්ජුන මහේන්ද්‍රන් ඒ මහජනතාවගේ සල්ලි ටිකට ගහලා, බදු සල්ලි ටික, අපෙන් ගන්න සියලුම බදු වර්ග මහ බැංකුවට එක්කහු වෙලා -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එහෙම අපහාස කරලා කථා කරන එක අයින් කරන්න. අපිත් මන්ත්‍රීවරු නේ? ඔබතුමා ඒකට නිවේදනයක් නිකුත් කරන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඉල්ලා අස් කර ගන්න කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නම කිව්වේ නැහැ. කේවට්ටයා කියලා නමක් කිව්වේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

රු. 160 දක්වා වැඩි කරපු එක. මම කිව්වේ, කේවට්ටයා රජ කාලේ හිටියේ. දැන් කේවට්ටයෝ නැහැ. රාජ්‍ය සමයේ තමයි රජ්ජුරුවන්ට පාලනය කරන කොට කේවට්ටයෝ, විකටකාරයෝ හිටියා. එතකොට මේ විකටකාරයෝ තමයි ජනතා විමුක්ති පෙරමුණ. කේවට්ටයෝ තමයි මේකේ ඉන්න ජාතික හෙළ උරුමය. මම කිව්වේ නැහැ මෙතුමා කියලා. හෙළ උරුමය. ඒකේ ඉන්නේ. එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කිපෙන්න එපා. අඬන්න එපා. මේවා අහගෙන ඉන්න. වෙලා තිබෙන දේ. අද මේ බදුවලින්, මේ භූමිතෙල් ටිකෙන්, පෙට්රල් ටිකෙන්, මේ තෙල් ටිකෙන් ගහනවා විතරක් නොවෙයි. අද මේ සභාවේ ඉන්න පොඩි කෙනාගේ තාත්තා, අම්මා, ආච්චි, සීයා දාපු ඒ තිබෙන ගිණුමේ, ඉතිරි කිරීමේ ගිණුමෙන් 1% ක් ගහන ආණ්ඩුවක් මේක. අවුරුදු ගණනක් මේ රටට සේවය කරලා විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුපට බදු ගහන ආණ්ඩුවක් මේක. ඒ වාගේම මේ ඔක්කොම කට්ටිය මොකද දැන් කථා කරන්නේ. මේ බඩු මිල අඩු කළේ මොනවාටද? මේ බඩු මිල අඩු කළේ ඊළඟ මාසේ එනවා IMF loan එක. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලබා ගන්න තිබෙන ණය දෙන්නේ නැහැ. ණය දෙන්නේ නැති කොට මේ ඉන්න රාජ්‍ය සේවකයින්ට පඩි ගෙවන්න විධියක් නැහැ. පළාත් පාලන ආයතන කර ගන්න විධියක් නැහැ. ඒ නිසා තමයි මේ බඩු ටික ඔක්කොම වැඩි කරලා, තෙල් මිල වැඩි කරලා, ඒ විතරක් නොවෙයි. පනත් තුනක් අලුතෙන් ගේනවා. මේකේ තිබෙනවා, කොල්ලෝ කොල්ලෝ බඳින පනත. මෙන්න අත උස්සනවා. කවුද? මේ කේවට්ටයන්ගේ පක්ෂය. පාර්ලිමේන්තුවේ අත උස්සනවා. ජිනීවා නුවර මානව හිමිකම් කොමිසමේ දාලා තිබෙන යෝජනාවට, IMF යෝජනාවලට දමනවා රටේ කොල්ලෝ කොල්ලෝ බන්දන පනත ගේන්න කියලා. එතකොට දැන් මේගොල්ලෝ මේ ඔක්කොම එක්ක

[ගරු උපාලි කොඩිකාර ]

දින 100 පොරොන්දු පත්‍රිකාව. මෙන්න බලන්න. 12 යටතේ තිබෙනවා, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය 10 ක මිල අඩු කරනු ලැබේ. ඊට පස්සේ 15 කියනවා, ඉන්ධන බදු මුදල් මුළුමනින්ම අඩු කරනවා. එතකොට ජනතා විමුක්ති පෙරමුණට අපේ නිශාන්ත මන්ත්‍රීතුමා කිව්වා. ඒක ඉවත් කරනවාද? එතකොට නිශාන්ත වර්ණසිංහ මන්ත්‍රීතුමා, අපේ පළාත් සභාවේ. එතකොට එතුමාගෙන් ඇහුවා, තෙල්වලට ගහන බදු මිල 44.50 යි. ගහන Tax එක. එතකොට මේවා තිබෙනවා, දින 100. කෝ දැන් මේවා. දින 100 පහු වෙලා. එතකොට දැන් මේ කියපු දින 100 වැඩ සටහන. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ රු. 350 ට පොහොර ටික දීලා, වී අස්වැන්න රටේ වැඩි කරලා, මේගොල්ලෝ අපි හදපු එයාපෝට් එකට වී ටික දාලා, බියර් කොම්පැනියට වී ටික විකුණලා, රවී කරුණානායක කොමිස් එක ගහලා, ගෙවල් අරගෙන, අර මහ බැංකුවේ සල්ලිවලින් තමන්ගේ නෝනාට ගෙවල් අරගෙන දීලා, ඇමති මණ්ඩලයට කාර් ගෙනැත් දීලා, මේවා නිසා තමයි මේ රටට කෙළ වුණේ. මේ ගහපු සල්ලි නිසා තමයි කෙළ වුණේ.

ඒ වාගේම 20 වන යෝජනාව හැටියට තිබෙනවා, ගොවි හා ධීවර ජනතාවට විශ්‍රාම වැටුප් දෙන බව. ගොවියන්ට, ධීවරයන්ට විශ්‍රාම වැටුප්. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ගොවියාගේ තිබෙන විශ්‍රාම වැටුපත් කපලා, ධීවරයාට මුදල් - මුහුදට යන්න බැහැ. පෙට්‍රල් ටික, භූමිතෙල් ටික වැඩි කරලා. ධීවරයාට මාලු ටික අල්ලා ගන්න බැහැ. මෙන්න කේවට්ටයන්ගේ ආණ්ඩුව. මෙන්න වෙලා තිබෙන දේ. දැන් මෙන්න යහපාලන ආණ්ඩුවේ මේ කරුමෙට කර ගහපු මිනිස්සු. මේවාට කවදාහරි වන්දි ගෙවන්න වෙනවා. නිජ බිම බඩ ගාගෙන, හිඟා කා ගෙන යන තත්ත්වයට වැටෙනවා මේ නිසා. එහෙම තේරුණු අය තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බුද්ධිමත් 16 දෙනෙක් කඩා ගෙන ඇවිල්ලා අද විපක්ෂයේ වාඩි වෙලා, අද ආණ්ඩුව කරපු වැරදි විවේචනය කරන්න පටන් අරගෙන තිබෙනවා. අද මේ ඉන්න අයට මේවා සියල්ලක්ම අමතක වෙලා තිබෙන්නේ. දැන් ඊට පස්සේ බලන්න. දැන් මේ තෙල් මිල, පෙට්රල් මිල ඔක්කොම වැඩි කරන ගමන්, අද අපේ දේශීය ගොවියා වවපු අල ටික. මෙන්න බලන්න. අල ලූණු බද්දෙන් නිදහස්. දැන් අපේ දඹුල්ල දිස්ත්‍රික්කයේ අල වවපු ගොවියා, බදුල්ලේ, බණ්ඩාරවෙල අල ගොවියා, නුවර එළියේ හිටපු අල ගොවියාට අල ටික විකුණා ගන්න බැරිව, කන්න නැතිව, අද අසරණ වෙලා. ගොවි ණය ටික ගෙවා ගන්න බැහැ. ළූණු ගොවියාටත් එහෙමයි. අද යහපාලන ආණ්ඩුවේ කැබිනට් ඇමතිවරුන්ගේ ගෝලයෝ ටික එකතු කරලා, මේ බද්ද නිදහස් කරලා මේ අල ළූනු බද්ද නිදහස් කරලා, අල ළූණු ගෙනැල්ලා අපේ ගොවියාට කෙළලා දාලා තිබෙනවා. මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව මේ රටේ අවුරුදු 30 ක් තිබුණු යුද්ධය අවසන් කරලා උපාධිධාරීන් 156,000 කට රැකියා දීලා, කම්කරු සහායකලා 44,000 කට රස්සාවල් දීලා, ඒ වාගේම කාර්යාල සහායක අයට 94,000 ක් රස්සාවල් දුන්නා. ලක්ෂ 10 ක් දෙන්නම් කියලා පටන් ගත්ත ආණ්ඩුව. අපේ කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ෆොක්ස් වැගන් කොම්පැනිය. එතකොට හොරණ ගහපු ටයර් කොම්පැනිය. ෆොක්ස් වැගන් කොම්පැනිය කුලියාපිටියේ ගැහුවා තියා ෆොක්ස් වැගන් කොම්පැනියේ එක ඇණයක් ගේන්න බැරි වුණු ආණ්ඩුව. අර දස ලක්ෂයේ වැඩ පිළිවෙළ. ඔන්න කරපු හැටි. මෙන්න මේ නිසා තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේත් අපේ පොදු ජන පෙරමුණෙන් අස් වෙලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ගියාට. නැවත අස් වෙලා තමුන්නාන්සේත් නැවත පොදු ජන පෙරමුණට එන්නය කියලා අපි ආරාධනා කරනවා. මොකද, තමුන්නාන්සේ හිතුවේ නැහැ මෙපමණ දුර. මේ විධියට පොහොට්ටුව දිනයි කියලා. දැන් පිපෙන්නේ නැහැයි කියපු පොහොට්ටුව පිපිලා. දැන් ජනතා විමුක්ති පෙරමුණ බලනවා, 39 ක් මන්ත්‍රීවරු දැන් හයට බැහැලා. දැන් ජනතා විමුක්ති පෙරමුණ අඬනවා. මේගොල්ලෝ මහින්ද රාජපක්ෂව පරාය කරලා, මෛත්‍රීපාල සිරිසේනගේ ආණ්ඩුව ගෙනැල්ලා, මේක ජයග්‍රහණය කරලා, මේ රට කාලා, රට බෙදන ව්‍යවස්ථාව ගෙනැල්ලා මේක ඉවර කරන්න කටයුතු කළා කියලා මතක් කරමින්, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.08 ]

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවලා මේ යෝජනාව ඉදිරිපත් කළා. එතුමා ගොඩක්ම මේ රටේ තිබෙන

දරිද්‍රතාවය ගැන, අපහසුතාවය ගැන මේ යෝජනාව හරහා ඉදිරිපත් කළා. මේ රීති අත්හිටුවලා ගෙනාපු නිසා ඒක සම්බන්ධව දත්ත සොයා ගැනීමේ අපහසුතාවයක් තිබෙනවා. නමුත් අපට සාමාන්‍ය ප්‍රායෝගික දැනීමත් එක්ක යමක් කථා කරන්න පුළුවන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලක්ෂ්මන් නිපුන ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ මූලික හරය වුණේ, ඉන්ධන මිල වැඩි වුණා. රටේ භාණ්ඩ මිල වැඩි වෙලා තිබෙනවා. අපි උද්ඝෝෂණයකට යනවා. ඊට ඉස්සෙල්ලා මේක බස්නාහිර පළාත් සභාවේ යෝජනා කරලා තමයි යන්න ලැහැස්ති වෙන්නේ කියන එක තමයි අද මාතෘකාවේ තේමාව වුණේ. මම හිතන්නේ අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා බොහොම සරළව, බොහොම දක්ෂව එතුමා දත්ත සමඟ වර්ෂයක් පාසා ඉන්ධන මිල ගැන වැඩි වීම, අඩු වීම ඒක කොහොමද එහා මෙහා වුණේ කියලා ප්‍රකාශ කළා.

ඒ වාගේම සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කථා කරලා කිව්වා, මේ රට තිබුණේ කොහොමද? කොහොමද වුණේ කියන එක. මම දකිනවා, මේ යෝජනා එක්ක පැත්තකින් බලන කොට වාමාංශික පැත්තෙන්, වාමාංශික මත දරන කොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමා හරි. මධ්‍යස්ථව ඉඳගෙන බලන කොට - අපි දැන් මධ්‍යස්ථයි නේ? මොකද, අපට හැකි වුණා එක්සත් ජාතික පක්ෂය වශයෙන් තවත් පක්ෂයක් එක්ක එක්කහු වෙලා ආණ්ඩුවක් කර ගෙන යන්න. එතකොට අපි මධ්‍යස්ථයි. ඒකේ ප්‍රතිඵලයක් තමයි මේ රටේ යම්කිසි වැරැද්දක් වෙනවා නම්, අඩුපාඩුවක් වෙනවා නම්, එකට නැගිටලා, එකට හඬක් නැගීමේ හැකියාවක් තිබීම. මේක ඒකාධිපති වුණා නම්, එක පක්ෂයක් වුණා නම් ඒවා යමක් වුණා නම් වහගෙන යෑමේ හැකියාව තිබෙනවා. මම උදාහරණයක් වශයෙන් මේක සරළව කථා කළොත් දැන් බැඳුම්කරය ගැන මේ රටම දැන ගත්තා. නඩුවක් යනවා. උසාවි ගියා. විශාල අර්බුදකාරී ප්‍රශ්නයක් මේ රටට expose වුණා. ඒ කියන්නේ රටේ උදවිය දැනුවත් වුණා. හැබැයි, එක යුගයක් මේ රටේ බැඳුම්කරයට වඩා දැරුණු සිද්ධීන් මේ රටේ සිද්ධ වුණා. හේජින් ගිවිසුම කියලා එකක් මේ රටේ ඇති වුණා. මොකක්ද වුණේ? නඩුත් නැහැ. බඩුත් නැහැ. එහෙම්මම යටපත් වුණා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඉතින් අල්ලන්න එපැයි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අහගෙන ඉන්න කෝ? ගරු මන්ත්‍රීතුමා, අහගෙන ඉඳලා කථා කරන්න කෝ. මම බොහොම සාධාරණව කථා කරන්නේ. මම කාටවත් ඇඟිල්ල දික් කළේ නැහැ. මම මේකේ හොඳ නරක මේ කියන්න උත්සාහ ගන්නේ. හේජින් ගිවිසුම කියලා ගිවිසුමක් ඉදිරිපත් වුණා. ඒක ස්ටර්ලින් පවුම් එක්ක තමයි ඒ ඩීල් එක වුණේ. එංගලන්තයේ, බ්‍රිතාන්‍යයේ ගනුදෙනු කරන මුදල් ඒකකය එක්ක තමයි මේක සංසරණය වුණේ. මේ ගැන මොකක්හරි ප්‍රශ්නයක් තිබෙන්න ඇති නේ. ඊළඟට Greek Bond ගිවිසුම. මේ රටේ අහිංසක ජනතාවගේ සල්ලි ග්‍රීසියේ Bond එකක් හරහා මේක ස්ථාපිත කරලා මේ වාගේ ප්‍රශ්නයක් ඇති වුණා. අපි සන්තෝෂ වෙන්න ඕනෑ. මේ රටේ ජීවත් වන පුරවැසියෝ වශයෙන් අපි යහපාලන ආණ්ඩුවක් හදලා, ඒකේදී ප්‍රශ්න ඇති වුණාම ඇදලා දාන්න හැකියාව තිබුණා. ඔබතුමන්ලාට ඒ වැරැද්ද පෙන්වලා කථා කරන්න, කෑ ගහන්න අවස්ථාව ලැබුණා. ඒකේ ප්‍රතිඵලය මොනවා වෙයිද කියලා මම දන්නේ නැහැ. මම පෘතග්ජනයි. නමුත් ඒ අවස්ථාව මේ රටේ මිනිස්සුන්ට උදව් වුණා. එතකොට දැන් මම ආසයි. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා දකින ආකල්පයෙන් එතුමා තෙල් මිල ගැන කථා කළා. එතුමන්ලාට සුළුතර බලයක් තිබෙන පක්ෂයක්. ඒගොල්ලෝ ඒක ශක්තිමත් කර ගන්න, ඒගොල්ලෝ රඳා පවත්වා ගන්න උද්ඝෝෂණ, පිකටින්. අඩු පන්තියේ ජනතාවට කථා කරලා උද්ඝෝෂණය කරලා, හූරේ කියන ඒක එතුමන්ලාගේ ප්‍රතිපත්තිය. අනන්ද හරිශ්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමන්ලාත්, අපිත් යමක් මේ රටේ කරන්න පුළුවන් මිනිස්සු. අපි එක්කහු වෙන්න ඕනෑ. මේ රටේ හොඳ දේට හොඳයි කියන්න. ඔබතුමන්ලා ගරු කරන්න. මම රනිල් වික්‍රමසිංහ මැතිතුමා කරන හැමදේම හොඳයි කියන පුද්ගලයෙක් නොවෙයි. නමුත් මහින්ද රාජපක්ෂ මැතිතුමා ආණ්ඩුව ගෙනියන කොට, ජනාධිපතිවරයා වශයෙන් කරන කොට මෙතුමා මේ වාගේ කරදර කළේ නැහැ. එක එක තැන්වලින් කකුලෙන් ඇද්දේ නැහැ. මෙතුමා ප්‍රකාශ කළ බොහෝ දේ - ආණ්ඩුව කරන්නේ ඒගොල්ලෝ. අපි කෑ ගැහුවාට මේ ආණ්ඩුව පරද්දන්න බැහැ. අපි පිකට් කළාට මේක යවන්න බැහැ. ඒ කාල සීමාව ආවාම මේ ඔක්කොම අරගෙන එළියට බැහැලා යමක් කරමුයි කියන හැඟීම ඒ නායකතුමා ළඟ තිබ්බා. මෙහෙම අපි කුහක වෙන්න හොඳ නැහැ.

[ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලක්ෂ්මන් නිපුන ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ අදහස හොඳයි. එක්තරා කණ්ඩායමකට. මේක රටක් වශයෙන් ගත්තාම හැමෝටම ගැලපෙන්නේ නැහැ.

මම සන්තෝෂ වෙනවා, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා, මගේ කල්‍යාණ මිත්‍රයා මෙන්න මේ වාගේ යෝජනාවක් ගෙනාවා නම්. දැන් එතුමා වට්ටක්කා ගැන කථා කළා. ඇත්තටම මේ රටේ වට්ටක්කා රුපියල් පහළොවට රජයෙන් කිව්වා ගන්නය කියලා, ලංකාවේ තිබෙන ප්‍රධාන පෙළේ ෆුඩ් සිටි වාගේ වෙළඳසැල්වලට. එතකොට ඒගොල්ලෝ අරගෙන මොකක්ද කළේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කැලි කපලා බඩු අරගෙන යන මිනිස්සුන්ට නිකම් දුන්නා. ෆුඩ් සිටිවල නිකම් දෙන කොට අපේ මාර්කට් එකේ වට්ටක්කා කිලෝ එක වික්කේ රුපියල් 60 ට. පිළියන්දල ආර්පිකෝ එකේ අපට නිකම් දෙන කොට පිළියන්දල මාර්කට් එකේ වික්කේ කිලෝ එකක් රුපියල් 60 ට. මේ වාගේ රටක අපි ජීවත් වෙන්නේ. අපි ගනිමු තක්කාලි. හිටපු ගමන් එක කාලයකට මේ රටේ විසි කරන්න තක්කාලි එනවා. හිටපු ගමන් මිරිස් අහක දානවා. හිටපු ගමන් අල ගොවියා අනාථ වෙනවා. මම මේ අදහසක් දෙන්නේ. ඒ වාගේ භෝග අතිරික්තයක් එනවා. එක කාලයක හාල් අතිරික්ත වෙනවා. අපි ඔබතුමන්ලාට යෝජනා කරන්නේ, සාධාරණව අපි එකතු වෙලා යෝජනාවක් ගේමු කෝ. මේ වැඩි වෙන වට්ටක්කා ටික ආරක්ෂා කර ගන්න ක්‍රමයක් සොයමු කෝ. හරිද? ගරු මන්ත්‍රීතුමා, අපි පිකට් එකක් කරමු. මේ රටේ මේ වට්ටක්කා ටික ආරක්ෂා කර ගන්න මෙන්න ක්‍රමය. මේක රත් කරලා, ටින් කරලා මේක pack කරමු. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක කාලයකට රුපියල් පහළොවට, විස්සට විකුණන රඹුටන් ගෙඩිය රුපියල් දෙකට දෙනවා. දෙකට දෙන්නේ, විකුණා ගන්න බැහැ. මල්වානට ගියොත් නිකම් අරගෙන එන්න පුළුවන් ඒ රඹුටන් ගෙඩිය. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ රටේ ක්‍රමයක් හදමු. මම ඔබතුමන්ලාට යෝජනා කරනවා. මේ වාගේ අපේ භෝග අතිරික්ත එනවා. ඒ කාලයට අපි එක්කහු වෙලා, බස්නාහිර පළාත් සභාව - ඔබතුමන්ලාගේ යෝජනාව. අපි පාරට එනවා පිකට් කරන්න, කරමු මේ වැඩේ කියලා. අපි එකඟයි ඔබතුමන්ලාත් එක්ක කියලා. ඒ වාගේම මම ආඩම්බර වෙනවා, මෙතුමන්ලා මේ යෝජනාව - (බාධා කිරීම්) අපි ඔබතුමන්ලා වාගේ කොමිස් බලාගෙන වැඩ කරන්නේ නැහැ රජෝ. වරද්දා ගන්න එපා. කොමිස් එක්ක වැඩ කරන්නේ නැහැ. හෘදය සාක්ෂියත් එක්ක වැඩ කරන්නේ. ඔබතුමන්ලාගේ මිනිස්සු ඔක්කොම කොමිස්කාරයෝ වෙන්න පුළුවන්. අපි කොමිස් එක්ක එන්නේ නැහැ. මම තව එකක් කියනවා. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මගේ මිත්‍රයා. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා යෝජනා කළා නම් මෙන්න මේ වාගේ එකක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මේ රටේ දැවෙන ප්‍රශ්න ගොඩක් තිබෙනවා. සේවක ප්‍රශ්නයක් තිබෙනවා. අද අපි ගනිමු කොළඹ කර්මාන්ත නොවෙයි. වැලි ගොඩ දාන මුදලාලිට, වැලි තොටුපල තිබෙන මිනිහාට වැලි ගොඩ දාන්න කෙනෙක් නැහැ. හරිද? ගඩොල් කපන මුදලාලිලාට ගඩොල් කපන්න මිනිස්සු මේ රටේ නැහැ. ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. කොළඹ කර්මාන්ත කරන අපට, ව්‍යාපාර කරන අපට අපේ ව්‍යාපාර පවත්වාගෙන යන්න සෙනඟ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමන්ලා හරහා යෝජනාව ගෙනාපු ගරු මන්ත්‍රීතුමන්ලාට මම කියනවා. අපි එක්කහු වෙමු. මේ රටේ මිනිස්සුන්ව, රස්තියාදුකාරයින්ව වැඩ කරන්න පුරුදු කරන්න. පලයන් ජොබ් එකට. මේ රටේ නිකම්මු වාගේ ඉන්න මිනිස්සුන්ට ගිහින් වැඩ කරපල්ලා අන්න අතනට කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද සාමාන්‍ය ආයතනයක, පෞද්ගලික ආයතනයක වැඩ කළොත් රුපියල් හතලිස් දාහකට වැඩිය පඩි ගන්න පුළුවන්. අත් උදව් දුන්නොත් අද 28,000 න් උඩ තමයි Basic එක. OT, බටා, කෑම, දීමනා ආවාම 45,000/- ක් විතර වෙනවා.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

ලී මොල් වැහිලා තිබෙන්නේ වැඩ නැතිව.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මම කියන්නේ, පෞද්ගලිකව මගේ කථාව. ඔබතුමා අහගෙන ඉන්න. හරිද? අද ඔබතුමාගේ මොරටුවේ ගන්න. මිනිස්සු නැතිව ලී මෝල් වහලා තිබෙන්නේ. මිනිස්සු නැතිව ඉල්ලුමට සැපයුම දෙන්න බැහැ මොරටුවේ. වැඩ

නැතිව නොවෙයි. වැඩ තිබෙනවා. මිනිස්සු නැහැ. බලන්න කෝ ලොරි ගණන් පටවලා ගෙනියන හැටි. ඔබතුමන්ලා බලන්නේ එක පැත්තකින්. කනගාටුයි. එක පැත්තකින් බලන්නේ.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

සාප්පු වේලෙනවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මොරටුව වේලෙන්නේ නැහැ. මොරටුව හැමදාම ඡන්දය දෙනවා. මොරටුව හැමදාම දිනනවා. ලී වඩුවා දොට්ට බැහැලා මේගොල්ලන්ට නොවෙයි ඡන්දය දෙන්නේ. එක්සත් ජාතික පක්ෂයට කියන එක මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා මතක් කරලා දෙනවා. ඒක තමයි ඇත්ත. මොරටුවේ කෑ ගැහුවාට ලී වඩුවා අපට තමයි ඡන්දය දෙන්නේ කියන එක මම මතක් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමන්ලාට මතක් කරලා දෙනවා. ලක්ෂ්මන් නිපුන ආරච්චි ගරු මන්ත්‍රීතුමා එතුමාගේ නායකායත් එක්ක - ලාල් කාන්ත මැතිතුමා විරුද්ධයි මේ රටට පිටරටින් මිනිස්සු ගෙන්වලා වැඩ කරනවාට. එතකොට හඳුන්නෙත්ති මැතිතුමන්ලා, ලාල්කාන්ත ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනා එක්කහු කර ගෙන, නායක කාරකාදීන් එක්කහු කර ගෙන අපි හදමු ලංකාවේ මිනිස්සු එක්කහු කරලා අපේ ආයතනවලට දෙන්න වැඩ කරන්න. ඒ වාගේ පිළිවෙළක්. ඒ වාගේ යෝජනා ගේන්න කෝ. එතකොට ඔබතුමන්ලාගේ කාඩර් එකත් ආරක්ෂා වෙනවා. ඔබතුමන්ලාට ඡන්දය පාවිච්චි කරන උදවියත් අපිත් එක්ක ඉන්නවා. සියලු දෙනා එක්කහු වෙලා මේ රටේ ස්වයං පෝෂිත රටක් බවට පරිවර්තනය වෙනවා.

ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා යෝජනා කළා නම් මේ වාගේ යෝජනාවක්. මේ රටේ අද සාමාන්‍ය පෙළ ගණන් පාස් කෙනාට තමයි රැකියාවක් දෙන්නේ. ලිපිකරු තනතුරක් අරහේ මෙහේ. දැන් මේ වන කොට රජයේ රැකියාවක් දෙන්න ඇහුවාම ඔක්කොම ගණන් ෆේල්. මම හිතන්නේ, දැන් ඒක වෙනස් කරලා තිබෙනවා. වැඩ අටයි සම්මාන හයක්. ගණන් නැහැ, ඒකේ නිර්ණායකයේ. සම්මාන හයක් එක්ක ආවොත් රැකියාවක් දෙන තත්ත්වයක් තිබෙන්නේ. හැබැයි, අත් දිගට ෂර්ට් එක ඇඳලා එන්නේ. ඒගොල්ලෝ බලාපොරොත්තු වෙන්නේ, බත් මුලයි බෑග් එකයි රැගෙන බස් එකේ ගිහින් ආයතනයට යන රැකියාවක් කරන්නයි. අපි එක්කහු වෙලා වැඩ සටහනක් හදමු. මෙන්න මේ තැන වහන්න. මේකට නොවෙයි. මේ රටේ ඔබතුමන්ලා කථා කරන කොට ගමට බැහැලා අපිත් එක්ක එකතු වෙලා - ඡන්දයක් වෙලාවේදී අපි ඡන්දය කරමු එක්කහු වෙලා, අපි මති මතාන්තර දරන, අපට ආවේණික පක්ෂත් එක්ක, පාටත් එක්ක එක්කහු වෙලා. මේවා මේ රටේ දැවෙන ප්‍රශ්න කියන එක මම මතක් කරලා දෙනවා. එහෙම නම් මේ යෝජනාව හොඳයි ඒ පැත්තේ අයට. මේක අපට වැදගත් නැහැ. එක්සත් ජාතික පක්ෂය වශයෙන් අපි එක්කහු වෙලා යහපාලන ආණ්ඩුව බිහි කරලා, මේ රටේ රාජ්‍ය සේවකයින්ට 10,000 ක් පඩි වැඩි කළා. එක රාජ්‍ය සේවකයෙකුට මතකද? නැහැ. ඇයි මතක නැති වෙන්නේ? ඒගොල්ලෝ 10,000 හම්බ වෙන කොට ගරු සභාපතිතුමනි, ඒ 10,000 වෙන එකකට ආයෝජනය කරන්න වැඩ සටහනක් හදා ගත්තා. එක්කෝ ලීස් කරලා කාර් එකක් ගත්තා. එක්කෝ බයිසිකලයක් ගත්තා. ඒ 10,000 ප්‍රයෝජනවත් ලෙස, ඒක හරියාකාරව භුක්ති විඳගන්න බැරි තත්ත්වයක් එතුමාට අවස්ථාවක් උදා වුණා. අපි ඉතිහාසයේ පළමුවැනි වතාවට ගෑස් මිල පල්ලෙහා බස්සලා තිබෙනවා. තවම ඒක ඒ ආකාරයෙන්ම සුළු මුදලක් එහා මෙහා කර ගෙන තියා ගෙන යනවා. මෙන්න මේකයි අපි කථා කරන්න ඕනෑ. මේ තැනට තමයි කථා කරන්න ඕනෑ. එතකොට තමන්ගේ කාඩර් එක ඔක්කොම ආරක්ෂා වෙනවා. රට කෙළින් වෙනවා. පක්ෂ මති මතාන්තර සියලු දෙනාටම දේශපාලනය කර ගෙන යෑමේ හැකියාවක් ඇති වෙනවාය කියලා කියමින්, මට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.21 ]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා කාලය ලබා දීම ගැන. අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ගැන ඇත්තටම අපි සන්තෝෂ වෙනවා. නමුත් මේ වාගේ යෝජනා එන කොට, මේ වාගේ යෝජනා එක්ක කථා කරන කොට මේ ආණ්ඩු

[ගරු ලලිත් වර්ණකුමාර]

ගේන්න මැදිහත් වුණේ නැති පුද්ගලයෝ හැටියට අපට ඇත්තටම හිනා වෙනවා ඇරෙන්න වෙන දෙයක් නැහැ. යහපාලන ආණ්ඩුව ගේන්න මැදිහත් වෙලා, ඒවා දැන් විඳදරා ගන්න බැරිව තම තමන්ම ඇණ කොටා ගන්නා කාලයක්, වකවානුවක් උදා වෙලා තිබෙනවා. හැබැයි, ඇත්ත. ඒක තමයි ගමේ තිබෙන තත්ත්වයත්. අපි මේ ආණ්ඩුවට විරුද්ධ වුණේ, සන්තෝෂයෙන් නොවෙයි. අනික් අය කන විධියටම කාලා බීලා සතුටින් ඉන්නවා. පාප කර්මයකට එකතු වුණේ නැහැයි කියලා. හැබැයි, මේ ආණ්ඩුව ගේන්න උත්සාහ කරපු අය, ඉස්සරහායින් හිටපු අය අද පසු තැවෙනවා. මේ වාගේ යෝජනා දා ගෙන. අපට වැරදුනා. අපේ දරුවන්ගේ අනාගතය නැති වුණාය කියලා අද ඒ අයම තමයි මේ දුක් විඳින්නේ. ඒවායේ ක්‍රමවේදය තුළ ඇත්තටම අපි සන්තෝෂ වෙනවා, මෙහෙම ගෙනාපු එක ගැන. අපේ හරිස්චන්ද්‍ර කොස්තා මන්ත්‍රීතුමා කියනවා, අපට එකතු වෙලා වැඩ කරන්න කියලා. අපි නොවෙයි. ඔබතුමන්ලාගේ පක්ෂ නායකයෝ ඉන්නවා. ඇමතිවරු ඉන්නවා. ඒගොල්ලෝ එක්ක කථා කරලා වැඩ පිළිවෙළක් විතරයි රටට දෙන්න ඕනෑ. ඒකයි සාමාන්‍යයෙන් වෙන්න ඕනෑ. අපි එකතු වෙන්න නොවෙයි. ඕගොල්ලෝ ඕගොල්ලෝ එකතු වෙලා තමයි ආණ්ඩු ගෙනාවේ. ජනතා විමුක්ති පෙරමුණ, හෙළ උරුමය ඒ සියල්ල එකතු වෙලා ගෙනාවා.

දැන් අපේ හිටපු සෞඛ්‍ය ඇමතිතුමා කථා කළා. ඇත්තටම මම හිතනවා, අපි නම් මේ හදවත එක්ක තමයි වැඩ කරන්නේ. එතුමන්ලාගේ චිප් එකකින්ද කොහේද මේ ශරීරය දුවන්නේ. මොකද, උතුරේ බුදු පිළිම ප්‍රශ්නයක් එන කොට, පන්සල් ප්‍රශ්නයක් එන කොට මේ ආණ්ඩුවට පුළුවන්තරම් ගහනවා. බනිනවා. ඊට පස්සේ මුස්ලිම් ප්‍රශ්නයක් එන කොට තව විධියකට හැසිරෙනවා. දැන් අර මෙතුමා ගෙනාපු එකට ජේ.වී.පී. එකත් එක්ක තිබෙන තරහාටද මම දන්නේ නැහැ පුදුම විධියට කඩේ යනවා. ඉතින් මෙහෙමයි. කඩේ කොහොම ගියත් 2015 දී මිනිස්සුන්ට මේ තිබුණු ආණ්ඩුව එපා වුණා. පැහැදිලිවම. ඒ අයට පොහොර 350 ට දෙන කොට පොහොර ඊට අඩුවෙන් රුපියල් 100 ට, 50 ට එහෙම නැත්නම් රුපියල් 10 ට 15 ට ගන්න හිතාගෙන ඒ අය කටයුතු කළා. 350 වැඩි වුණා. පාසල් නිල ඇඳුම දෙන කොට රුපියලක්වත් වැය නොකර එක නොවෙයි පහක් ගන්න හිතාගෙන වැඩ කළා. සෞඛ්‍ය බෙහෙත් ටික දෙන කොට ඊට වැඩිය අඩුවට බෙහෙත් ගන්න ඕනෑ කියලා ඒ අය හිතුවා. එහෙම හිතලා තමයි - පාර හදන කොට මං තීරු දෙකට අධිවේගය හදන කොට නැහැ, මංතීරු හතරට අපට හදාගන්න ඕනෑය කියලා ඒ අය හිතුවා. ඒ නිසා තිබුණු ආණ්ඩුව වැරදි ගොඩක් කළා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව වැරදි ගොඩක් කළා. යුද්ධය දිනපු එක අපි පැත්තකට තියමු. සෑහෙන වැරදි කළා. පගා ගැහුවා. කොමිස් ගත්තා. රත්තරන් අස්සයෝ පැද්දා. තෝසේ එකකට ලක්ෂ එකයි ගණනක් ගියා. එක තෝසයක් කන්න. එහෙම තිබුණු ආණ්ඩුවක්. ඒ ආණ්ඩුව මිනිස්සුන්ට එපා වුණා. එපා කෙරෙව්වා. ඒ එපා කෙරෙව්වේ පැට්‍රල් ටික ඩොලර් 160 ට බැරල් එක ගන්න කොට. ඩීසල් 111 ට දුන්නා. හැබැයි, ඊටත් අඩුවෙන් ගන්න තමයි ඒ ආණ්ඩුව වෙනස් කෙරෙව්වේ. ඒ වෙනස් කරලා ඊට වඩා ඒ කරපු වැරදිවලට ජනතාව දඬුවමක් දුන්නා. ජනතාව ගෙදර ඇරියා. උඹලා අපට එපා. උඹලා මොන සංවර්ධනය කළත්, මොනවා කළත් උඹලා එපා. හැබැයි, අපට ඕනෑ උඹලාට වඩා ශ්‍රේෂ්ට, උඹලාට වඩා විනිවිදභාවය තිබෙන, උඹලාට වඩා හොඳ ආණ්ඩුවක් අපට ඕනෑ කියලා තමයි මේ ආණ්ඩුව ගෙනාවේ. උඹලාට වඩා හොඳ ආණ්ඩුවක් කියලා. ඇත්තටම අපි අද හිතනවා, එහෙම වෙලා තිබෙනවාද කියලා. එහෙම වෙලා නම් අද ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මේ වාගේ යෝජනාවක් දාන්න ඕනෑ වෙන්නේ නැහැ. එහෙම වෙලා තිබුණා නම්. ඊට වඩා ආණ්ඩුව හොඳ වුණා නම්, ඊට වඩා විනිවිදභාවය තිබුණා නම් එහෙම වෙන්න ඕනෑ නැහැ.

අපි සමස්තයක් හැටියට ගත්තොත් එදා හාල් කීයටද තිබුණේ. රුපියල් හැටකට එහා ගියේ නැහැ. ටික කාලයක් ගියා රුපියල් 100 ට. ඊට පස්සේ ගෙනාපු වැඩ පිළිවෙළත් එක්ක අවුරුදු හතරක්, පහක්, හයක් රුපියල් 60 ට එහා හාලක් ගියේ නැහැ. ඇත්තටම කන්න පුළුවන් හාලක්. අද එහෙම නොවෙයි. පොල් ගෙඩිය අද කීයටද ගිහිල්ලා තිබෙන්නේ. පොල් ගෙඩිය කීයටද තිබුණේ. අද ඒ තත්ත්වය වාගේම විශේෂයෙන්ම පෙට්‍රල් ලීටරය රුපියල් 111 ට තිබුණේ, දැන් ආණ්ඩුව වෙනස් වෙන කොට. 2015 දී 111 ට තිබුණේ. අද 109 ක් වෙලා තිබෙනවා. ඩීසල්. 109 ක් වෙලා තිබෙනවා. හැබැයි, රුපියල් දෙකයි වෙනස. හැබැයි, ඒ වෙලාවේ 2015 දී තෙල් බැරල් එකක මිල තිබුණේ 103 යි. අද 78 යි. වෙනස

ඩොලර් 25 යි. හැබැයි, තෙල් බැලරයක්. ලීටරයක් නොවෙයි. හැබැයි, ඒ ආණ්ඩුවට වැඩිය රුපියල් දෙකයි ඩීසල් අතර වෙනස. 111 යි 109 යි. දෙක නොවෙයිද? (බාධා කිරීම්) මේ රුපියල්වලින් ඩීසල් ගැන කියන්නේ. තෙල් බැරල් එක ගැන කියන්නේ ඩොලර්වලින්. ඩොලර් 25 ක් අඩු වෙලා. රුපියල් දෙකයි ජනතාවට දීලා තිබෙන්නේ. එහෙම කියලා කියනවා, තවම මහින්දගේ කාලයේ තරම් නම් ගියේ නැහැයි කියලා. දෙයියනේ එහෙම යන හින්දා නේන්නම් වෙනස් කර ගත්තේ. මේකෙන් දෙකෙන් පංගුවට ගන්න නේන්නම් වෙනස් කළේ. කෝ ඉතින් ඒක ලැබිලාද?

මම කියනවා, රාජ්‍ය සේවකයෝ විශාල පිරිසක් ඉන්නවා. රු. 10,000/- කින් පඩි වැඩි වුණා තමයි. ඇත්ත. ඒ අය හිතනවා ඇති 10,000 ක් වැඩි නොකර තව 5000 ක් අඩු කළා නම් මීට වඩා හොඳයි කියලා. එදාට සාපේක්ෂව අද මොනවාද වැඩි වෙලා නැත්තේ. අද ලයිට් බිල කීයද? ජල බිල කීයද? දැන් ළමයෙකුට ඇඳුමක් ගන්න පුළුවන්ද එදා ගත්ත ගණනට. සෙරෙප්පු දෙකක් ගන්න පුළුවන්ද? තමන්ගේ අවශ්‍යතාවයට එක ෆෝන් එකක් පාවිච්චි කරන්න පුළුවන්ද? අද ටෙලිෆෝන් බිල කීයක්ද? එහෙව් කාලයක් තුළ 10,000 ක් වැඩි කරලා 30,000 ක් ගන්න වැඩ පිළිවෙළක් තිබෙන්නේ. අද මේ ලංකාවේ ජීවත් වන එක පුරවැසියෙක් තමන්ගේ වට පිටාවේ එදිනෙදා ජීවිතය ගත්තොත් විසි පොලකින් විතර තමන්ට බදු වදිනවා. බදු වලින් පමණක් ගෙනියන වැඩ පිළිවෙළක්. මේ රටේ ඉපදුනු එක කරුමයක් කියලා අද මිනිස්සු හිතනවා. එක පුද්ගලයෙකුට එදිනෙදා ජීවත් වෙන්න අවශ්‍ය ද්‍රව්‍ය ටික සොයා ගන්න කොට විසි පොලකට වඩා බදු වැඩි වෙලා තිබෙන්නේ. එකම මිනිහාගෙන් තමයි මේ සියල්ල කරකවන්න උත්සාහ කරන්නේ. ඒ නිසා අපි ඇත්තටම මේකේ කථා කරලා වැඩක් නැහැ. මම ඔබතුමන්ලාට කිව්වේ, ඔබතුමන්ලා වැඩ සටහන් ගෙනැල්ලා කරන්න. ඔබතුමන්ලා හදා ගත්ත ආණ්ඩුව තුළ, මට එක යෝජනාවක් කියන්න, මේ අවුරුදු තුනට පටන් අරගෙන ඉවර කරපු එකක් මේ රජය. දැවැන්ත ජාතික මට්ටමේ වැඩ පිළිවෙළක් මට කියන්න. එක ව්‍යාපෘතියක් මට කියන්න. පටන් ගත්ත ඒවා. අපි හදපු ඒවා විවෘත කරපු එක හරි. මම අහන්නේ, පටන් අරගෙන විවෘත කරපු එක යෝජනාවක් කියන්න. හැබැයි, එදා හොරකම් කරලා, පගා ගහලා, කොමිස් ගහලා වරායවල් හැදුවා. Highway හැදුවා. ඒකත් ඒක නොවෙයි හැදුවේ. ඒකත් ඉස්සර තිබුණු යෝජනා තමයි. නමුත් කමක් නැහැ. එදා එහෙම කරලා, කොමිස් ගහලත් ඔය ටික කළා. අධිවේගී මාර්ග අද ඕගොල්ලෝ වළවල් කිව්වාට මට කියන්න තව අඩි දහයක් දික් කරපු එකක්. අන්න දැන් වට රවුම් පාරේ ඉතුරු එක. මංතීරු කීයද තිබුණේ. හතර තිබුණු එක තමයි ආපහු දෙක කළේ. ඒකටත් හේතු තිබෙනවා. එදා සල්ලි වෙන් කරපු ව්‍යාපෘති.

විශේෂයෙන්ම අද අපි ඕගොල්ලොන්ගේ ගමේ තිබෙන අයි රෝඩ් ව්‍යාපෘතිය බලන්න. මොකක්ද වෙලා තිබෙන්නේ? 2015 දී ටෙන්ඩර් කරලා, පටන් ගන්න තිබුණේ. ඒවාත් ණය තමයි. අද කියන, ආසියානු සංවර්ධන ණය ආධාර. ඒ අයි රෝඩ් අද මොකද වෙලා තිබෙන්නේ. 2015 දී ටෙන්ඩර් කරලා ඒ ටෙන්ඩර් ටික දෙන්න හදන කොට ආණ්ඩුව වෙනස් වුණා. වැඩ පටන් ගන්න හදන කොට වෙනස් වුණා. ඊට පස්සේ මේගොල්ලෝ සද්ද නැතිව හිටියා. මේගොල්ලෝ යැව්වා ලැයිස්තුවක්. මේ පාරවල් නොවෙයි. මේ පාරවල් ඕනැ කියලා. එහෙන් කිව්වා, එහෙම බැහැ. මේවාට ශක්‍යතා වාර්තා හදලා තිබෙන්නේ. එහෙම නම් අපි cancel කරන්නම් කිව්වා. ඒ පාර කිව්වා cancel කරන්න එපා කියලා. ආණ්ඩුව වෙනස් වුණු මුල හින්දා මේගොල්ලෝ අමතක වෙනකල් කියලා අවුරුදු දෙක තුනක් ඇද්දා. දැන් ඒවා මීට මාස කිහිපයකට උඩදී පටන් ගත්තා. පටන් ගත්තාම මොකද වෙන්නේ? එදා තිබුණු ඇස්තමේන්තු අවුරුද්දෙන් අවුරුද්ද වෙනස් වෙන කොට අද අති විශාල මුදලක් වැඩි වෙලා තිබෙනවා. වැඩි වෙන එක ආසියානු සංවර්ධන බැංකුවෙන් ඉල්ලුවා. අපි දෙන්නේ නැහැ. අපි project එකක් දීලා තිබෙන්නේ. අපි දෙන්නේ නැහැයි කිව්වා. භාණ්ඩාගාරයෙන් දාන්න කිව්වා. භාණ්ඩාගාරය කිව්වා අපට සල්ලි නැහැ දාන්න කියලා. අද මොකක්ද කරන්නේ. බෝක්කුව තිබුණු තැන බෝක්කුව නැතිව, පාරේ පළල අඩු කරලා, දිග වෙනස් කරලා පැති බැම්ම තිබෙන තැනට ඒක නැතිව අද ඒක පටන් අර ගත්තා. හැබැයි, ගත්තා විතරක් නොවෙයි. මගේ බුලත්සිංහල කොට්ඨාශයේ පාරවල් 11 ක් තිබෙනවා. පාරවල් 03 යි වැඩ කරලා තිබෙන්නේ. එකකවත් කිලෝමීටර් දෙකක් තරමට වැඩ කරලා නැහැ. මේ සැප්තැම්බර් වෙන කොට ගිවිසුම් ඉවර වෙනවා. මේ මොන අපරාධයක්ද? කාගේ මුදල් ද මේ? තව අවුරුදු දෙකක් ගියොත් පාර කිලෝ මීටර් භාගයක් හදලා project එකේම සල්ලි ඉවරයි කියයි. අන්න ඒකයි අපි කියන්නේ.

[ගරු ලලිත් වර්ණකුමාර ]

ඒ වාගේ තමයි වලවල් තිබ්බා හරි අධිවේගී මාර්ග හැදුවා නම්, මෙතුමා කිව්වා වාගේ අපි අද ජීවිතයේ ඉස්සරහාට ගිහිල්ලා තිබෙනවා. අද අපි හොරණ ඉඳලා කොළඹට තුන් පාරක් ඇවිල්ලා යන්න පුළුවන් කාලයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා දන්නවා. අපේ ව්‍යුහ කමිටුව තිබෙනවා. සමහර දවස්වලට එතුමාත් මමත් මෙහේ තිබෙන රැස්වීමකට ඇවිල්ලා ව්‍යුහ කමිටුවට ගිහිල්ලා හවස නැවතත් වෙනත් අපේ උපදේශක කාරක සභා තිබෙනවා නම්, අපි ඒකටත් ඇවිල්ලා යනවා. ඒ අපේ දවස් තුනක වැඩ පිළිවෙළ අපි එක දවසට කරන්නේ. අපේ ජීවිත තව වැඩි වුණා. වයස වැඩි තරමට ඔය කාර්යක්ෂමතාවය තිබුණා නම්. එහෙම තිබුණු වැඩ පිළිවෙළවල් තමයි වෙනස් වෙලා දැන් එකිනෙකාට බැණගෙන, දොස් කියාගෙන යනවා මිසක් රටේ ජනතාව රවට්ටන්න බැහැ. ඒකයි තියෙන්නේ. ඒකට එක වෙඩිල්ලක් දුන්නා පළාත් පාලන මැතිවරණයේදී. ඊළඟ වෙඩිල්ල එන්නේ අපේ පළාත් සභා මැතිවරණයේදී. ඔය කියපු සුරංගනා කථා කියන එකක් නැහැ. මම හිතන්නේ නැහැ ඒවා තියයි කියලා. සැරින් සැරේ තිබ්බාම මේ අපරාධ වියදමක් යන්නේ. ලංකාවම එකට තියන්න ඕනෑය කියලා තමයි අර තුනත් විසුරුවාගෙන බලා ගෙන ඉන්නේ. ඊට පස්සේ කිව්වා, සැප්තැම්බර් වෙන කොට හෙට අනිද්දා උතුරත් විසිරෙනවා. බලන්න කෝ උතුර විසිරෙන කොට මොකද වෙන්නේ කියලා. ඊයේ කිව්වා වාගේම, දැන් අපේ හිටපු ඇමතිතුමා කිව්වාට, එතුමාගේ නායකයා ඊයේ කියනවා, මේ වැඩේ හරියන්නේ නැහැ. යාපනයේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ කියනවා, ඒගොල්ලන්ට ඕනෑ විධියට මහජන නියෝජිතයෝ ඉන්න ඕනෑ. එහෙම කරන්න පුළුවන්කමක් නැහැ. ඒ කොටි බලවේග තමයි ඒ ඉස්මතු වෙන්නේ කියලා. එහෙම තමයි එතුමන්ලා කියන්නේ. මෙතුමා මෙහෙම කියන කොට. නමුත් ඒ අය කියන්නේ මොකක්ද? යාපනය අද කොයි විධියටද හැසිරෙන්නේ කියන එක දන්නවා. අපි අපිම ලැජ්ජා වෙන්න ඕනෑ. හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අපි එකඟයි ඔය සියලු දේ හරි ප්‍රතිපත්තියක් එක්ක හරි වැඩ පිළිවෙළකට යන්න එකඟ වෙනවා නම්. ඒ නිසා ඔය මොනවා කළත් කවුරු පුරසාරම් දැම්මත්, කවුරු සුරංගනා කථා කිව්වත්, තොරන් ගැහුවත් මැතිවරණයක් තියලා එන්න. ජනතාව ඉන්නේ කොතැනද කියලා බලන්න. ඒක තමයි අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ. කවුරු කොහොම තම තමන්ගේ ඔලුවේ තිබෙන, හිතේ තිබෙන අදහස් මොන විධියට ප්‍රකාශ කළත්, මොන විධියට එක එක්කෙනාගෙන් ලකුණු ගන්න හැදුවත් අන්තිම උත්තරේ තිබෙන්නේ ඒ ජනතාවගේ කැමැත්ත තුළ. හැබැයි, එකම එක වරදක් එතැන තිබෙනවා. ඡන්ද ඉල්ලන කොට කතිරය ගහලයි මහජන නියෝජිතයෝ පත් කර ගන්නේ. මම විශ්වාස කරනවා, කතිරය ගහනවාට වැඩිය හරියක් දාලා මිනිස්සු ගන්න පුළුවන් වැඩ පිළිවෙළකුත් මේ ආණ්ඩුවෙන් හදනවා නම්. හොඳ මිනිස්සු ටිකක් ඇවිල්ලා මේ රට ඉදිරියට ගෙනියන්න පුළුවන් වෙයි. නැත්නම් කවදාවත් බැහැ. අපේ ආණ්ඩුව විනාශයට ගෙන ගියාට, අපේ කාලයේ විනාශය වුණාට අද රටේ නායකයාගේ ප්‍රධාන මාණ්ඩලික ප්‍රධානියා අල්ලස් - ගණන කෝටි දහය වෙන කොට කෝටි දෙකක් අල්ලස් හැටියට ගන්න කොට අතේ මාට්ටු වෙනවා. මේවා තමයි විනිවිදභාවය. ඒ වාගේම මේ ආණ්ඩු වෙනස් වෙන්න, ආණ්ඩු වෙනස් කරන්න හදපු හිටපු නායකතුමා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇල්ලුවේ නැහැ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඇල්ලුවේ නැහැ. නිකම් හිටියා. දන්නවා නම් අල්ලන්න එපාය කියනවා. එයා කළේ නැහැ. මුලින් දන්නවා නම් අල්ලන්න එපැයි කියයි. ඒ කෙසේ වෙතත් එහෙම වැඩ පිළිවෙළක් තිබෙන්නේ. විනිවිදභාවය ජේනවා නේ අපිටම. ඒ නිසා අවසාන වශයෙන් කියන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊයේ මම රූපවාහිනියේ කථාවක් අහගෙන හිටියා. රටේ ප්‍රධාන නායකතුමා කියනවා, වහින එක ගැන මට හරි සන්තෝෂයි. අද වන කොට මේ වැස්සත් එක්ක අට දෙනෙක් මැරිලා තිබෙනවා. නායකයා කියනවා, මට හරිම සන්තෝෂයි වහින එකට. මොකද, මේ රටේ නියඟය තිබුණා. නියඟයට විසඳුමක් වැස්ස. ඇයි දෙයියනේ අර බුලත්සිංහල දිහාවේ ගියවර වැස්සත් එක්ක 78 දෙනෙකු මිය ගියා. ගොඩ ගන්න බැරිව තවම පොළොව යට හතළිස් ගණනක් ඉන්නවා. ඒ විතරක් නොවෙයි. ඉතිරි වුණු ළමයාට, අම්මාට ගෙයක් දෙන්න බැහැ තවම. ඉඩම් කැබැල්ලක් දෙන්න පුළුවන්කමක් නැහැ. එහෙම දුක් විඳින්නේ. එහෙම එකේ නායකයෙක් කියනවා - අරනායක කන්දේ ගිය අය තවම හුල්ල හුල්ලා ඉස්කෝල විවෘත

කරන්න පවා බැරිව බොහොම අමාරුවෙන් උද්ඝෝෂණ කරලා ළමයින් ඉස්කෝලේ ගියා. ඒ කට්ටියව වෙන තැනකට දාලා. එහෙමයි වැඩ පිළිවෙළ ගෙනියන්නේ. සාලාවේ වන්දිත් එහෙමයි. ඉතින් ඒවා එකින් එක කියලා වැඩක් නැහැ. මීට වැඩිය නායකයෝයි, දේශපාලඥයෝයි හැමෝම රට ගැන අවංකව හිතන්න ඕනෑ. අද වෙලා තිබෙන්නේ, මේ ආණ්ඩුව මහ කාලයක් නැහැ. අපි කොහොමත් තව මාස 18 යි කියමුකෝ. ඉවර බව දන්නවා. තම තමන්ට පුළුවන් කොටස තුළ තම තමන් තමන්ගේ මඩිය තර කර ගන්න එක විතරමයි සිද්ධ වෙලා තිබෙන්නේ. නායකයෝ නායකයෝ මහා පරිමාණයෙන් මිලියන ගණන්වලින් ගන්න කොට, ඇමති ඇමතිගේ ගණන ගන්න කොට ඒකේ රියදුරා සාමාන්‍යයෙන් දහස් ගණනින් හරි අරගෙන තමන්ගේ පැවැත්ම හදා ගෙන තව අවුරුදු විස්සක් තිහක් නැහැ. සල්ලි ටිකක් හම්බ කරන න්‍යාය විතරමයි අද මේ ලංකාව තුළ පවතින්නේ කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම අද න්‍යාය පත්‍රයේ තිබුණේ අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව. ඒකට කථා කරන්න ලැහැස්ති වෙලා හිටියේ. කැලණි ගඟ මිටියාවත පිළිබඳව තිබුණු හොඳ යෝජනාවක් නිසා. ඒ යෝජනාව යටපත් කරලා, එතුමාගේම පක්ෂයේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කාලීන වැදගත්කමකින් යුත් යෝජනාවක් කියලා -

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

දැන් වරප්‍රසාද ප්‍රශ්න අහන්න බැහැ නේද?

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

37(1) න් මම කථා කරන්නේ. හැම තැනම දැන් ගං වතුර දාලා. දැන් මේ සභාවේ ගණ පූරණය නැහැ. ගං වතුර දාලා තිබෙන නිසා සියලු දෙනාම ගිහිල්ලා තිබෙනවා. දැන් කැලණි ගඟත් කොහිලවත්තෙන් පිටාර ගලලා. අපට ඒ ගම්වලට යන්න ඕනෑ. ඒ නිසා මේක -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා වාඩි වෙන්න. කරුණාකර සීනුව නාද කරන්න.

## රීති අංක 16 (1) යටතේ සභාව කල් තැබීම
ADJOURNMENT OF THE COUNCIL SITTING UNDER RULE NO. 16(1)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නියමිත කාලය තුළ සභාවේ ගණ පූරණය සම්පූර්ණ නොවන බැවින්, මම දැන් මෙම සභාව කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.46 ට, 2018 ජූනි මස 05 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 12.46 p.m till 9.30 a.m. on 05.06.2018*